ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



මළවුන්ගේ මාසය මුල් කොටගෙන ආධ්‍යාත්මිකව කෙරෙන විවරණයකි.

**කිතුනු මරණය පිළිබඳ බයිබලීය හා සසුන් පිය ඉගැන්වීම්**

3 පිටුව



**දොන් බොස්කෝ ස්ප්‍රීතුව මාංශගතවන්නට...**

ශ්‍රී ලංකාවට වැඩම කරවන දොන් බොස්කෝ ශ්‍රී දේහය පිළිබඳව කැරෙන විස්තරයකි.

9 පිටුව



1815 - 2015
දොන් බොස්කෝ තරුණයන්ගේ පියා, ගුරුවරයා සහ මිතුරා
නොවැ. 19 සිට 30 දක්වා
ශ්‍රී ලංකාවේ ගෞරවාචාරයට



වසරේ හොඳම ආගමික පුවත්පත


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

ක්‍රි.ව. 2011 ක් වූ නොවැම්බර් මස 13 ඉරිදා 146 වෙළුම 24 කලබ සතිපතා පත්‍රය - පිටු 20 - මිල රු. 20 QD/18/NEWS/2011 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.


# දේව වචනය තුළින් විශ්වාසයේ පුබුදුවක් කරා තේමාකරගත් වසර නොවැ. 26 දා ආරම්භ කැරේ

**2011 - 2012 වසර සඳහා කොළඹ අගරදගුරු වසම තේමාකරගෙන ඇති විශේෂ තේමාව වූ "දේව වචනය තුළින් විශ්වාසයේ පුබුදුවක් කරා" නිල වශයෙන් ආරම්භ කිරීම නොවැම්බර් 26 වැනි සෙනසුරාදා ප.ව. 6.00 කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ පැවැත්වෙන විශේෂ මෙහෙයක දී සිදු කැරේ.**

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ආගමන සමයේ පළමු ඉරුදින පූර්ව රාත්‍රි සන්ධ්‍යා මෙහෙයක් ලෙස මෙය පැවැත්වේ. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කොට ශුද්ධවූ බයිබලය පෙරහරින් අල්තාරය වෙත රැගෙන ඒමෙන් පසු දේව වචනයේ වසර ප්‍රකාශයට පත් කැරෙන අතර ඉන්පසු දිව්‍ය සත්ප්‍රසාද වන්දනා මෙහෙය පැවැත්වේ.

උතුරු කොළඹ, මැද කොළඹ හා දකුණු කොළඹ දිසාවන්හි පියතුමන් හා සැදැහැවතුන් මෙහෙයට සහභාගි වීමට නියමිතය. 15 පිටුවට

## සත් වසරකට පසු තේවාචාරී ධුර ප්‍රදානය යළි අම්පිටියේ දී...



අම්පිටිය ශ්‍රී ලංකා අප ස්වාමිඳුවගේ ජාතික දෙව්සත්හලේ පූජක පුහුණුව අවසන් කළ ගරු සහෝදර තුමන්ලා 22 ක් පසුගිය ඔක්තෝබර් මස 29 වන දින මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් අතින් තේවාචාරී වරම ලබාගත් අයුරු.. ( ✍ **ගරු ඇන්ටන් දිනේෂ් සොයුරු)**

## ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ පියතුමා සදා සාමය දිනයි



ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු නික්ලස් සී. ලෝව් පියතුමා ඉකුත් සඳුදා කොළඹ නවලෝක රෝහලේ දී සදා සාමය දිනීය.

1955 මාර්තු 09 දා මාරවිල දී උපත ලබා 1982 මාර්තු 07 දා හලාවත පදවි පූජක පුතකු ලෙස අබිසෙස් ලත් එතුමා වෙන්නප්පුව හා පුත්තලම සහයක ලෙස කටයුතු කර වයික්කාල මීසම් සේවක විය. බයිබල් අධ්‍යාපනය වැඩිදුර හැදෑරීමට රෝමයේ උර්බානියා සරසවියට ප්‍රවේශ වූ එතුමා අධ්‍යාපන කටයු නිමවා පැමිණි පසු 1992 සිට 1998 දක්වා හලාවත පදවියේ ධර්මෝපදේශ අධ්‍යක්ෂ විය. 15 පිටුවට

## ඕනෑම දෙයක් කතෝලික සභා ගිණුමට බැර කිරීම අද කලාවක් වෙලා

### කතෝලික සාහිත්‍ය උළෙලේ දී කුරුණෑගල රදගුරු හිමි පවසයි

**මැක්ෂිමස් රෝයි පෙරේරා සහ සී. ආර්. ඩික්සන් ඇන්ටනි විසිනි**

අතීතයේ දී කතෝලික ලේඛකයා, සසුන් උන්නතිය හා දේව රාජ්‍යය ගොඩනැගීමට සිය පෑන යොදා ගත්තා. අද රටේ අර්බුදයක් වුවත්, ජාත්‍යන්තර අර්බුදයක් වුවත්, දේශපාලන පක්ෂයක බෙදීමක් හෝ හැල හැප්පීමක් වුවත් ඒ සියල්ල කතෝලික සභාවේ ගිණුමට බැර කිරීම කලාවක් වෙලා. එබැවින් හුදු වාර්තාකරණයෙන් සෑහීමකට පත් නොවී සභාවේ උන්නතිය හා සභාව වෙනුවෙන් පෑන හැසිරවීම කතෝලික ලේඛකයාගේ වගකීම හා යුතුකම යැයි කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ පැවසූහ.

පිටකොටුව මල්වත්ත පාරේ 6 වන පාවුළු මධ්‍යස්ථානයේ දෙවන මහලේ පැවැති ජාතික කතෝලික ලේඛක හවුලේ 26 වන සංවත්සර සාහිත්‍ය සම්මාන උලෙළේ දී රදගුරු හිමි මේ බැව් පැවසීය. 15 පිටුවට

## කඳාන සා. සෙබස්තියන් විදුහල බිලිගන්න සූදානමක්!

**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**

1960 දී කතෝලික පාසල් පවරා ගැනීමෙන් පසු එලෙස පවරාගත් පාසැල් බොහොමයක් විනාශ වී ඇති අතර, තරමක් හෝ දැනට හොඳ තත්ත්වයක පවතින්නේ පවරාගත් පසුව වුවද කතෝලික සභාවේ මැදිහත්කම මත පවත්වාගෙන ගිය පාසැල්ය. වරින්වර විවිධ රජයන් විසින් දියත් කරන ලද පාසැල් ඒකාබද්ධ කිරීම්, විචාරවත් කිරීම්, ද්වීතිය හා ප්‍රාථමික ලෙස වෙන්කිරීම් ආදී වෙනස්කම් නිසා කතෝලික පාසැල් එකිනෙක විනාශ වීම සිදුවිය.

නූතනයේ හඳුන්වා දී ඇති පාසැල් 1000 ව්‍යාපෘතිය හොඳින් අධ්‍යනය කළ අගරදගුරු පදවිය එම ව්‍යාපෘතියට ඇතුළත් කළ යුතු පාසැල් මොනවාද නොකළ යුතු පාසැල් මොනවාද යන්න තීරණය කර ඒ පිළිබඳව රජය, බස්නාහිර පළාත් සභාව සහ නිලධාරීන් හොඳින් දැනුවත් කළේය. 15 පිටුවට

## "සිරසේ" ආගම් වාදයට සංඝරත්නයේ අප්‍රසාදය

**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**

වැඩ බලන විපක්ෂ නායක ධුරය ජෝන් අමරතුංග මහතාට ලබා දීම පිළිබඳව ආගම් වාදය තුළින් කතෝලික දහමට සූක්ෂමව පහර දීමට සිරස මාධ්‍ය ජාලය ගන්නා උත්සාහය පිළිකුලෙන් හෙලා දකින බව මහා සංඝරත්නය ප්‍රදීපයට ප්‍රකාශයක් කරමින් පවසා සිටිති.

ජ්‍යෙෂ්ඨ පක්ෂ සාමාජිකත්වයක් දරන ජෝන් අමරතුංග මහතා ඒ ධුරය ලැබුවේ පක්ෂයට කළ මෙහෙවර නිසා මිස කතෝලිකයකු නිසා නොවන බව පවසන සංඝරත්නය ඇතුළු ජනතාව එම පහත් ප්‍රයත්නය හරහා මූලධර්මවාදී කුමන්ත්‍රණයක් ඇති බවට සැක පහල කරයි. එරාන් වික්‍රමරත්න වැනි මුලධර්මවාදී ක්‍රියාධරයන් සිරස මාධ්‍ය ජාලය හරහා ඉස්මතු කරවීමත් මෙහි සැකය තවත් තහවුරු කරන බව නිදහස් මතධාරින්ගේ මතයයි.

## ශ්‍රී ලංකාවේ දිනකට ගබ්සා 1000 ක්!; දෛනික උපත් සංඛ්‍යාවත් 1000 යි



### දොස්තර ලූෂන් ජයසූරිය මහතා අනාවරණය කරයි

**මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි**

ශ්‍රී ලංකාවේ දිනකට ගබ්සාවන් 650 සිට 1000 දක්වා සිදුවන අතර දිනකට සිදුවන උපත් ප්‍රමාණය දහසක් පමණ වේ. එසේ නම් මේ පුන්‍යභූමියේ දිනකට උපදින්නට සිටින දරුවන්ගෙන් තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවක් මරා දමන්නේ යැයි සා. ලූක් කතෝලික වෛද්‍ය එකමුතුවේ හිටපු සභාපති දොස්තර ලූෂන් ජයසූරිය මහතා අනාවරණය කරයි.

ඒ මහතා මේ බැව් අනාවරණය කළේ සා. ලූක් කතෝලික වෛද්‍ය එකමුතුව මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන වෛද්‍ය ඇම්. පී. එම්. කුරේ සමරු දේශනය පවත්වමිනි. ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරී සංගම් ශ්‍රවණාගාරයේ දී පැවැති මේ දෙසුමේ ප්‍රධාන ආරාධිත 15 පිටුවට

## සෙත් සරණ දිළිඳු සහන නත්තල් වැඩසටහනට එක්වන්නට ආරාධනා!

**ෂම්මිකා සුදර්ශනී විසිනි**

අගරදගුරු පදවියේ සමාජ සේවා ආයතනය වන සෙත් සරණ ආයතනය, පෙර වසර වලදී මෙන්ම මේ වසරේදී ද යහපත් ජීවිතයකට හීන මවන දහසකුත් දෙනාට පුංචි අත්වැලක් සපයන්නට කටයුතු සංවිධානය කර ඇති අතර ඒ වෙනුවෙන් ඔබේ කාරුණික පරිත්‍යාගයන් අපේක්ෂා කරයි. 15 පිටුවට

## සුබාසිංසන



කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ නාම සාන්තුවර මංගල්‍යය නොවැම්බර් 15 වැනිදාටත්, කාදිනල් වරයට එසැවීමේ වර්ෂ පූර්ණ සංවත්සරය නොවැම්බර් 20 වැනි දාටත් යෙදේ. ඥානාර්ථ ප්‍රදීපය සිය පාඨක ලේඛක සුහදයන් පිරිවරා උන්වහන්සේට සුබාසිංසන ගෙන එයි.

## දේවස්ථාන ජයන්ති මංගල්ල ගැනයි!

2012 වසරට යෙදෙන කතෝලික දෙව්මැඳුරු ජයන්ති මංගල්‍ය දිනයන් සම්බන්ධයෙන් පදවි රදගුරු හිමිපාණන් සහ පැවිදි නිකා ශ්‍රේෂ්ඨාධිපති තුමන් හා තුමියන් දැනුවත්ව, බුද්ධ ශාසන හා ආගමික අමාත්‍යංශයේ අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම් බර්ට්‍රම් ප්‍රනාන්දු මහතාට, යොමු කරන්නේ නම් ඒ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු මණ්ඩලයේ මාර්ගෝපදේශකත්වය මත රජය සමඟ කටයුතු කිරීමට අරමුණු කරගෙන තිබේ. සියලු ලිපි බර්ට්‍රම් ප්‍රනාන්දු මහතා, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය, 35, ධර්මපාල මාවත, කොළඹ 07. ලිපිනයට යොමු කරන්න.

## කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයෙන් සමුළුවක්

බලංගොඩ, තන්ජන්තැන්න සා. මරියා දෙව්මැඳුරට නුදුරින් පිහිටි මැදබැද්ද විද්‍යාලයේ දී කතෝලික සරසවි උපාධ්‍ය ගරු සමන් මැක්ෂිමස් පියතුමාගේ උපදෙස් මත ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය කතෝලික ශිෂ්‍ය සංගමය මඟින් තෙදින සම්මන්ත්‍රණයක් පැවැත්විණ. බොදුනු බහුතරයක් වෙසෙන පෙදෙසක කතෝලික දරුවන් විසින් කරන ලද මහඟු කාර්ය ප්‍රදේශවාසීන්ගේ පැසසුමට ලක් විය. මෙම කාර්ය සඳහා තන්ජන්තැන්න දෙව්මැඳුරේ නේවාසිකව සේවය කරන ජපමාල නිකායික ගරු ප්‍රියන්ත කමල් ප්‍රනාන්දු, ඇලන් නිර්මලදාස්, සවරිමුත්තු යන පියවරුන්ගේ සහයෝගය කැපී පෙනුණි. (✍ **තියබෝල්ඩ් සමරතුංග)**

## ලොකු සැර්



සිරස මාධ්‍ය ජාලය ආගම් වාදය අවුලයි
- පුවතක්

**බළල් අත කාගේ ද?**

**"ඔබ ස්වල්පයක් ගැන විශ්වාසීවූ හෙයින් ස්වාමියාගේ ප්‍රීතියට සහභාගි වන්න."** (ශු. මතෙව් 25:23)

## පදවියෙන් පදවියට

# දරුවන් යහමගට ගැනීම දේව සේවයක්

### ඇතුගල්පුර කතෝලික ගුරු දිනයේදී රදගුරු හිමි පවසයි

**ගුරුවරයා ලෙස ඔබට මහත්වූ වරප්‍රසාදයක් හිමිවී ඇති අතර එම වගකීම තරම් උතුම් සේවයක් තවත් නැහැ. මෙලොව රැකියා දෙකක් විශේෂයෙන් ජනතා ඇගයීමට ලක්වෙනවා. එකක් ගුරුවෘත්තිය, අනෙක වෛද්‍ය වෘත්තිය. ගුරුවරයාට සමාජයේ පවතින්නේ අති විශේෂ සැළකිල්ලක්. දරුවන් යහමගට ගැනීම සඳහා කරන සේවය දේව සේවයක් ලෙස සැළකෙන බව කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ බුලුපිටිය අධ්‍යාපන හා ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ පැවැති කතෝලික පදවි ගුරු දිනයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වෙමින් පැවසුහ.**

තව දුරටත් අදහස් දක්වමින් රදගුරු හිමිපාණන් දරුවාගේ අනාගත ජීවිතය සාර්ථක කිරීමේ වගකීම ගුරුවරයා වෙත පැවරෙන බවත් සමාජය වෙනස් කිරීමේ භාරදූර කටයුත්ත ගුරුවරයා ඉටුකිරීම තුළින් සිදුකරන්නේ අප්‍රමාණ සේවයක් බවත් පෙන්නා දුන්නේය.

මෙදින ගුරුභූමිකාව යන මාතෘකාව ඔස්සේ කුරුණෑගල සාන්ත ආනා හිටපු විදුහල්පති ඩී. සී. එච්. ජයසිංහ මහතා දෙසුමක් පැවත්විය. කුරුණෑගල පදවියේ පසුගිය වසරේ විශ්‍රාම ලැබූ ගුරුභවතුන් අගයා ඔවුන්ට සිහිවටන ත්‍යාග යන් රදගුරු හිමිපාණන් අතින් ලබාදීම විශේෂ සිද්ධියකි.

බී. කේ. ටී. රෙජිනෝල්ඩ්



ගණේමුල්ල තිබ්බොටුගොඩ දේවස්තානය වැඩම කරවන ලද ලොව වටා රැගෙන යන පාතිමා දේව මෑණියන්ගේ පිළිරුව නොබෝදා දේවස්තානයට වැඩම කරවන ලදි. එම අවස්ථාවේ දී මීසම් සේවක පියතුමා වන ගරු රංජිත් ටෙරී පියතුමන් සමඟ කන්‍යාරාමයේ ප්‍රධාන සොයුරිය වන ගරු පෙලිෂිටා පැවිදි සොයුරිය සමඟ ගරු ෂෙල්ටන් ඩයස් පියතුමා සමඟ දේවස්ථානය වෙත රැගෙන එන අවස්ථාවයි.

කැලිස්ටස් ඇන්ටනි



වහකෝට්ටේ වප් මඟුල සිරිත් පරිදි මෙවරද ඉරුදින සුව මෙහෙයෙන් පසුව වහකෝට්ටේ සිද්ධස්ථාන පාලක ගරු යොවාන් ස්වරිමුත්තු (සා.බෙ.නි) පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ගරු පියතුමන් සී සාන ආකාරය මෙහි දිස්වේ.

පෝල් ඒකනායක

## වාර්ෂික ධර්මවිවේකය 5

**මීසම් වල සේවය කරන ගරු පියතුමන් සඳහා**

**දිනය** - නොවැම්බර් 20 ඉරිදා (රාත්‍රී ආහාරය) සිට 2011 නොවැම්බර් 25 සිකුරාදා (රාත්‍රී ආහාරය) දක්වා

**ස්ථානය** - රාගම තේවත්තේ, ධර්මවිවේක මන්දිරය

**දේශක** - ගරු ඔගස්ටින් ප්‍රනාන්දු පියතුමා

**සහභාගි වන පිරිස**

අති උතුම් ආචාර්ය මේරියස් පීරිස් හිමි, ගරු ජූඩ් සුරාජ් පියතුමා, ගරු ලක්ප්‍රිය නෝනිස් පියතුමා, ගරු මහේෂ් සී. ප්‍රනාන්දු පියතුමා, ගරු තරංග සම්පත් පියතුමා, ගරු රොෂාන් ප්‍රසාද් පියතුමා, ගරු මනෝකුමාරන් නාගරත්නම් පියතුමා, ගරු ගීතාලි ඇනස්ලි පියතුමා, ගරු මර්වින් කුලතුංග පියතුමා, ගරු ග්‍රොමික් කුරේ පියතුමා, ගරු ජූඩ් ලක්ෂමන් පියතුමා, ගරු ලෝරන්ස් රාමනායක පියතුමා, ගරු මර්වින් ප්‍රනාන්දු පියතුමා, ගරු ඇන්ටන් ජයලත් පියතුමා, ගරු ජෝන් හෙට්ටිආරච්චි පියතුමා, ගරු නොයෙල් ඩයස් පියතුමා, ගරු නුවන් බුද්ධික පියතුමා, ගරු ඉඳුනිල් සම්පත් පියතුමා, ගරු ජූඩ් පීරිස් පියතුමා, ඉන්ද්‍රා රත්නසිරි පියතුමා, ගරු රීඩ් එස්. ප්‍රනාන්දු පියතුමා, ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමා, ගරු බර්නාඩ් රේහාට් පියතුමා, ගරු ක්‍රිෂාන් ජයශාන්ත පියතුමා, ගරු ක්‍රිස්ටෝපර් ජූලියස් පියතුමා, ගරු වික්ටර් ජයමාන්න පියතුමා, ගරු ශ්‍රියන්ත රත්නසේකර පියතුමා, ගරු චන්ද්‍රනලාල් ප්‍රනාන්දු පියතුමා, ගරු ඇන්ටන් රන්ජිත් පියතුමා, ගරු ටෙරන්ස් ප්‍රනාන්දු පියතුමා, ගරු පීලික්ස් ශාන්ත පියතුමා, ගරු අනුර ශ්‍රී කමල් පියතුමා, ගරු ක්‍රිස්ටි නික්ලස් පියතුමා, ගරු චමින්ද රොෂාන් ප්‍රනාන්දු පියතුමා, ගරු දෙව්ශාන් අසංක ප්‍රනාන්දු පියතුමා, ගරු නිලන්ත හේෂාන් ප්‍රනාන්දු පියතුමා, ගරු රොෂාන් ජානක ප්‍රනාන්දු පියතුමා, ගරු අසිත ප්‍රසාද් ප්‍රනාන්දු පියතුමා, ගරු නලීන් සුරාජ් පියතුමා, ගරු රුවන් රීඩ් ලියනගේ පියතුමා, ගරු කැනීසියස් නේරිස් පියතුමා, ගරු ප්‍රදීප් චමින්ද පෙරේරා පියතුමා, ගරු කෘෂන් කුමර පෙරේරා පියතුමා, ගරු ප්‍රසන්න රොහාන් පියතුමා, ගරු සුමිත් රොෂාන් රොද්‍රිගු පියතුමා, ගරු සුනිල් නිශාන්ත රොද්‍රිගු පියතුමා, ගරු කිරුල් ජයනාත් සිල්වා පියතුමා, ගරු අමිල රවින්දි වැන්ඩවෝල් පියතුමා, ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමා

**✠ අතිඋතුම් මේරියස් පීරිස් සහයක රදගුරු - අනුනායක**

## සජිත් ප්‍රේමදසගෙන් කිතුනු මගට සවියක්



**කලින් විහාරස්ථාන වලට පමණක් සීමාවී තිබූ 'සසුනට අරුණ' වැඩසටහන දැන් 'කිතුනු මඟට සවියක්' නමින් කතෝලික දෙව්මැඳුරු වලටත් ව්‍යාප්ත කර ඇති බවත් ළඟඑන නත්තල් සමය තුළ කතෝලික දෙව් මැඳුරු 25 කට මූල්‍ය ආධාර ලබාදීම සඳහා අවශ්‍ය මුදල් දැනටමත් වෙන්කර හමාර බවත් හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේනතු මන්ත්‍රී සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.**

ඒ මහතා ඒ බව පැවසුවේ 'කිතුනු මඟට සවියක්' වැඩ සටහන යටතේ හැඳල නායකකන්ද ශාන්ත මරියා දේවස්ථානය සඳහා රුපියල් 50,000 ක මුදලක් පරිත්‍යාග කිරීම නිමිත්තෙන් පැවති උත්සවයේදීය.

ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ හිටපු අමාත්‍ය ජෝන් අමරතුංග, ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සිරිකමල් ද සිල්වා යන මහත්වරුද මෙහිදී කතා කළහ.

නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා ආගමික වතාවත් සිදුකළ අතර පලාත් සභා මන්ත්‍රීවරුන් වන ශිරන්ත අමරසේකර, ශ්‍රීනාත් පෙරේරා සහ ජෝර්ජ් පෙරේරා යන මහත්වරු ද වත්තල ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක චානක සෙනරත්, වත්තල මාබෝලේ නගර සභාවේ විපක්ෂ නායක මාක් ගුණසේකර, බස්නාහිර පලාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල, වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැල්කම් පෙරේරා යන මහත්වරුද මේ අවස්ථාවට සහභාගිවූහ.

තිමල් පෙරේරා

## කොටුගොඩ නව මීසම් ගෘහය 17 වැනිද විවෘත කෙරේ



කතෝලික දේවස්ථාන 05 කින් සමන්විත කොටුගොඩ මීසමට අංගසම්පූර්ණ මීසම් ගෘහයක් නොතිබීම විශාල අඩුපාඩුවක් විය. එම සියලු බාධක හා අඩුපාඩු ජයගනිමින් අදට ඔබින පරිදි සියලු අංගෝපාංගයෙන් යුතුව ඉදිකෙරුණු නව මීසම් ගෘහය අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් නොවැම්බර් 17 බ්‍රහස්පතින්දා පස්වරු 5.00 ට විවෘත කැරේ. මෙහි නියමුවා ලෙස මීසම් සේවක ගරු ජූඩ් ලක්ෂමන් පියතුමා පෙරටුකොට කොටුගොඩ මීසම් ධර්මසේවා සභාව, ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය, වැඩිහිටියන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම්, තරුණ කොටස් මේ සඳහා මූල්‍ය ආධාර රැස්කිරීමේ කටයුතුවල නිරතවූහ.

සේයා - ජානක ප්‍රනාන්දු, සටහන - මැල්කම් සිල්වා

## සාන්තුවර ප්‍රතිමා මගින් රූප වන්දනාවක් කරන්නේ නැහැ - ජාතික ජනසංනිවේදන අධ්‍යක්ෂ පියතුමා



කතෝලික සභාව සාන්තුවර භක්තිය ඔස්සේ අපේ ජීවිතවලට උකහාගත හැකි වටිනාකම් පාදා දෙනවා මිස සාන්තුවර ප්‍රතිමා මගින් රූප වන්දනාවක් කරන්නේ නැහැ. මේ සාන්තුවර සාන්තුවරියන් සාමාන්‍ය දිවි පෙවතකින් ඈරැ ඹු ජීවිත තුළ විශේෂ කැපකිරීම් නිසා සාන්තුවර භාවයට ඔසොවා සුවිශේෂ කැඳවීමක් ලබා තිබෙන්නේ යැයි කිතුනු ජනසංනිවේදන ජාතික අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමා පැවසීය.

සාන්ත දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු ශ්‍රී ලංකාවට වැඩම කිරීම පිළිබඳව බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සංවිධානය කර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ගරු පියතුමා එසේ පැවසීය.

දොන් බොස්කෝ සැලේසියානු නිකායේ ශ්‍රී ලංකා ප්‍රාදේශීයාධිපති අතිගරු ටැනිහාල් ලියනගේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති මේ මාධ්‍ය හමුවේදී කරුණු දැක්වූ ගරු බර්නාඩ් ප්‍රනාන්දු සැ.නි පියතුමා 'දොන් බොස්කෝ අධ්‍යාපනයෙන් සමාජයට තවත් මජං බාස් කෙනකු වෙනුවට යහපත් පන්නරයක් ලත් දොන් බොස්කෝ කෙනකු ලබාදෙන බැව් පැවසීය.

සමාජ සේවා ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු නියෝජ්‍ය ඇමැති දයාශ්‍රිත තිසේරා මහත්වරුද සහභාගි වූ අතර රාජ්‍ය සම්පත් හා ව්‍යවසායක සංවර්ධන නියෝජ්‍ය ඇමැති සරත් කුමාර ගුණරත්න මහතාද කතා කළේය. ගරු ඩික්සන් ප්‍රනාන්දු, ශිරාන් කැරැව්ගොඩ පියතුමන්ද කිතුනු කටයුතු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ඒ. ආර්. ගුණවර්ධන මහතාද කතා කළේය.

## විවාහක යුවළ සති අන්ත වැඩසටහනක්

**අගරදගුරු පදවි ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය මීගමුව මුන්නක්කර විවාහක යුවළ සඳහා සති අන්ත වැඩසටහනක් පසුගිය සෙනසුරාදා, ඉරිදා මුන්නක්කරය දෙව්මැඳුරු ශාලාවේදී පැවැත්විය. මේ වැඩමුළුව මෙහෙයවනු ලැබුවේ අනුරාධපුර පදවි පවුල් සේවා අධ්‍යක්ෂ ගරු සුනිල් ගුණවර්ධන පියතුමන් විසිනි.**

මේ වැඩසටහනට මුන්නක්කර ග්‍රාමයේ කතොලික යුවල රාශියක් සහභාගි වූහ. එහි පැවැත්වූ මුල්ම යුවළ වැඩසටහන හැටියටද වාර්තාවේ.

## මළවුන්ගේ මංගල්‍යයේ පඬුරු දේවස්ථාන ගොඩනැගිලි අරමුදලට

හංවැල්ල මීසමට අයත් ජයලත් අප ස්වාමිඳු නමට කැපකර ඇති, වේල්ගම දේවස්ථානයෙ පවුල් සංඛ්‍යාව දාහතකි. මේ දෙව්මැඳුර ඇඩි ලෙස අබලම්වූ හෙයින් නව දෙව් මැඳුරක් ගොඩනැගීමට ආරම්භ කරන ලද අතර වැඩ රාශියක් කරන්නට ඉතිරිව ඇත.

මෙවන් තත්ත්වයක් යටතේ හංවැල්ල මීසටම අයත් සියලු දේවස්ථාන වල මළවුන්ගේ මංගල්‍ය දින මුදල් පඬුරු වේල්ගම දේවස්ථාන ගොඩනැගිලි අරමුදලට යෙදවීමට හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් සමගින් සහයක ගරු ටිරෝන අජිත් යන පියවරුන් විසින් තීරණය කරන ලදි.

ඇන්තනි හෙට්ටිආරච්චි

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රි. ව. 2011 නොවැම්බර් 13 ඉරිදා

# පාඩු ලබන ව්‍යාපාර පිළිබඳ පනත

අසාර්ථක හා පාඩු ලබන ආයතන රජයට පවරා ගැනීමේ පනතට දැඩිලෙස විරෝධය පළකිරීමට එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම තීරණය කොට ඇතැයි පසුගියදා වාර්තා විය. සෙවනගල සීනි කර්මාන්ත ශාලාව, පැලවත්ත සීනි කර්මාන්ත ශාලාව හා ලංකා ට්‍රැක්ටර්ස් යන ආයතන රජයට පවරාගන්නා ආයතනයන්හි උපලේඛනයෙන් ඉවත්කළ යුතු බවට රජයට බලකිරීමටද එම පක්ෂය තීරණය කළ බව තවදුරටත් වාර්තාවේ.

එක්සත් ජාතික පක්ෂය මේ සම්බන්ධයෙන් එලෙස පියවර ගැනීමට සැරසෙද්දී පාඩුලබන සහ අසාර්ථක ව්‍යාපාර රජයට පවරා ගැනීම සඳහා වන ඌන කාර්යය සාධන ව්‍යාපාර සහ ඌන උපයෝජිත වත්කම් යළි යථා තත්ත්වයට පත්කිරීමේ පනත් කෙටුම්පත අග්‍රමාත්‍ය දි.මු ජයරත්න මහතා විසින් පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට යෙදිනි. එහිදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිකුත් කළ නිවේදනයට අනුව සඳහන් වී ඇත්තේ පෞද්ගලික අංශයට පවරා තිබූ රජයේ ආයතන අපේක්ෂිත පරමාර්ථ ඉටු නොකරන සහ පාඩු ලබන අන්දමින් පවත්වාගෙන යන බැවින් ඒවා ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා රජයට පවරා ගන්නා බවයි. ඌන කාර්යය සාධක ව්‍යාපාර සහ ඌන උපයෝජන වත්කම් යළි යථා තත්ත්වයට පත්කිරීමේ පනත යටතේ පවරාගනු ලබන්නේ රජයට අයත්ව තිබී පසුව පෞද්ගලික අංශයට පවරන ලද ලාබ නොලබන ආයතන පමණකැයි යන්නද පවසන්නට රජය හා සම්බන්ධ විවිධ පක්ෂ විශාල උත්සහයක යෙදෙන බවක් ද දක්නට ලැබේ.

මෙකී දත්තයේ සමස්තය කෙලෙස තේරුම් ගනු ලැබුවද ඌන කාර්යය සාධක ව්‍යාපාර සහ ඌන උපයෝජිත වත්කම් යළි යථා තත්ත්වයට පත්කිරීමේ පනත සම්බන්ධයෙන් මහ පරිමාණ ව්‍යාපාර අංශවල දැඩි අවධානය හා තැති ගැන්ම විශාල වශයෙන් පැන නැගී ඇති බව නම් පැහැදිළියි.

දේශීය විවිධ ජාතින් අතරින් බිහිවී මහ පරිමාණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන පුද්ගලයන් රටේ වෙසෙසින්ම ආර්ථික උත්පාදකයන් මෙන් ව්‍යාපාර කටයුතුවල යෙදෙති. එනමුදු මෙම පනත හදිසියේ සම්මත කර ගැනීමට රජය තැබූ පියවර හමුවේ සියලු ව්‍යාපාරිකයන් හා ආයෝජකයින් යම් අපැහැදිලි තත්ත්වයකට පත්වී ඇති සෙයක් පෙනේ. මන්ද පාඩු ලබන ආයතන යයි කියමින් ලාබ ලබන ව්‍යාපාර පවරාගැනීමට දේශපාලන ඕනෑ එපාකම් ඉදිරියට පැමිණීමේ ඇති භයංකර බව එයින් හැගෙන නිසාමයි. මෙහිදී තවත් සුපරික්ෂාකාරීව බැලිය යුතු කරුණක් ඇත. එනම් පාඩු ලබන ආයතන පවරා ගන්නවා කියනවා වෙනුවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලබන ආයතන යනුවෙන් එකී ව්‍යුහය නම්කොට ඇති නිසාය. එහිදී ප්‍රයෝජනයට නොගන්නා දේපල පිළිබඳ විශේෂයෙන්ම සැකයක් මතුවෙනු ලබයි. මෙහිදී ව්‍යාපාර පමණක් නොව දේපලද (ඉඩම් ඇතුළුව) පවරා ගැනීමේ අයිතිය පනත සම්මත වීම තුළින් රජයේ අධිකාරි බලයට නතුවන නිසා ඇතුළත චිත්‍රය ආයෝජකයන් හට එතරම් හිතකර නොවන බව පෙනේ.

මෙම පනතේ තවත් විමසීමට කරුණක් වී තිබෙන්නේ මෙම පනතින් පවරා ගැනීමට යන ආයතනයක හිමිකරුවකුට තමන් ජාතික ආර්ථිකයට දී ඇති සවිබර දායකත්වය හා ලබාදී ඇති සේවක රැකියා සම්බන්ධයෙන් කරුණු පැහැදිළි කරදීමට කිසිදු ඉඩ ප්‍රස්තාවක් හිමිකර නොදීමයි. කලින් පැවති යම් ක්‍රමයක් තුළ හිමිකරුට අධිකරණයේ සහය පැතීමට අවකාශ තිබුණද නව පනත සම්මත වීමත් සමඟම එම අයිතියද ඇහිරී යනු ඇත.

මෙහිදී අපේක්ෂිත ලාබ නොලබන ආයතන විධිමත් කරනු සඳහා රජයට පවරා ගැනීම සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නැත. නමුත් ආයෝජන මණ්ඩලයෙන් අනුමත කළ ලාබ ලබන ව්‍යාපාර අත්තනෝමතිකව පවරාගැනීම තුළ ඇතිකරවන හිදැස් අතර විවිධ ප්‍රශ්න ඉනික්බිතිව පැනනැගීම නම් වලක්වාලීම අපහසුවනු ඇත. එලෙසම ඇතිවන පරස්පරයන් පිළිබඳවද ගැටළු නිර්මාණය වනු ඇත.

විදේශීය හෝ දේශීය ආයෝජකයන් සියලු ආයෝජන කර තිබෙන්නේ ශ්‍රී ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් වලට අත්සන් තැබීමෙන් බව නොරහසකි. එහිදී කිසිදු ව්‍යාපාරයක් ජනසතු කිරීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවෙන්ම අහිමිකර තිබේ. නමුත් සිදුවන්නට යන්නේ තවෙකකි. මේ සියල්ලෙහිම අවසන් ප්‍රතිඵලය වන්නේ මෙවැනි ක්‍රියාවලින් ශ්‍රී ලංකාව කෙරෙහි ආයෝජකයන්ට ඇති විශ්වාසය බිඳ වැටීමයි. ජනතා සුබසාධනය ඉහළ නැංවීමත් මෙයින් කෙළෙස අපේක්ෂා කරන්නේද යන්නත් උභතෝකෝටියකි. පෞද්ගලික අංශයට ඇති ඉඩකඩ ඇහිරීමෙන් ජනතාව මත අධිකතර බරක් පැටවෙන බවනම් කිවමනායි. මෙය තේරුම් ගෙන ක්‍රියාකිරීම් සහ සම්මත කිරීම් සිදුවිය යුත්තේ පක්ෂ දේශපාලන කරුණු පමණක් මුල්කොටගෙන නම් නොවේ යන්න අප යළි යළිත් අවධානය කරන්නේ එබැවිනි.

# කිතුනු මරණය පිළිබඳ



## බයිබලීය හා සභා පිය ඉගැන්වීම්

මරණය (Mors, θάνατος) යනු මෙලොව ජීවිතාවසානය යි. මරණය සිදුවන්නේ ශරීරයෙන් ආත්මය වෙන්වීම නිසා බව ශුද්ධවූ අගුස්තීනු මුනිතුමා (ක්‍රි. ව. 354-430) තම 'දේව නගරය' නමැති කෘතියේ සඳහන් කරයි (De Civitate Dei, 13,6) තවදුරටත් මරණය ගැන කතා කරන උක්ත සභා පියතුමා ප්‍රධාන වශයෙන් මරණීය තත්ත්වයන් දෙකක් ඇති බව පවසයි. එනම්, ආදි මව්පියන්ගේ පාපයෙන් මිනිසාට හිමිවූ මරණීය තත්ත්වය හා ක්‍රිස්තුන් වහන්සේ විසින් අවසාන විනිශ්චය දින දි මිනිසාට හිමිකර දෙන මරණීය තත්ත්වය යි (Opus Imperfectum Contra Iuliamum, 6, 31).

ශුද්ධවූ ලියැවිල්ල මරණය පිළිබඳ විවිද අර්තකථනයන් ඉදිරිපත් කරයි. ඒ අනුව, මරණය යනු 'මෙලොවින් සමුගැනීමකි' (පිලිප්පි 1:23, 2 තිමති 4:6), 'අවසානයකි' (මතෙව් 10:22), 'ප්‍රතිඵලයකි' (හෙබ්‍රෙව් 13:7) 'යළි තම භූමියට පැමිණීමකි' (උත්පත්ති 3:19) හා 'නින්දකි' (ජෝබ් 3:13, ගීතාවලිය 12:4, මතෙව් 9:24). එසේම, මරණය වනාහි ජම්ම පාපයේ ද ප්‍රතිඵලයකි. එනම් මරණය 'නපුරාගේ ක්‍රියාවකි' (ජුවාම් 8:44), 'සතුරාගේ ක්‍රියාවකි' (1 කොරින්ති 15:2) නැතහොත් 'දෙවියන් වහන්සේගෙන් නික්ම නොවන ක්‍රියාවකි' (ප්‍රඥාව 1:13). මේ අනුව, මරණය යනු සරලව විස්තර කළ හැකි හා තේරුම්ගත හැකි යථාර්ථයක් නොවන බව පැහැදිළිවේ.

'අයියණ්ඩියේ, මැරෙනා හැටි ම පෙන්වන්නම්' යැයි එඩිතරව කියූ මද්දුම බණ්ඩාර ගැන ලාංකේය අපි අසා ඇත්තෙමු. එසේම, 'මේ ලෝකයේ සැප සම්පත් භුක්ති විඳිමින් ජීවත් වනවාට වඩා, ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් මියයාම මට වාසනාවකි. මම, අප වෙනුවෙන් තම ජීවිතය පූජාකළා වූ ඔවුන්වහන්සේ කෙරෙහි පිපාස වෙමි. මම, අප වෙනුවෙන් උත්ථානය ලැබුවා වූ ඔවුන්වහන්සේ සොයා යමි..... මට ඉඩ දෙන්න, දුක්විඳ. මරණයට පත් වූ මාගේ ස්වාමින් වහන්සේගේ සාක්ෂිකාරයෙක් වන්නට' යැයි පැවසූ ශුද්ධවූ අන්තියෝකියේ ඉග්නාසියුස් මුනිතුමා (ක්‍රි.ව. දෙවන සියවස) වැනි සභා පියවරු ගැන කිතුනු අනුගාමිකයන් වන අපිදු සභා ඉතිහාසය තුළ අසා ඇත්තෙමු (රෝමවරුන්ට ලියන ලද ලිපිය, 5-6). මෙම උක්ත ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ට එඩිතරව, බලාපොරොත්තු සහගතව හා මහත්වූ ප්‍රීතියකින් මරණයට මුහුණ දෙන්නට ඔවුන්ට ආදර්ශයක් වූයේ කවුරුන්ද?

කිතුනු විශ්වාසය තුළ අපි දිනපතා ප්‍රකාශ කරන මූලික සත්‍යතාවයන් තුනකි. එනම්, ක්‍රිස්තුන් වහන්සේ උකුත්වූ සේක, ක්‍රිස්තුන් වහන්සේ උත්ථානවූ සේක, ක්‍රිස්තුන් වහන්සේ නැවත වඩින සේක. උක්ත කිතුනු සත්‍යතාවයන් අතර ක්‍රිස්තුන් වහන්සේගේ මරණය විශේෂ තැනක් ගනී. ක්‍රිස්තුන් වහන්සේගේ මරණය සැමවිටම කිතුනුවන් හට ආදර්ශයකි, එමෙන්ම විශාල අභියෝගයකි.

ක්‍රිස්තුන් වහන්සේගේ සිත තුළ පැල පදියම් වූ එක් සිහිනයක් විය. එනම්, දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුකිරීමයි. දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් මිනිසා පාපයෙන් මුදාගන්නට කුරුසිය මත මරණයට පත්වීමයි. ඒ හෙයින් ක්‍රිස්තුන් වහන්සේට මරණය යනු බලාපොරොත්තු සහගත ජීවිත තත්ත්වයක් විය. මරණයට බිය වෙනවාට වඩා තමන්වහන්සේ ආදර්ශයට ගෙන, තමන්වහන්සේගේ වචනය තුළ විශ්වාසය තබා මරණයට මුහුණ දෙන ලෙස තම ජනතාවගෙන් ක්‍රිස්තුන්වහන්සේ ඉල්ලා සිටි සේක: 'පුනරුප්ජීවනය ද, ජීවනය ද මම වෙමි: මා අදහා ගන්නා මැරුණත් ජීවත් වන්නේය. ජීවත්ව සිටින, මා අදහාගන්න කිසිවෙක් කිසි කලෙක නොමැරෙන්නේය' (ජුවාම් 11:25-26).

ක්‍රිස්තුන්වහන්සේ විසින් තම ගෝලයන්ට දුන් එම අභියෝගයට සාක්ෂි දරමින් බොහෝ දෙනෙක් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් දුක් විඳ මරණයට පත්වූයේ මහත් වූ ප්‍රීතියකින් හා බලාපොරොත්තුවකින් ය. එතුමන්ලා ප්‍රාණපරිත්‍යාගිවරුන් නැතහොත් වේදසාක්ෂිවරුන් වශයෙන් සභාමාතව හඳුන්වන්නිය. සභා පිය යුගයේ (ක්‍රි.ව. පළමු සියවස් අට) බොහෝ සභා පියවරු උක්ත ප්‍රාණපරිත්‍යාගිවරුන් හා ඔවුන්ගේ මරණයන් පිළිබඳව විවිධ කරුණු ඉදිරිපත් කරති. සභාපිය ලිපි ලේඛනවලට අනුව, ප්‍රාණපරිත්‍යාගිවරුන් එලෙස මරණය වැළඳගත්තේ ක්‍රිස්තුන්වහන්සේට සාක්ෂි දැරීම තුලින් ජීවිතාවසානයේදී ස්වර්ගිය සැපත අත්කරගැනීමට බව පැහැදිළි වේ. ඒ අනුව, සැමවිටම කිතුනු මරණය වනාහි ස්වර්ගිය සැපතට මාර්ගය වන්නේය යන්න ශුද්ධවූ ලියැවිල්ල මෙන්ම සභා පියවරුන් ද ප්‍රාකශ කරන සත්‍යතාවයකි.

ශුද්ධවූ අගුස්තීනු මුනිතුමා පෙලාජියන්වාදි ඉගැන්වීම් වලට විරුද්ධව කරුණු ඉදිරිපත් කරමින් කිතුනු අනුගාමිකයන් තුළ මරණයට මුහුණදීමේදී තිබිය යුතු ආකල්ප ගැන සඳහන් කරයි. ඒ ආකල්ප අතර මූලික වශයෙන්ම ජීවිතාවසානයේ දී මරණයට මුහුණදීමට කිතුනුවා සතුව තිබිය යුතු උට්ඨාන වීර්යය ගැන එතුමා විශේෂයෙන් සඳහන් කරයි (De Dono Perseverantiae 1:1, 6:10). ඊට අමතරව සදාකාලික ජීවිතය අත්කර ගැනීම සඳහා කිතුනු අනුගාමිකයන් හට මරණයේ ද, දේව උදව්වේ ද අවශ්‍යතාවයක් ඇතිබව තවදුරටත් ශුද්ධවූ අගුස්තීනු මුනිතුමා සඳහන් කරයි.

මරණය හා පුනරුප්ජීවනය ගැන කතා කරන ශුද්ධවූ පාවුලුතුමා අවසාන දිනයේදී මළාවූ හා ජීවතුන් අතර සිටින ජනතාවට සිදුවන අභිරහසක් ගැන කතා කරමින් අපි කිසිවෙක් නොනසින බවත් අවසාන මොහොතේදි නැතහොත්

15 පිටුවට »

ගරු ෂෙරෝන් ඩයස් පියතුමා

## කැමිලස්ගේ තිත්ත ඇත්ත



# අද පවුල්වල පවා විනාශකාරී අසමගිය ඔඩුදුවනවා

## සලාපුර රදගුරු හිම්පාණෝ අනාවරණය කරති

**ත්‍රස්තවාදය ලෝකයේ ඇස් අරින කාලයක්. සෑම මිනිසෙකුගේම සිත්වල වෛරය, පලිගැනීම ලියලමින් පවතින කාලයක්. අද පවුල්වල පවා මේ විනාශකාරී අසමගිය ඔඩුදුවමින් පවතිනවා. එයට හොඳම ඉගැන්වීම කුරුස ගසේදී ජේසුතුමා සතුරු බලවේගයට සමාව දීමෙන් දුන් මහඟු ආදර්ශය යැයිහලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිම්පාණෝ පැවසූහ.**

රදගුරු හිමි මේ බැව් ප්‍රකාශ කළේ හාල්දඬුවන මීසමේ කහටවිල ශාන්ත විනිප්‍රිඩා මුනිවරියගේ දේවස්ථාන වාර්ෂික මංගල දේව මෙහෙයේ දී ය.

එහිදී රදගුරු හිමි මෙසේද පැවසීය. සමාව දීම පහසු දෙයක් නොවේ. කිතුනුකම ප්‍රගුණ කරන්න, අනුගමනය කරන්න, එවිට සමාව දීම ඔබේ සිත් වලද පහලවේ. සුලු වරද කරුවකුෙට වුවද සමාව දී බලන්න. සිතට ඇතිවන සැහැල්ලුව.

මීසම් සේවක ගරු ප්‍රන්සිස් ලාවුස් පියතුමාගේ මඟපෙන්වීම යටතේ දායක සභාවේ මෙහෙය වීමෙන් මංගල උලෙළ උත්සවාකාරයෙන් සිදුකරන ලදි.

ජේ. විල්ප්‍රඩ් සමරසිංහ
හාල්දඬුවන



හලාවත පදවි මරිය හමුදා කොම්ට්ෂියම් සභාව මඟින් වනාතවිල්ලුව මීසම් සේවක ගරු සිසිර කුමාර පියතමාගේ ආරාධනයෙන්, කොම්ට්ෂියම් ආත්මික අධ්‍යක්ෂ ගරු ජූඩ් ඩයස් පියතුමාගේ හා කොම්ට්ෂියම් නිළ මඬුල්ලේ සංවිධානයෙන් ක්‍රිස්තු සංචාරයක් වනාතවිල්ලුව මීසමට අයත් මංගලපුරය හා සේරක්කුලිය යන දේවස්ථානවලදී පවත්වන ලදී. මරිය හටයින් 10 කගේ හා කන්‍යා සොයුරියන් 09 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවති මෙම ක්‍රිස්තු සංචාරය ආරම්භයට පෙර මේ සඳහා සහභාගි වූ පිරිස වනාත්විල්ලුව දේවස්ථානය අසලදී කැමරා ඇසට මුහුණ දුන් අයුරු.

කොකුම් වාසනා ජයරුවන් ප්‍රනාන්දු



එක්සත් ජාතීන්ගේ සංගමයේ 66 වන සංවත්සරය සහ එක්සත් ජාතීන්ගේ දිනය නිමිත්තෙන් ජාතික සමගි සංගමය පිහිටුවා වසර 18 පිරීම මූලික කරගෙන එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව මෙරට කලාව, විද්‍යාව සහ වාණිජ, ආගමික, සංස්කෘතික, දේශපාලනික හා ආර්ථික අංශයන්ගෙන් මෙරටට සුවිශේෂී මෙහෙවරක් කරන ලද විද්වතුන්ට සම්මාන උපහාර පිදීමේ උත්සවයක් කොළඹ බණ්ඩාරනායක අන්තර් ජාතික අනුස්මරණ ශාලාවේදී පැවැත්විණි. සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමැති ටී. බී. ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් මෙ උත්සවය පැවැත්විනි. එහිදී ප්‍රැන්සිස්කාන තෙවන නිකායේ ප්‍රාදේශාධිපති අතිගරු මාර්ක් ප්‍රනාන්දු පියතුමාට දේශමානය විද්‍යා ජෝති සාහිත්‍ය විශාරද ගෞරව නාම සහිත සම්මාන උපාධිය පිරිනැමූ අන්දම මෙහි දැක්වේ.

සිසිල් ඩැනීසියස්

## වකුගඩු රෝගියාට පිහිට වෙමු



පමුණුගම වැලිකැටිය නො. 43/ ඒ නිවසේ පදිංචි ලූෂන් ජෝශප් ජයමාන්න මහතා දරුණු වකුග ඩු රෝගයකින් පෙළෙයි. විශේෂඥ වෛද්‍ය ඒ. එල්. එම්. නසාර් මහතා මොහුට හැකි ඉක්මනින් වකුගඩුවක් බද්ධ කළ යුතු බවට නිර්දේශ කර ඇත.

මොහුව සුවපත් කිරිමට 'ඒ' හෝ 'ඕ' පොසිටිව් වර්ගයේ වකුග ඩුවක් පරිත්‍යාග කිරීමට කැමති පරතිත්‍යාගශීලියකු වෙතොත් 077 2228304 දුරකථනය අමතන්න.

මේ සඳහා පරිත්‍යාග වෙතොත් පමුණුගුම මහජන බැංකුවේ ගිණුම් අංක 318-2-001-1-6578972 ට බැරකරන ලෙස ඉල්ලා සිටි.

## දෙව්මවු පැසසු ජපමාල රාත්‍රිය

කුරුණෑගල පදවියේ වල්පිටගම මීසම් ජනතාව දෙව් මව් පසසා ජපමාල රාත්‍රියක් පසුගියදා අති උත්කර්ෂවත් ලෙස පැවැත්වූහ.

වල්පිටගම මීසමට අයත් යායමුල්ල නාඹිරිත්තන්කඩවර, වල්පිටගම, නවසිගහවත්ත යන දේවස්ථානවල සැදැහැවත්හු ඉකුත් මාසය පුරා දෙව් මව් ප්‍රතිමා නිවෙස්වලට වඩමවා ජපමාලය උච්චාරණය කළහ. මාසයේ අවසන සියලුම ප්‍රතිමා වල්පිටගම දේවස්ථානයට වැඩමකර ජපමාල භාවනාවක් සිදුකළහ. ඉන් පසුව ජීවමනා ජේසු සමිඳුන් හට ශුද්ධ වූ පැය පවත්වා දිව්‍ය පූජාව සිදුකරන ලදි. අනතුරුව සියලුම දේව මාතා ප්‍රතිමා රැගෙන දෙව් මැඳුර අබියස වීදි සංචාරය කළහ. අවසානයේ සියලු දෙනා දෙව් මවුන්ට කැපකර ප්‍රතිමාවෙන් ආශිර්වාදය දානය කළේය.

මේ අවස්ථාවට තඹකන්ද කල්වාරි දේවස්ථානයේ ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාද සහභාගි විය. වල්පිටගම මීසම් සේවක ගරු නීල් ක්‍රිෂාන්ත පියතුමාගේ මඟපෙන්වීම යටතේ සිදුකැරිණ.

ටී. එම්. පී. සන්ධ්‍යා කුමාරි

# මතුගම මීසමේ වතුකරයේ තනිවූ කිතුනු ජනතාව සොයා යති

මතුගම මීසම් සේවක ගරු දෙව්ෂාන් අසංක පියතුමාගේ විශේෂ අවධානය, කැපවීම වෙන්වූ ජනතාව සොයා බැලීමට පියවර ගැනිණ.

මේ සත්කාරයේ පළවෙනි අදියර ලෙස මීසමට අයත් වතු 31 න් වතු 20 ජනතාව එකම දිනයක කණ්ඩායම් ලෙසින් බැහැදැක තොරතුරු විමසීමට හැකිවිය. ඒ මගින් ඔවුන්ට තිබෙන්නාවු ගමනා ගමන දුෂ්කරතා, ආර්තික දරිද්‍රතාවය. අධ්‍යාපනික හා ආගමික ගැටළු හඳුනා ගැනීමට හැකිවිය. මේ කාර්තව්‍යය සඳහා ගරු පියතුමන්, පැවිදි සොයුරියන් 15 දෙනකු, මරිය හමුදා සමාජිකයින් 60 දෙනෙක් හා මතුගම කුඩා කිතුනු සංඝ සාමාජිකාවෝද එක්වූහ. වතුකරයේ ජනතාවගේ සිත් වල ආගමික ප්‍රබෝධයක් හා දෙව්මව් බැතිය ඇති කරලීමට මෙය මහඟු අවස්ථාවක් විය. එපමණක් නොව ඔවුන් තනිවූ ජනතාවක් නොවන බව ඒතත් ගිය බවක් දක්නට ලැබුණි.

සුනීතා මාලිනි විජේසිංහ

## ගල්ලොළුව සා. අගුස්තීනු දෙව්මැඳුර




ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ පුරවරයේ ගල්ලොළුව ගම්මානයේ ශුද්ධ වූ අගුස්තීනු මුනිඳුන්ගේ දෙව් විමන පිහිටා ඇත.

මේ දෙව් මැඳුර ඉදිකරන ලද්දේ ක්‍රි. ව. 1850 බව සඳහන් වේ. මුල් කාලවකවානුවේ දි බෝලවලාන මීසමට අයත්ව තිබී කාලයාගේ ඇවෑමෙන් බුරුල්ලපිටිය මීසමට ද දැන් 'යටියන' මීසමටද ගල්ලොළුව දෙව්මැඳුර අයත්වේ. කිතුනු ඒකක 4 කින් සමන්විත දෙව්මැඳුරට අයත් පවුල් සංඛයාව 50-60 ත් අතර පිරිසකි.

2000 අගෝස්තු 20 අතිඋත්තම නිකලස් මාකස් ප්‍රනාන්දු හිම්පාණන් විසින් 150 වැනි ජුබිලි මහෝත්සවය මහත් ජයෝත්සවයෙන් සමරණ ලදි. වර්තමාන මීසම් සේවක ගරු ක්‍රිස්ටෝපර් මඳුරාවල පියතුමා දෙව්මැඳුර ප්‍රතිසංස්කරණය කර වසර 10 කට පසු මුළු දෙව්මැඳුර ඇතුලත් හා පිටත බිත්ති වර්ණ ආලේපනය කර, අධ්‍යාත්මික ව ද, කිතුනු ජනතාවට නිතර මඟපෙන්වයි. එදා සිට මේ දවක්වා සිටි ගරු පියතුමන් දෙව් මැඳුරට විවිධවූ අංග උපාංග එක්කළ බව ගෞරවයෙන් සිහිපත් කළ යුතුය.

කේ. ඩී. ප්‍රින්සි ප්‍රියංගනි
ගල්ලොළුව

## මත්තේගොඩ ජූඩ් මුනි උපහාර

කිතුනු සංඝයක එකමුතුවත්, දේව විශ්වාසයත් වෙනදාට වඩා පෙන්නුම් කරමින් පන්නිපිටිය මීසමට අයත් මත්තේගොඩ ශුද්ධ වූ ජූඩ් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල උලෙළ පසුගියදා පැවැත්විණි. නොවාන දිනවලදීත් සන්ධ්‍යා මෙහෙය සහ මංගල දේව මෙහෙයේදීත් මත්තේගොඩ කිතුනු ජනතාවගේ සහභාගිත්වය හා දායක්තය කැපී පෙණුනි.

සාන්ත ජූඩ් මුනිඳුන් සමිඳාණන් වෙනුවෙන් කැපවී එදා කළා වු මෙහෙවර ආදර්ශයට ගනිමින්, ජීවත් වන සමාජය තුළ ආදර්ශවත්ව ක්‍රියා කිරීමේ වැදගත්කම බෙනදිකානු නිකායික ගරු ඇන්ස්ලට් පොන්සේකා පියතුමා සන්ධ්‍යා මෙහෙයේ දෙසුම පවත්වමින් අවධාරණය කළේය. මංගල දිව්‍ය පූජා මෙහෙය ගරු නිලේන්ද්‍ර ගුණසේකර දි.ස.නි පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර මීසම් සේවක පියවරුන් සමඟ ඒව දෙව්මැඳුරේ මීසම් සභාව මංගල්‍ය කටයුතු සංවිධානය ක ළහ.

ක්‍රිස්ටෝපර් රණසිංහ

## පමුණුගම දෙව්මැඳුරේ ප්‍රතිසංස්කරණ කටයුතු ඇරැඹේ



පමුණුගම දෙව්මැඳුර සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට මීසම් සේවක ගරු ආන්නද විතාන පියතුමා සමග ගොඩනැගිලි කමිටුව කටයුතු යොදා ඇත. මේ සංවර්ධන කටයුත්ත විශේෂ යාච්ඤා මෙහෙයකින් ආරම්භ කළ අතර සහයක ගරු මංජුල නිරෝෂන් පියතුමා ද හවුල්වූ මෙදින සේවක මහතුන් හා එම ආයුධ උපකරන ආසිරි ගන්වන ලදි. ගරු ආනන්ද විතාන පියතුමා වැඩ ආරම්භ කළ අවස්ථාව.

බෙන්ජමින් කිරිහෙට්ටි

# ජපමාල පා ගමනක්

හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් සහ සහායක ගරු අජිත් පියතුමන්ගේ මඟපෙන්වීම අනුව හංවැල්ල මීසම් වාසී සැමගේ සංවිධානයෙන් යටවෝවිට නිර්දෝෂ දේව මාතා දෙව් විමනේ සිට හංවැල්ල සුරලොවට වැඩි දේව මාතා දෙව් විමන කරා ජපමාල පා ගමනක් ඉතා උත්කර්ෂවත් ලෙස පැවැත්විය.

යට්ටෝවිට පූජක පුතකු වන ගරු ජයන්ත වික්‍රමසිංහ පියතුමා සමඟ හංවැල්ල මීසම් වාසි පිරිසක් සහභාගි වූහ.

ඇග්නස් විජේතුංග



නයිනමඩම සා. අන්තෝනි දේවස්ථාන සේවක මණ්ඩලය හා සා. අන්තෝනි තරුණ කැළ මීසම් සහයක ගරු දිලංක නිර්මාන් පියතුමාගේ සංවිධානයෙන් හා ගරු පයස් නිහාල් පියතුමාගේ අනුශාසකත්වයෙන් එකමුතුකම සහ සුහදතාවය වර්ධනය කරගැනීම සඳහා සුහද ක්‍රිකට් තරගයක් පැවැත්වීමෙන් අනතුරුව සමූහ ඡායාරූපයකට මුහුණ දුන් අයුරු.

සටහන - නිර්මලී ප්‍රනාන්දු සේයා - නිහාල් පෙරේරා

## ධාර්මික දිවි පෙවෙතක් තුළින්

# දේව ආදරයේ පහස ලබමු

අම්පිටිය ජාතික දෙව්සත්හලේ දර්ශන පීඨයේ
ගරු කේ. ක්ලෝඩ් පෙරේරා (පැ.තු.නි) සොයුරු විසිනි

*"සමිඳෙ ඔබෙ කූඩාරමේ සැරිසරන්නෝ කවුරුදෝ.... ඔබේ පිවිතුරු කඳුකරේ පා තබන්නෝ කවුරුදෝ...*

අප දෙසවනට ඉතා සුපුරුදු මේ ගීතිකා පද පෙළ ඇසෙන සෑම වාරයකම අප තුළ එමඟින් ජනිත කරවනු ලබන සියුම් ප්‍රශ්නාර්ථය වන්නේ සැබවින්ම එතුමාණන් සේ ධර්මිෂ්ඨ විය හැක්කේ කාටද? යන්නයි. දුබල මිනිස් අප ධර්මිෂ්ඨබවේ සූර්යයාණන් ද පරිපූරකයාණන් ද වන දෙවි පියාණන් ඉදිරියේ අළු දූලි හා සමාන නොවෙම් ද? නමුත් එම සීමිත තත්ත්වයෙහි සිටියදීම පවා අප සියල්ලන් දේව දරුකමෙහිලා බාර ගැනීමට එතුමාණෝ සැදී පැහැදී සිටින සේක. ධර්මිෂ්ඨකමට නිර්වචනයක් අපි කෙසේ සොයන්නෙමුද? දෙවිපියාණන්ම හැරවෙන කිසිදු උපහැරණයක් අපට ඒ සඳහා දීමට නොමැත. මා දර්මිෂ්ඨ වන්නේ මා ධර්මිෂ්ඨ නිසා නොව මා මැවූ තැනැන් වහන්සේ ධර්මිෂ්ඨ වන නිසාත් එතුමාණන් මා තුළ ධර්මිෂ්ඨ බවට සරිලන ආත්මලෝභී ආශාවක් ආරම්භයේ දී ම ජනිතකර ඇති නිසාත් ය (රෝම 3:10-11). එසේ වුව ද බොහෝ විට ස්වකේන්ද්‍රීය මිනිස් හැඟුම්, ආකල්ප තුළ ඇති සීමා සහිත බව සුඛාස්වාදයම මුල්කරගත් ජීවිතයකටම අප කැඳවයි. එහි අවසන් අගතිය වන්නේ ආත්මික මරණයකට අප විසින්ම අපවම පවරා දෙනු ලැබීමයි. ඒ නිසාම දෙවිඳුන් අපට පවසන්නේ සියල්ලටම පළමුව දේව රාජ්‍යය ද, එහි ධර්මිෂ්ඨ බව ද සෙවිය යුතු බවයි. (මතෙව් 6:33). මෙම සුවිශේෂී පැවරීමට අනුකූල ජීවිතය දෙවිඳුන් ලෝකාරම්භයේ සිටම අපෙන් බලාපොරොත්තු වූ දෙයකි.

ආදි මව්පියන්ගේ පාපය අකීකරුකමයි. ඔවුහු ධර්මිෂ්ඨවීම වෙනුවට දේව සමානකම සෙවූහ (උත්. 3:4-6). අපගේ පුහුදුන් බුද්ධිය තුළ කොතරම් නම් දෙවිඳු අණට පිටුපා මෙලොව මතවාද තුළ එල්බ ගෙන සදාකාලික සත්‍යතාවේ දෙවිඳුන්ව අපි ප්‍රතික්ෂේපකර



ඇත්තෙමුද? අවිද්‍යාවේ ගැලී සිටින අපව එතුමාණෝ ආදම් ආදි පියාණන් සොයා ගිය ලෙස සොයා එන සේක (උත්. 3:9-10). අහංකාරය නොහොත් උඩඟුව වනාහි අපව සමිඳුන්ගෙන් හා ධර්මිෂ්ඨකමින් ඈත් කරවන තවත් මූලික සාධකයකි. උන්වහන්සේ පැවැත්මෙන්ම නිහතමානී ය. නිරහංකාරයේ උල්පත එතුමාණෝ ය (පිලිප් 2:6-8). ධර්මිෂ්ඨකමේ මහත් වූ ආනිශංසය අප මැද විද්‍යාමාන වන්නේ මේ නිහතමානී බව තුළය. එය දේව සැලැස්මේ මහා පුදුමාකාර අභිරහස් අපට එළිදරව් කරයි (මතෙව් 11:25-26). නමුත් අතීතරයේ ෂීනාර් නිම්නයේ සැදූ අහංකාරයේ හා උඩඟුබවේ බාබෙල් කොත හා සමාන කොත් අපි අදත් නොතනමු ද? අපි පෙළ ගැසෙමු, කඳවුරු බඳිමු, ප්‍රීතියෙන් උද්දාම වෙමු,

මේ සියල්ල කුමක් සඳහා ද? ඒ අපේම පුරසාරමින් තෙදවත් වූ අපේම රාජ්‍යයක්, බාබෙල් කොතක් තැනීමට නොවේ ද? දෙවිඳුන් තුළ අප ලැබූ සියලු දීමනා අපි අයහපත සඳහා ආයෝජනය කරමින් දේව රාජ්‍යය හා ධර්මිෂ්ඨකම සෙවීම අනාගතයට කල් තබමින් යක්ෂයා බයිබලය උපුටා දැක් වූ කලෙක මෙන් අපි ද දේවභාෂිතම උපයෝගී කොටගෙන අපේ රාජ්‍යයේ පවුරු ශක්තිමත් කිරීමට ඒවාම විකෘති අර්ථයෙන් හුවා නොදක්වමු ද?

සැබෑ ධර්මිෂ්ඨකම වනාහි සාමයේ අස්වැන්නයි (ජාකොබ් 3:18). නමුත් උඩඟුව තුළ අප දකින්නේ විරසකය, ධනය, බලය, කීර්තිය, දරාගත නොහැකි ඊර්ෂ්‍යාව හා තමා මුදුන්පත් වීමේ සැඟවුණ තීව්‍ර කැදරකමයි (උත්පත්ති 4:5). අත්තනෝමතික නිදහසක් සහිත විනයකින් තොර ලෝකයක් නිර්මාණය කිරීම සඳහා දායක වන මෙලොව ජනප්‍රිය සංස්කෘතීන් හි සියලුම නිර්මාපක බලවේග මෙම ධර්මිෂ්ඨකමේ දේව රාජ්‍යය වෙනුවට අහංකාරයේ බාබෙල් කොත් අප අතර තැනීමට අර අදිති.

එතැනින් නොනැවති එය එකදු ධර්මිෂ්ඨයකු නොමැති සොදොම් ගොමෝරාවන් අප අතර නිර්මාණය කිරීමට උත්සාහ දරනු පෙනේ (උත්පත්ති 18:16-33). ධර්මිෂ්ඨකම වනාහි මීට ඉඳුරාම වෙනස් වූ එහි ප්‍රතිවිරුද්ධයයි. මරියතුමියගේ නිහතමානී හිස්වීම තුළ මෙන්ම සෑම සුදුවරයකුගේම බැහැපත්වීම තුළ දෙවිඳුන් ඔවුන් සියල්ලන්ම ධර්ම සම්පූර්ණත්වයෙහි පිහිටුවා ලූ අයුරු දකින ඕනෑම අයෙකුට එය මනාව ප්‍රත්‍යක්ෂ වනු ඇත.

මේ සියල්ලටම වඩා දෙවිඳුන් ධර්මිෂ්ඨකම අප තුළ ඇතිකරනු වස් ප්‍රේමය නමැති උතුම් ගුණාංගයට ඇතුලු වීමට අපට ආරාධනා කරන සේක. දෙවිඳාණෝ පැවැත්මෙන්ම ප්‍රේමය වන සේක.

☛ 15 පිටුවට

## ධර්ම සංග්‍රහය

*ඈත අතීතයේ සිටම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අපගේ ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය ලෙස පිළිගන්නා වූ සත්‍යයකි. ඒ පිළිබඳව II වන වතිකාන මන්ත්‍රණ සභාවේ පූජක දූත කාර්ය පිළිබඳ ප්‍රකාශනය පවසන්නේ අනිකුත් සියලු සක්‍රමේන්තු සහා දූත කාර්යයන් ශාසනීය කටයුතු සියල්ලක්ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සමග ගැඹුරු සබැඳියාවක් ඇති බවයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ කිතුනු දිවියේ පිරිපුන් බව අඩංගු වී ඇත. එය එසේ වන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යනු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේම වන හෙයිනි. (Presbyterorum Ordinis No. 5)*

*දිව්‍ය යාගය, දිව්‍ය පූජාව එබැවින් කිතුනු දිවියේ ප්‍රධාන ස්ථානයක් ගනී. එය පූර්ණ වන්දනාවකි. එදා කල්වාරියේ සිදු වූ ඒ ඓතිහාසික සිද්ධිය එනම්; ජේසු සමිඳුන් අග්‍ර පූජකයාණන් ලෙස තමන් වහන්සේම පියාණන් වහන්සේට ඔප්පු කිරීම අනුස්මරණය කිරීමයි. ඒ පිළිබඳව දෙවන වතිකාන කතිකාවේ ජනවන්දනා පිළිබඳ ප්‍රකාශනය පවසන්නේ, අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේ දී එතුමාණෝ සියලු පුද පූජා තමන් වහන්සේ යාග වීම මඟින් පූර්ණත්වයට පත් කළ අතර, එම උතුම් කාර්යය නැවත සිහි කිරීමට සභාව නමැති මනාලියට පැවරූ බවයි.*

# දිව්‍ය සත්ප්‍රසාදය දිව්‍ය යාගය

# අපව සුවපත් කරයි

*එබැවින් දිව්‍ය යාගය තුළ දී, ජේසු සමිඳුන් සක්‍රමේන්තු ආකාරයෙන් මිදි යුෂ හා පූප ආකාරයෙන් අප අතරට වැඩම කරන සේක. දිව්‍ය පූජා පිළිවෙතේ දෙවන ස්තෝත්‍ර යාගික යැදුමේ, අවසාන කොටසේ දී, පූජාප්‍රසාදිතුමා දිව්‍ය රහස් කිරීමේ පිළිවෙත ආරම්භ කිරීමට පෙර යාත්‍රා කරනුයේ පූදසුන මත තබා ඇති පූප හා මිදි යුෂ සමිඳාණන්ගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරයට හැරෙන ලෙසට යි. ඒ අනුව පූජාප්‍රසාදිතුමා පූප හා මිදි රස මත කුරුසය ලකුණු සළකුණු කරමින් මෙසේ ප්‍රකාශ කරනු ලැබේ. අප එසේ යදිනුයේ මේ පඬුරු අප උදෙසා අපගේ ස්වාමින් වන ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය බවට පත්වනු සඳහා ය."*

*ශුද්ධාත්මයාණන් වහන්සේ වරමින් මරිය තුමිය ගැබ්ගත්තා සේ එම ශුද්ධාත්මයාණෝ ම දිව්‍ය යාගයේ දී පූප හා මිදිරස ජේසු සමිඳාණන්ගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හරවන සේක. දිව්‍ය යාගය අවස්ථාවේ දී සැදැහැවත් ජනතාව දෙවිඳුන් සමීපයට පැමිණෙන අතර එසේම එහි දී අපගේ නුසුදුසු බව පිළිගෙන අපගේ පාප වලට සමාව අයදිමු. එහි දී සැබෑ මනස්ථාපය තුළ අපි ඇතුළාන්ත සුවය හා සාමය අත් දකිමු. දිව්‍ය යාගයේ මනස්ථාප වීමේ පිළිවෙතේ දී අපි මෙසේ අයදින්නෙමු. "මනස්ථාප වූවන් සුවපත් කිරීම සඳහා වැඩම කළාවූ ස්වාමිනී අපට කරුණා කළ මැනව." දිව්‍ය යාගය තුළ දී අපගේ දුබල පවුකාර බව පිළිගැනීමට, විශේෂ අවස්ථාවන් දී ඇත. එසේම මෙම අවස්ථාවේ දී දෙවිඳුන්ගේ අති කරුණාවන්ත භාවය නිසා අපට සමාව හා සුවය ලැබෙන බව අපි විශ්වාස කරමු. එසේ ම දෙවිඳුන්ගේ කරුණාව, අපි අත් දකිමින්, විශ්වාසයෙන් යුතුව, අප තුළට වඩින ලෙස ආයාචනා කෙරේ. **(තවත් කොටසක් ලබන සතියේ)***

# මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමේ වැදගත්කම කුමක් ද?

## දහම් ගැටළු

අගරදගුරු පදවි විවාහ අධිකරණයේ
ගරු ප්‍රැන්සිස් සේනානායක පියතුමා පිළිතුරු දෙයි

**කතෝලික අපි නොවැම්බර් මස දෙවෙනි දා මළවුන් සිහිකරන දිනය ලෙස සලකමු. එදින පමණක් නොව, මුළු නොවැම්බර් මාසය පුරාම මළවුන් වෙනුවෙන් විශේෂයෙන් යාච්ඤා කිරීම සඳහා වෙන් කර ඇත. කෙනකු මියගිය පසු ඔහුගේ හෝ ඇයගේ ජීවිතය අනුව ස්වර්ගයට හෝ නිරයට යෑම තීරණය වන නිසා ජීවතුන් මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම කිසිම එලක් නොවන බව සමහරු තර්ක කරති. මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම පිළිබඳව කතෝලික සභාවේ ඉගැන්වීම කුමක්දැයි පහදා දෙන්න.**

මෙම ප්‍රශ්නයට පිළිතුරක් සැපයීමට සූදානමක් ලෙස කතෝලික සභාව උගන්වන මූලික ඉගැන්වීම් දෙකක් වෙත අපගේ අවධානය යොමු කළ යුතුය. ඉන් පළමු වැන්න ශුද්ධිකාගිනිස්ථානයයි; දෙවැන්න සාන්තුවරයින්ගේ සමෝක්ෂ ධර්ම ලාභයයි. අප ප්‍රථමයෙන් ශුද්ධිකාගිනිස්ථානය පිළිබඳ කතෝලික ඉගැන්වීම කුමක්දැයි තේරුම් ගැනීමට උත්සාහ කරමු.

කතෝලික ධර්මෝපදේශයේ අංක 1030 - 1032 හි ශුද්ධිකාගිනිස්ථානය හෙවත් අවසාන පවිත්‍රිකරණය පිළිබඳ මෙලෙස සඳහන් වෙයි. දේව වරප්‍රසාදය හා දේව මිත්‍රත්වය සහිතව කෙනෙකු මිය ගියත් ස්වර්ගයට ඇතුල්වීම සඳහා අවසාන පිරිසිදු වීමකට ලක්විය යුතුවෙයි. මෙම පිරිසිදු වීමට කෙනෙකුව ලක් කෙරෙන ශුද්ධ + ගිනි + ස්ථානය, නිරය ලෙස වටහා නොගත යුතුය. ෆ්ලොරන්ස් හා ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභා වලදී ඉදිරිපත් කෙරුණ මෙම ඉගැන්වීමට ශුද්ධ ලියවිලි පසුබිමක් ඇත (1 කොරින්ති 3:15; 1 පේදුරු 1:7). එසේම මෙම ඉගැන්වීමට මකබ්වරුනට ලියන ලද දෙවෙනි පොතේ 12/46 සඳහන් මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම පිළිබඳ ඉගැන්වීම ද පාදක විය.

එම නිසා ශුද්ධිකාගිනිස්ථානයෙන් ස්වර්ගයට ඇතුල්වීම සඳහා පවිත්‍රකරණයේ යෙදෙන ආත්මයන් වෙනුවෙන් ජීවතුන් යාච්ඤා කිරීම මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම ලෙස මූලිකව හැඳින්විය හැකිය. මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමට ජීවතුන්ට හැකි ද? මෙයට පිළිතුරු සැපයිය හැක්කේ සාන්තුවරයින්ගේ සමෝස ධර්ම ලාභය පිළිබඳ ඉගැන්වීම මඟිනි. "ශුද්ධාත්මයාණන් කෙරෙහි ද, ශුද්ධවූ සභාව කෙරෙහි ද, සාන්තුවරයින්ගේ සමෝස ධර්ම ලාභය කෙරෙහි ද විශ්වාස කිරීම" ප්‍රසාද ස්නාපන පොරොන්දුවකි. එසේම අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ ද අප සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභය විශ්වාස කරන බව ප්‍රකාශ කරමු. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ශුද්ධවූ සභාව නමැති විශ්ව ලේඛණය උපුටා දක්වමින් කතෝලික ධර්මෝපදේශය සභාවේ තත්ත්ව අවස්ථාවන් තුනක් සඳහන් කරයි: එනම්, ක්‍රිස්තුස් වහන්සේ මහිමානීතව නැවත වඩින දිනයේ දී වන්දනාකාර සභාව, මියගිය අය පවිත්‍රිකරණයට ලක්වෙන ශුද්ධිකාගිනිස්ථානය හා මුළුමනින්ම පවිත්‍ර වී සදාකාල ජීවිතයට ඇතුළත් වූ සාන්තුවර සමූහය. (අංක 954). එකම සභාවේ මේ තුන් කොට්ඨාශය අතර පවත්නා සබඳතාවය සාන්තුවරයින්ගේ සමෝස ධර්මලාභය ලෙස හඳුන්වනු ලබයි. එය කතෝලික අපගේ විශ්වාසය යි.

එම නිසා ජීවත්ව සිටින අප මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා එසේ කළ යුතුබව අවබෝධ කරගැනීමට නම්, පළමු කොටම මෙම විශ්වාසයේ පදනම තිබිය යුතුය. මළවුන් වෙනුවෙන් ජීවතුන් යාච්ඤා කිරීමට දීර්ඝ ඉතිහාසයක් ඇත. මුල් යුගයේ දී එදා සභාව පීඩන යුගයට මුහුණ දෙද්දී විශ්වාසය වෙනුවෙන් දිවි පිදූ ප්‍රාණපරිත්‍යාගිවරුන් එදා ජනතාව ඔවුන් සාන්තුවරුන් ලෙස සලකා ඔවුන් වෙනුවෙන් හා ඔවුන්ගේ පිහිට පතා යාච්ඤා කළහ. පසුකාලීනව වසර 998 දී පමණ ක්ලුනිති පස්වෙනි ප්‍රධාන තාපස තුමා වන සාන්ත ඔදිලෝ තුමා විසින් මළවුන් සිහිකර යාච්ඤා කිරීම ආරම්භ කරන ලදී. පළමුව එතුමා තමන්ගේ තාපසාරාමයේ අනිකුත් තාපසතුමන්ලාට, මියගිය තාපසතුමන්ලා වෙනුවෙන් යාච්ඤා කරන ලෙස ඉල්ලා සිටින ලදී. එය එදා එම තාපස තුමන්ලාගේ ආධ්‍යාත්මිකත්වයට විශාල බලපෑමක් කිරීමට සමත් විය. පසුව මෙය එකී තාපසාරාමයෙන් පිටත ප්‍රචලිත වී දැන් එය විශ්ව සභාව වෙතම විකාශනය වී නොවැම්බර් දෙවෙනි දා නිල වශයෙන් මළවුන් සිහිකරන දිනය ලෙස පවත්වනු ලැබේ.

සභාව මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමේ දී මූලිකව මෙනෙහි කරන්නේ කුරුසියේ මරණින් ලොවට ගැලවීම ලබා දුන් උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ගැන ය. එලෙස ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පූජාවෙන් ගැලවීම ලබාගත් අයගේ ජීවිත අප හැම දෙනා තුළම බලාපොරොත්තුවක් හා ශක්තියක් විය යුතුය.

මළවුන් අපගේ යාච්ඤා ඔවුනට උපකාරයක් මෙන්ම, ඔවුන්ගේ උපකාරය අපට ලබා ගැනීමට අවස්ථාවක් බවද කතෝලික ධර්මෝපදේශයේ අංක 958 පෙන්වා දෙයි.

# මළවුන් සිහිපත් කිරීම

කොළඹ උතුරු කලාපීය නාහිමි
**අතිගරු ජේ. පැට්‍රික් පෙරේරා පියතුමන් විසිනි**

අද සමාජය තුළ විවිධ පුද්ගලයින් දෙවියන් පිළිබඳව ආගම පිළිබඳව විවිධ අදහස් දරති. එසේම මරණය පිළිබඳව මරණින් මතු ජීවිතය පිළිබඳව මිනිසුන් දරන මතයන් ද විවිධ ය. බෞද්ධ දර්ශනය තුළ මරණින් පසු නැවත ඉපදීම, විවිධ භවයන් තුළ ඉපදීම උගන්වන අතර එසේ උපත ලැබූ අය පිළිබඳව ද සමහර පුවත්පත් වලින් උලුප්පා පෙන්වීමට උත්සාහ කර තිබේ. එසේම සමහර ආත්ම, යක්ෂ පෙරේත, ආත්මයන් ලෙස ද උපදින බව සමහරුන්ගේ අදහසයි. එසේම අනිකුත් ආගම් තුළ ද යම් ආකාරයක නැවත ඉපදීමක් ගැන කතා කරනු ලැබේ. ඒ නිසා මලා වූ අය ගෞරවයෙන් වැළලීම හා මළා වූ අයට පිං දහම් කිරීම ද විවිධ යාච්ඤාවන් ඔප්පු කිරීම ද අපි දනිමු.

නමුත් කිතුනු අපි මළවුන්ගෙන් නැවත නැගිටීම ද මතු පැමිණෙන සදාකාලික ජීවිතය බලාපොරොත්තු වෙමු. කිතුනු අපගේ ඇදහිල්ල වන්නේ තාවකාලික මෙලොව දිවිය නොව සදාකාලික එලොව දිවියයි.

එබැවින් අපගේ ආගමික ඉගැන්වීම් හා වතාවත් සියල්ල යොමු කරන්නේ මේ අරමුණ සඳහා ය. එබැවින් අපගේ යාච්ඤාව හුදෙක් ජීවත්ව සිටින අය මළවුන් වෙනුවෙන් කරන යාතිකාවක් පමණක්ම නොව, ජීවත්ව සිටින අය ඔවුන්ගේ මරණය ගැනත් ඒ සඳහා නිතරම සූදානම්ව සිටිය යුතු බව මතක් කිරීමකි. මළාවූ අය යළි උත්ථාන වීම ගැන බලාපොරොත්තුවක් නැත්නම්, මළවුන් සඳහා යාච්ඤා කිරීම අනවශ්‍ය මෝඩ ක්‍රියාවකි.

එබැවින් අපට කිතුනු දහම කියා දෙන්නේ, ඔබගේ අණසක යටතේ ජීවත් වෙමු. ඔබගේ නියමයෙන් මරණයට ගොදුරු වී දූවිල්ලට නැවත හැරී පාපයේ ර හැනෙන් මිදී යමු යන්නයි. ඔබගේ පුත්‍රයාගේ මරණය හේතුකොටගෙන ගැලවීම ලැබූ අපි, උන්වහන්සේගේ මහිමය කරා, ඔබ නියම කර ඇති දින දී නැවත නැගී සිටින්නෙමු. යනුවෙන් රෝමානු යාගික පිළිවෙතේ ඔප්පු කරන දිව්‍ය යාගයේ දී මරණය ගැන භාවනාවක යෙදෙමු. මෙසේ මරණ පිළිබඳව ගැඹුරු දෙව් දහමත් උගන්වන්නේ ජීවත් වන අපි සියලු දෙනාම මරණයට මුහුණ දිය යුතු බව හා ඒ සඳහා සූදානම් විය යුතු බව පෙන්වීමටයි. දේව වචනය මරණින් මතුවට පැමිණෙන විනිශ්චය ගැන ද උගන්වනු ලැබේ. එනම් "මනුෂ්‍ය පුත්‍රයාණෝ සියලු දේව දූතයින් හා සමග තේජශ්‍රීයෙන් පැමිණෙන කල තමාගේ මහිමාන්විත සිංහාසනයේ වැඩ හිඳින සේක..... එවිට සියලු ජාතිහු උන්වහන්සේ අභිමුවෙහි රැස්කරනු ලබන්නෝ ය. උන්වහන්සේ ද එඬේරකු එළුවන්ගෙන් බැටළුවන් වෙන් කරන්නාක් මෙන් ඔවුන් වෙන් කොට බැටළුවන් සිය දකුණු පැත්තෙන් ද එළුවන් වම් පැත්තෙන් ද සිටුවන සේක.

එවිට රජ්ජුරුවන් වහන්සේ සිය දකුණු පසෙහි සිටින්නන්ට කතා කොට මාගේ පියාණන්ගේ ආශිර්වාද ලද්දෙනි, එන්න, ලෝකය පටන් ගැන්මේ සිට ඔබට සූදානම් කර ඇති රාජ්‍යය උරුම කරගන්න. .....

එසේම උන්වහන්සේ වම්පස සිටින්නන්ට කතා කොට "ශාප ලද්දෙනි, මා වෙතින් ඉවත්ව යක්ෂායාට ද උගේ දූතයින්ට ද සූදානම් කර තිබෙන සදාකාල ගින්නට යන්න".... මොවුහු සදාකාල දඬුවමට ද දැහැමියෝ සදාකාල ජීවනයට ද යන්නෝ ය." (මතෙව් 25:31-46).

සමහරුන් මළාවූ අය වෙනුවෙන් පුද පූජා, දාන පිංකම් පවත්වා මෙසේ කරමින් මළවුන් සඳහා අපගේ යුතුකම් ඉටුකළ කියමින් සෑහීමකට පත්වෙන්නට උත්සාහ කරති.

ඒ නමුත් ජාතීන්ගේ විනිශ්චය ගැන කතා කරන මතෙව් තුමා පවසන්නේ රාජ්‍ය උරුම කරගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රේමයේ ජීවිතයන් ගත කළ යුතු බව හා අපගේ සහෝදරයන්ගේ දුක, අමාරුකම, පිපාසය හමුවේ සංවේදී වීම හා අපගේ කිතුනු වගකීම ඉටු කිරීමය.

සමහරු කතෝලිකයින් නැසීගියාවූ අය උදෙසා දිව්‍ය පූජාවට කාසි දීමෙන් තමන්ගේ වගකීමෙන් බේරීමට උත්සාහ කරති. එසේ සෑහීමකට පත්වන්නේ නම් එය සභාව තුළ මළවුන්

☛ 15 පිටුවට



# වර්ධනයක් මිස පිරිහීමක් නොදැකිය යුතුයි

අවසානයේදී තලෙන්තු පිළිබඳ උපමාවේ වැඩි අවධාරණයක් ලැබෙන්නේ ලැබූ තලෙන්තු සඟවා තැබීමට කටයුතු කළ දාසයාට අත්වූ ඉරණමටය. ස්වාමියා මේ දාසයා ගැන කිපෙයි. තම තලෙන්තු වැඩි වර්ධනය කර ගත් අනෙක් දාසයන්ව පසසයි. මෙම දාසයාව හෙලා දකියි. ඔහුට වරද තබයි. දඬුවම් කරයි.

මෙම උපමාවෙන් පෙනෙන්නේ තමන්ට ලැබුණු හැකිකම් වැඩි වර්ධනය නොකර ගැනීම කෙතරම් දඬුවම් ලැබිය යුතු වරදක් ද යන්නයි. එය මරණීය පාපයක් ලෙස ජේසු සමිඳුන් මෙම උපමාව හරහා අපට කියයි. තලෙන්තු දහසක් ලැබූ දාසයා ඔහුට දුන් තලෙන්තු දහසම යළිත් ගෙනවිත් ස්වාමියාට බාර දෙයි. ඔහු තම ස්වාමියා දුන් හැම තලෙන්තුවක්ම පරෙස්සම් කළ කෙනෙකි. ඔහු ඉන් එකක් වත් නැති කරගෙන තිබුණේ නැත. එහෙත් ස්වාමියා ඔහුට විඳින්නට බැරි දඬුවමක් දෙයි. තමන්ට දුන් තලෙන්තු පරෙස්සම් කළ ඔහු මෙතරම් දැඩි දඬුවමකට යටත් කෙරුණේ නම් ලැබුණු තලෙන්තු නැති කරගත්තේ නම් ඔහුට කෙතරම් බරපතල අච්චුවක් විඳීමට සිදුවන්නට ඉඩ තිබුණේදැයි අපට සිතා ගැනීමටත් බැරි තරම්ය.

අප බොහෝ දෙනෙකු අතින් බොහෝවිට සිදුවන්නේ මෙම දාසයා අතින් පවා සිදු නොවුණු වරදකි. බොහෝවිට අපට සිදුවන්නේ අපේ තලෙන්තු ටිකින් ටික වැඩි වර්ධනය වීම නොව තිබෙන තලෙන්තු පවා ටිකින් ටික නැතිවී යෑමය. මෙසේ බැලූ කළ අප ළඟ තිබුණු බොහෝ වටිනා දේවල් අපට අහිමි වී ඇත. දැන් අපට මුලදී අප ළඟ තිබුණේ කුමක්ද? නැති වුණේ කුමක්දැයි කියා මතකත් නැත. ඊට හේතුව අපේ කිසි පරෙස්සමක් නැති කමයි. අද අපට ගොඩක් නැත්තේ මෙන්න මේ පරෙස්සමය. ඉතාලියට පැමිණි පසු අපට නැති වෙන පළමුවන දෙය මෙයය. අපේ සම්පත් වැඩි වර්ධනය කර ගැනීමට සිතාගෙන අප මෙහි ආවද මෙහි ආ පසුව අපට අප ළඟ තිබෙන සම්පත් ගැන අපේ හිතේ මුලින් තිබූ පරෙස්සම සහ බය පවා නැතිවී යයි. අපි අසාමාන්‍ය අවදානම් දැරීමට පටන් ගනියි. කල්පනාවෙන් වැඩකිරීමට තිබුණු අධිෂ්ඨානය හීන වෙයි. ලංකාවේදී ඉතිරි කළ ප්‍රමාණයවත් ඉතිරි කිරීමට මෙහිදී බැරිවෙයි.




අපේ ආර්ථිකයේ මෙන්ම අපේ ජීවිතයේද මෙම සෝදාපාළුව සිදුවෙයි. ගෙදරදි අපේ තිබුණු සහෝදරකම සහ බෙදාගැනීම පවා අපෙන් අතුරුදන් වෙයි. මගේම දෙමව්පියන් ගැන පවා මුලින් තිබුණු ආදරය පිරිහෙයි. ඔවුන්වද කරදරයක් වෙය. අපට මෙහිදි සිදුවී ඇති මෙම පිරිහීම පැහැදිළිව අපටද දැනෙන්නට ගන්නේ අප ලංකාවට ගිය විටය. එය අපටත් වඩා අපේ ගෙදර අයට තදින්ම දැනෙයි. වර්ධනයක් වෙනුවට පිරිහීමක් දැකීමට දෙවියන් වහන්සේ පමණක් නොව ඔබේම ගෙදර අයවත් කැමති නැත.

අද මෙම උපමාවෙන් කියවෙන්නේ මේ ගැන දෙවියන් වහන්සේ අන්තිමයේදී කටයුතු කරන ආකාරයය. උන්වහන්සේ තලෙන්තු වර්ධනය කර නොගත් දාසයාගේ තලෙන්තු බොහෝ සේ වැඩි කරගත් දාසයාට දීමට කටයුතු කළේය. අඩුම තරමේ ඔහුට දෙවියන් වහන්සේට දීමට ඔහු ඉපයූ දෙයක් නොතිබුණද දෙවියන් වහන්සේ ඔහුට දී තිබුණු දෙයවත් ආරක්ෂා කර ගෙන තිබුණි. දෙවියන් වහන්සේට දීමට ඔහු අතේ කුමක් හෝ දෙයක් තිබුණි.

මෙලෙස දිගින් දිගටම අවිචාරවත් ලෙස ජීවිතය ගෙවා දැමීමෙන් අවසා-නයේදී දෙවියන් වහන්සේ වෙත දිගු කිරීමට ඔබට කුමන හෝ දෙයක් අතේ ඉතිරි වෙයිද?



**ගරු හෙන්රි සිල්වා පියතුමා** 11

# ශු. බයිබලයට පොදු හැඳින්වීමක්




## සංස්කරණ (ප්‍රබන්ධන) විමර්ශනය

20 වන ශත වර්ෂයේ මැද භාගයේ පමණ මාටින් ඩිබෙලියස්, විලි මාර්ක්සන්, හන්ස් කොන්සල්මාන් යන අය මෙම ක්‍රමය සොයා ගත්තේ මූලාශ්‍ර විමර්ශනය හා නිබන්ධන විමර්ශනය මගින් පාඨයක් විශ්ලේෂණය කිරීමේදී වු අඩුපාඩු පිරිමසා ලීමටය. එය සම්පූර්ණ කිරීමටය. මෙහි පරමාර්ථය හා කාර්යභාරය වන්නේ පාඨයක් වර්තමාන තත්ත්වය දක්වා පරිණාමය වු අයුරු සෙවීමය.

එබැවින් මෙහිදි සංස්කාරකවරුන් යම් යම් කොටස් ඉවත් කිරීමටත්, බොහෝ කොටස් ඇතුලු කිරීමටත් හේතු විස්තර කිරීමට උත්සාහ දරනු ලබයි. සමාන්තර පාඨ අතර දැක්වෙන අමුතු ගුණාංගයන් හා වෙනස්කම් විස්තර කිරීමද මෙම ක්‍රමයට ඇතුලු වෙයි. මෙම ක්‍රමය ප්‍රායෝගිකව විස්තර කිරීම සඳහා පහත දැක්වෙන නිදසුන ප්‍රමාණවත් වනු ඇත. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමේදී කුසලාන මත ජේසුස් වහන්සේ පැවසු වචන වාර්තා කිරීම මාක්, මතෙව් සුබාරංචිවල එකිනෙකට වෙනස්ය. මාක් 14, 24

"මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරයවේ". මාතෙව් 26, 28 "මෙය පව් කමාව පිණිස බොහෝ දෙනා උදෙසා වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ." මාක් සුබාරංචියෙහි නොමැති "පව් කමාව පිණිස" යන වාක්‍යාංශය විස්තර කිරීමට ප්‍රබන්ධන විමර්ශනය උත්සුක වෙයි.

රෝමවරුන් විසින් මරණීය දණ්ඩනයට පත් කළ අයකුගේ මරණය ලෙස. ජේසුස් වහන්සේගේ මරණය සැලකූ ජුදෙව් නායකයනට මෙම දිව්‍ය සත්ප්‍රසාදීය වදන් පැහැදිලි කිරීම මතෙව් තුමනට ගැටළුවක් වු බව පෙනේ. එබැවින් ඔහු, තම ජනතාවගේ පාප වෙනුවෙන් ජීවිතය පුජා කළ දුක් විඳින සේවකයා ජේසුස් වහන්සේ බව තවදුරටත් තහවුරු කිරීමට වෙර දරයි. (යෙසායා 53, 8,10,12 ) මෙය ජේසුස් වහන්සේ තුළ වු චින්තන රටාවට ගැලපෙන්නක් විය. (මතෙව් 20, 28)

### 7. ශු. ලියවිල්ල ආශ්‍රයෙන් යාච්ඤාව

යාච්ඤාව හා භාවනාව සඳහා ශු. ලියවිලි භාවිතය විශේෂයෙන් වැදගත් වෙයි. ශු. ලියවිල්ල දේව වචනය වන නිසා විශ්වාසයෙන් යුතුව අප එය කියවන විට දෙවියන් වහන්සේ අපට කථා කරන බව අප පිළිගත යුතුය. යාච්ඤාව සඳහා බයිබලය භාවිත කිරීමේ ප්‍රායෝගික සරල ක්‍රමයක් සැකෙවින් මෙලෙස දක්වමු.

1. කියවීමට පහසු කෙටි ජේදයක් තෝරා ගැනීම. වඩා දිග ජේදයක් මගින් ඔබ වියවුලටම පත්වීමට ඉඩ ඇත. එළිදරව්ව පොතේ වැනි සංකීර්ණ ජේදයක් තේරුම් ගැනිමට අපහසු බැවින් එය ගැටළු සහගත විය හැකිය.

2. තමන් වහන්සේගේ වචනය මගින් දෙවියන් වහන්සේ අපට කථා කිරීමට යන බව සැලකිල්ලට ගෙන එවන් පරිසරයකට ඇතුලුවීම. මෙම පියවර මගින් අප විශ්වාසයේ පරිසරයකට ඇතුලු වන නිසා එය මෙහි ඉතා වැදගත් වෙයි.

3. ජේදය භාවනාත්මකව කියවීම.

4. කියවු දෙය අප සිත් තුළට කිඳා බැසීම සඳහා විනාඩි කීපයක නිහඬතාවකට ඇතුලු වීම.

5. ජේදය කියවන අතරතුර අප සිතට කා වැදුනේ කුමක් ද යන්න අපගෙන්ම විමසා බැලීම. එය හිතට කා වැදුනේ කෙලෙසද ? අපට දැනුණු හැඟිම කෙබඳුද ? සතුටද, ශෝකයද, නොසන්සුන්තාවය ද සාංකාවද වරදකාරි හැඟීමක් ද ? එලෙස වීමට හේතුව කුමක්ද ? එම හැඟීම යම් අතීත අත්දැකීමක් හෝ අප සතු යම් ආකල්පයක් වෙත එය අප ගෙනයන්නේද ? දෙවියන් වහන්සේ මෙ මගින් අප අමතනු විය හැකිය.

6. සමස්ත ජේදයෙන් ඉදිරිපත් කරන පණිවුඩය සොයා ගැනීම. අප හිතට කා වැදුන දෙය ජේදයෙහි අඩංගු එක අදහසක් පමණක් විය හැකිය. අද අප ජීවත් වන පරිසරයට, විශේෂයෙන් අප අද සිටින තත්ත්වයට මෙම පණිවුඩය යොදා ගන්නේ කෙසේද ?

7. ජේදය කියවීමේදී හා තේරුම් ගැනිමේදි මතුවු ගැටළු. මෙය මෙම අභ්‍යාසයෙන් පරිබාහිරව මතු අධ්‍යයනය සඳහාය.

8. තමන් වහන්සේගේ වචනය මගින් අපට කථා කිරිම වෙනුවෙන් දෙවිඳුනට තුති දෙන යැදුමකින් අවසන් කිරීම්.

**සැ. යු.** මෙම අභ්‍යාසය තනිව හෝ කණ්ඩායමක් ලෙස කළ හැකිය.

(තවත් කොටසක් ලබන සතියේ...)

# කොළොම්තොටින් නැව් නැග්ග ද අපේ රටේ මනුස්සකම

**කතුතුමනි,**

දහම් දිවයින ලෙස හැඳින්වූ ශ්‍රී ලංකාව බෞද්ධ හින්දු මුස්ලිම් ක්‍රිස්තියානි යන ප්‍රධාන ආගම් සතරකින් අධ්‍යාත්මික පෝෂණය ලබති. උදෑසන සෙත් පිරිස් දේශනයෙන් දවස අරඹා රාත්‍රියේ කරණීය මෙත්ත පූත්‍රය අසමින් නින්දට යන ජනතාවක් සිටින අප රටේ අඩියෙන් අඩිය පන්සල් පල්ලි කෝවිල් තරමටම අද මත්පැන් ශාලා ද ඇත. එදා විදේශිකයන් අප රට පාලනය කිරීමට පෙරත්, නිදහස ලබාගත් පසුත් මෙරට පාලනය කළේ බෞද්ද නායකයන්ය.

අදින් වසර 40 ට 50 කට පෙර සිටි දේශපාලන නායකයින් ඉතා අවංක යහපත් බුද්ධිමත් පිරිසක් වූහ. ඔවුන් තම දේපළ ධනය පවා යොදවමින් රටේ ජනතාවගේ දියුණුව සඳහා කැපවී සේවය කළහ. ඒ ගෞරවනීය මහත්මා දේශපාලනය නිසා ජනතාවද එකමුතුව සමගියෙන් යහපත් ලෙස ජීවත් විය. ඔවුන් තුළ මනුස්සකම පිරී තිබුණේය. පාරේ සතෙක් සිවුපාවෙක් මැරී සිටියත් අනේ අපොයි කියා දුක්වූහ.

මිනිස් ජීවිත, දේපල විනාශ කරමින්

30 වසරක් පුරා පැවති අප රටේ ජනවාර්ගික යුද්ධය නිමාවී ඇත. එහෙත මෑතක සිට අපට දිනපතාම වාගේ අසන්නට ලැබෙන්නේ සමූහ මිනිස් ඝාතනය, බිහිසුණු අපරාධ ගැනය. බලය ලබාග න්න, බලය රැකගන්න තම හිතවතා දිනවන්න විරුද්ධවාදීන් ඝාතනය කරති. පසුගියදා කොළඹ ප්‍රදේශයේ එවැනි සමූහ ඝාතනයක් සිදුවිය. දේශපාලනයට පාතාලය සම්බන්ධවීම මීට හේතුවන බව ඇතැමුන්ගේ මතයයි. නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලනය, සංස්කෘතිය. සමාජ ආර්ථිකය යන සෑම ක්ෂේත්‍රයකම දකින්නට ලැබෙන්නේ අයහපත් දේවල්ය. වානිජ ලෝකය අපට පෙන්වාදී තිබෙන සුඛෝපභෝගි ජීවිතය හේතුවෙන් අනිකා විනාශකර හෝ මුදල් සෙවීමට ඇතැමෙක් උත්සාහ කරති. නීති විරෝධි අවි ආයුධ ඔවුන් අතය. නොයෙකුත් හොර ජාවාරම් කරන්නන් අපරාධකරුවන් නීතියේ රැ ෑහැනට අසුවූවත් දේශපාලන



බලවතුන්ගේ මැදහත් කමින් ඔවුන් නිදහසේ සිටිති. නිවැරදි කරුවන් දඬුවම් ලබති.

අද සත්‍ය කථාකරන්නට, ලියන්නට, තම ස්වාධීන අදහස් ප්‍රකාශ කරන්නට නොහැකිය. ඔවුන්ව අතුරුදහන් කරති. ඝාතනය කරති. භීෂණය රජකළ කාලයන් කීපයක් අප පසුකර ඇත්තෙමු. එහි රඟ රටේ ජනතාව හොඳින් දනී. දැනටමත් සිදුවන භයානක දේවල් අවබෝධ කරගෙන එය පලානය කිරීම රට පාලනය කරන රජයේ වගකීමකි. එය පැහැර හරින්නේ නම් මේ සිද්ධීන් පිළිබඳව රජය දෙසට ඇඟිල්ල දිගු කිරීම වැලැක්විය නොහැක. මේ ඝාතකයන් අපරාධකරුවන් කවු ද, ඔවුන් මෙහෙයවනු ලබන්නේ කවුරුන් ද කියා සොයා එළිදරව් කිරීම පොලීසියේ වගකීමය. කිසිවකුගේ බලපෑමකට යටත් නොවී තරාතිරම නොබලා ක්‍රියා කළ යුතුය. අද ඇත්තේ කැලෑ නීතියයි. එදා ගරු සේවයක් බවට පත්වූ දේශපාලනය අද දූෂිත

මඩගොහොරුවකි. විචක්ෂණ බුද්ධිය වෙනුවට වාචාලකම ද, දේශ ප්‍රේමය වෙනුවට, දේශ ද්‍රෝහි බවද, සත්‍යය අවංක භාවය වෙනුවට අසත්‍ය වංචාවද අද පෙරට ඇවිත් නැද්ද? දූෂිත දේශපාලකයන් විසින් හසුරවනු ලබන රාජ්‍ය සේවය ද එසේ නොවේ ද? දේශපාලනඥයා එසේ නම් ඔහු වටා සිටින අයත් එසේ නොවන්නේ ද? යහපත් අවංක දේශපාලනඥයින් කීප දෙනෙක් හෝ තවමත් සිටීම වාසනාවකි. ඔවුන් හරිදේ පෙන්වා දුන්න ද පලක් නැත. නායකයෝ නිහඬය.

සාධාරණ ඉල්ලීම් වෙනුවනේ හඬ නගන්නවුන්ට ලැබෙන්නේ, වෙඩි ප්‍රහාර කඳුළු ගෑස් පොලු ප්‍රහාරයන්ය. වැරැද්දක් කර (හෝ නොකර) පොලිසියට අසුවූ විට ඔහුට උපරිම දඬුවම ලැබෙන්නේ නීතිය ඉදිරියට යාමටත් පෙරය. රාජකාරිය නිසි ලෙස ඉටු කරන මිනිස් ගුණදම් ඇති නිලධාරීන්ද සිටින බව කිව යුතුය. නීතිය අතට ගත් ජනයා දේපල හානි කරති. 21 වන සියවසට පා තැබූ අපට දියුණුවූ තාක්ෂණ බලමහිමයෙන් බොහෝ දේ ලබාගතැකි වූවත් ආදරය සෙනෙහස දයාව ආදි මිනිස් ගුණධර්ම ලබාගත නොහැක. ආර්ථික ප්‍රශ්න විසඳාගැනීමට වේගයෙන් දුවන මව්පියන්ට අද දරුවන් ගැන සොයාබලන්න ආදරය කරන්න වෙලාවක් නැත. උපන් කිරිකැටි දරුවන් මරා දමන, මඟ දමායන, මුදලට විකුණන මව්වරු කොතෙක් ඇද්ද, වැඩිහිටි දෙමව්පියන්ට සලකන්න දරුවන්ට වෙලා නැත. ගුරුවරු වැඩිහිටියන් සැලකීමක් ඔවුන්ට ගරු කිරීමක් නැත. ඇතැම් ළමා නිවාසවල පවා දරුවන්ව නිසි ආරක්ෂාව නැත. මේ සියල්ලටම හේතුව මිනිසා ආගම දහමින් ඈත් වීමය. රජයට පාසල් පවරා ගැනීමේ අයහපත් ප්‍රතිඵල දැන් ඇතිවී තිබෙන බව ඇතැමුන් කියති. එහි ඇත්තක් නැත්තේද නොවේ. එදා පාසලේ ප්‍රධාන විෂයවූ ආගම විෂය අද සුළු කොට සලකති. දරුවෙකු කුඩා කල සිටම ආගමික පරිසරයක් තුල ජීවත්විය යුතුය. ගුණ ගරුක සමාජයක් ඇතිකිරීමට මිනිසාගේ අධ්‍යාත්මය ද දියුණුවිය යුතුය. මිනිසා මිනිසාට ගරුකරන යුගයක් නැවතත් ආරම්භ කිරීම සෑම නායකයකුගේම යුතුකමය. වගකීමය. නැණවත් පාලකයා තම සෙනඟ විනයෙහි හසුරුවන්නේය. නැණවත් මිනිසකුගේ පාලනය මනාලෙස ක්‍රමවත් වන්නේය. පාලකයා යම්සේද නිලධාරින්ද එසේමය - ආණ්ඩුකාරයා යම්සේද පුරවැසියෝත එසේමය. නූගත් රජෙක් සෙනඟගේ විනාශය වන්නේය. නුවර සමෘද්ධිය එහි අධිපතින්ගේ ඥාන ශක්තිය පිට රඳා පවතින්නේය. (උපදේශකයා හෙවත් සිරාක් 10:1-3)

**ඩොරින් පෙරේරා**
මොරටුව

# වාර්ෂික කතෝලික ළමා නාට්‍ය උලෙළක් ඕනෑ !

**කතුතුමනි,**

2011 වසරේ රාජ්‍ය ළමා නාට්‍ය උලෙළේ හොඳම ළමා නිලියට හිමි සම්මානය වැල්ලවත්ත ශාන්ත ලෝරන්ස් කන්‍යාරාමය ඉදිරිපත් කළ 'අංකලුත් හරියට අපේ සීයා වාගේමයි' යන නාට්‍යයේ ප්‍රධාන චරිතයට පණ්ඩුන් අවිෂ්කා දියණියට හිමිවූ අතර, නාට්‍ය නිෂ්පාදනයට ලැබෙන කුසලතා සම්මානයද, හොඳම සහාය නළුවාට හිමි කුසලතා සම්මානයද එම පාසලේ ෆිඩේලියා දියණිය විසින් දිනාගන්නා ලදි.

මෙවැනි නාට්‍යයන් නිෂ්පාදනය කොට අධ්‍යක්ෂණය කරමින් විවිධ කුසලතා හිමි සිසුවියන් තෝරා බේරාගෙන එම චරිතයනට පන දෙන්නට දැරියනට දිරිය දුන් එම විදුහලේ වත්මන් විදුහල්පතිනි ගරු මේරි වනිකා පැවිදි සොයුරියට සියලු කිතුනුවන්ගේ ප්‍රණාමය හිමිවනු නොඅනුමානය. 2005 වසරේ සිට විවිධ කලා නිර්මාණ ජාතියට දායාද කරමින්, පසුගිය රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ වලදි දෙවැනි, තෙවැනි ස්ථාන පවා ලබාගෙන ඇත.

රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ වල දී කතෝලික පාසල් දායකත්වය ඉතාමත්ම අඩු මට්ටමකින් පැවතිය ද කතෝලික පාසල්හි කලා කුසලතා ජාතියට හෙළිකරන මෙවන්



ප්‍රයත්න අගය කරමින් ඒ සඳහා අතදීම ද අත්‍යාවශ්‍යය. කතෝලික කම නිසාමදෝ ගුණාත්මක බවින්. උසස්ම රසයෙන් සහ උසස් මට්ටමකින් යුත් මෙවන් විශිෂ්ට නිර්මානයන් කෙතරම් ඉදිරිපත් කළ ද ඒවාට නිසිතැනක් සහ සාධාරණයක් විනිශ්චය මණ්ඩලයන්ගෙ න් ලැබේ ද යන්න අතීතය දෙස බැලීමේ දී ඉතාමත් සැක සහිතය.

සියලු කතෝලික පාසල් (පෞද්ගලික / රජයේ / ජාත්‍යන්තර / දහම් පාසල්) සහභාගී කොට ගෙන ලබන වසරේ සිට 'කතෝලික ළමා නාට්‍ය උලෙළක්' ආරම්භ කරන්නට හොඳම අවදිය මේ බැව් මගේ වැටහීමයි. ඒ සඳහා හොඳම තලෙන්තු කතෝලික පාසල් සැම ඇත.

**එම්. ජෝ. පාරිස්** - වැලිවිට

# සුබසට පසු වදනක්!

**කතුතුමනි,**

2011.10.23 ඉරුදින ඥානාර්ථ ප්‍රදීපයට ෆිලීෂන් අබේකෝන් වියතුන් විසින් සපයන ලද සුබස තීරු ලිපියේ සඳහන් ඇතැම් කරුණු පිළිබඳව කැරෙන පැහැදිලි කිරීමක් වශයෙන් මෙය ලියැවේ. සිංහලයේ 'හර' ධාතුව ගෙනයාමේ අරුත මතුනොව පැරදවීම්, දුරු කිරීම්, අල්ලා ගැනීම්, පසුබට කිරීම් ඉවත හෙලීම් හා විවෘත කිරීම් යන අරුත් හි ද ඉන් බැහැරව වෙනත් අයුරකින් වර නැගී පෙරලීම් අරුත්හිද යෙදේ.

හරණයෙහි 'හර' ධාතුව පරස්මෙ පද වර නැඟෙනුයේ හරි - හරිති - හළි - හළ - හළු - හළ යනුවෙන් ද හ කාර ලෝපයෙන් අරි - අරිති - අළි - අළු - අළ යනුවෙන් ද වරනැගේ පෙරැලි අරුත්හි නම් 'හර' ධාතුව ආත්මනේ පද ගණයට වැටේ. එය වර නැඟෙනුයේ හැරේ - හැරෙති - හැරිණි - හැරුණු ලෙසිනි. මෙහිදි නම් 'හ' කාර ලෝපයක් සිදුනොවේ.

අපගේ විමතිය නම් අබේකෝන් ශූරින් නිවැරදි ලෙස දක්නා ලෝක පාපවල් හරන / හරින යන යෙදුමයි. 'බණ' 'රක්' 'බස්' ආදි ප්‍රථම පුරුෂයෙහි වත්මන්හි 'ඊ' 'ඉති' ප්‍රත්‍ය ගන්නා කර්තෘ කාරක නාම ක්‍රියාව විශේෂණව යෙදෙන කල්හි 'අ' 'ආ' බවට පැමිණේ. බණ - බණනා - රක් - රකිනා / රක්නා - බස් - බසිනා ආදි වශයෙනි, ඒ අනුව නිවැරදි යෙදුම විය යුත්තේ ලෝකපාපවල් හරිනා හෝ හරිනා හෝ යනුවෙනි.

"තවද වත්මන්හි 'හරයි' ඉවත් වී 'හරියි' තනිව නොයෙදි අත්හරියි - කල්හරියි - පැහැර හරියි ලෙස කට වහරේ ගත් වහරෙහි හැම විටම දැකිය හැකිය." ඉහත දැක්වෙන අබේකෝන් ශූරීන්ගේ මතය ද විමසිය යුතු වේ. 'හර' ධාතුවෙන් උපන් උපකාරක ක්‍රියා විශේෂයක් ද වේ. කපා හරියි - පළවා හරියි - සෝදා හරියි ආදි තන්හි කපයි - පළවයි - සෝදයි යන ලෙසින් යෙදුන ද අරුතට හානියක් නොවේ. එතැන් හිදි හර ධාතුව වඳ පවතුවකි.

'ර' පසු මූර්ධජ 'ණ' යෙදීම සංස්කෘත නීතියකි. එය ශුද්ද සිංහලයට වලංගු නොවේ යන අබේකෝන්ගේ ප්‍රකාශය අර්ධ සත්‍යයක් වශයෙන් හඳුන්වනු කැමැත්තෙමි. කර්තෘකාරක නාම ක්‍රියාව විශේෂණව සිටිනා කළහි එය නිවැරදි බව සැබෑය. 'මුවන් මරන වැද්දා - වැඩ කරන ගොවියා - සැරි සරන වන සත්තු ආදි වශයෙනි. එසේ වුවද 'ර' කාරාන්ත ධාතුන්ගෙන් නිපන් ක්‍රියා මාත්‍රය දැක්වීමේ දි ඉඳුරාම යෙදෙනුයේ මූර්ධජ 'ණ' කාරයයි. මර - මරණය - වර - වරණය - හර - හරණය - තර - තරණය ආදි වශයෙනි. ඉදින් අපගේ මෙම කරුණු දැක්වීම සම්බන්ධයෙන් ද අබේකෝන් ශූරීන්ගේ අවධානය යොමුවෙතියි සිතමි.

**කුවින්ටින් හපුආරච්චි**
කටාන

# වචනයේ පරිසමාප්ත අරුතින් ම පිදිය යුත්තන් පුදන සභාවක්

**කතුතුමනි,**

රටට ලෝකයට සේවයක් කළ පුද්ගලයෙකුට විශ්‍රාම යන්නට අවස්ථාවක් ලබා දෙන්නේ සිය සැඳෑ සමය සැහැල්ලු සිතින් ගත කිරීමටය. මෙසේ සිය සේවයෙන් ඉවත්ව හුදෙකලා වන බොහෝ දෙනෙකු යළි ප්‍රසිද්ධ සමාජයේ දකින්නට ලැබෙන්නේ කලාතුරකිනි. ඇතැම් විට විශ්‍රාම ලද පුද්ගලයා අමතක කර දැමීම තවත් කණගාටුදායක සිද්ධියකි. ඒ බව ඔවුහු මුවින් නොපෙන්වූ ව ද සිතින් සියල්ල විඳ දරා ගනිති.

කතෝලික සභාව තුළ ද විශ්‍රාම ලද පඬිවරු සිටිති. එහෙත් එතුමන්ට හුදෙකලා වන්නට ඉඩ නොතබා පොදු සමාජයට තවත් සේවය කරන්නට ඉඩ පහසුකම් සලසා දීම ප්‍රශංසා සහගතය.

උදාහරණයක් ලෙස අප රටේ විශ්‍රාමලත් අගරදගුරු හිමිපාණන් වහන්සේ දෙනමක් සිටිති. ඒ විශ්‍රාමලත් අගරදගුරු අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් හා විශ්‍රාමලත් අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ය.

ශුද්ධ වූ සභාවේ විශේෂ උත්සවයකට හෝ ඓතිහාසික අවස්ථාවකට උන්වහන්සේ දෙපළට ඒ සඳහා සහභාගි වීමට පහසුකම් සලසා දෙව් මෙහෙයට ද ආරාධනා කර දේශනයක් ලබා දීම හෝ



ආසිරි ගැන්වීමක් සඳහා අවස්ථාව ලබාදීම රටේ විශ්‍රාමිකයන් අමතක කරන සමාජයට මහඟු ආදර්ශයකි. එවන් අවස්ථා රැගත් පුවත් හා ඡායාරූප මාධ්‍ය මගින් පළකිරීම ද සමාජයේ සතුටට හේතුවකි.

**මංගල ජයවර්ධන**
ගිංතොට



# ශු. දොන් බොස්කෝ තුමන් වටා රොක් වූ බැතිමතුන් දුටු ප්‍රාතිහාර්යය

ශ්‍රී ලාංකීය ඉතිහාසයේ තවත් අති උත්කර්ෂවත් මංගල මහෝත්සවයකි මේ.... එනම්, තරුණයන්ගේ පියා, මිත්‍රයා හා ගුරුවරයා යන නම්වලින් පිදුම් ලබන ශු. ජෝන් බොස්කෝ මුනිඳුන් අප මව්බිමට සැපත්වීමේ වන්දනා ගමනකි. සත්තකින්ම, දොන් බොස්කෝ මුනිඳුන් අප අතරට, අප සමඟ, සිටීමට, අප තරුණ තරුණියන් බැහැදැකීමට සපැමිණෙයි. එබැවින්, උන්වහන්සේගේ මෙම ශුද්ධවූ ගමන දැකබලා ගන්නට අපි කොතරම් භාග්‍යවන්ත ද?
මෙම වාර්තාවේ සඳහන්ව ඇත්තේ ශුද්ධවූ ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු අඩංගු දේහය බැහැදැකීමට හා එයට ගෞරවය දැක්වීමට පැමිණි සැදැහැවතුන් අත්දුටු ප්‍රාතිහාර්යයන්ගෙන් කිහිපයක් පමණි.

★ දොන් බොස්කෝ තුමන් දරුවන්ට ආදරය කළා පමණක් නොව, තම දරුවන්ට සත්‍ය ආදරය පිළිබඳව ඒත්තු ගැන්වීමට ද අවශ්‍ය විය. මේ අදහස සනාථ කරවන සිදුවීමක් බුරුමයෙන් (මියන්මාරයෙන්) වාර්ථා විය. එනම්, බුරුමය තුළ පවතින හමුදා පාලනය නිසා එහි ආගමික නිදහස ඕනෑම ආගමකට ඉතා සීමා වී ඇති බව නොරහසකි. එම නිසා, දොන් බොස්කෝ දේහය බුරුමයට වැඩම කළ මොහොතේ, ජාත්‍යන්තර ගුවන් තොටුපළින් එය පිළිගැනීමට සැදී පැහැදී සිටියේ එරට හමුදා භටයින් පිරිසක් පමණි. දොන් බොස්කෝ තුමන්ගේ අනුගාමී කිසිදු දරුවකුට මෙම ගුවන් තොටුපළට ඇතුළු වීමටවත් අවසර නොලැබුණි.

නමුත් සිදුවූයේ විශ්ම කර්මයකි. එම ශුද්ධවූ දේහය ගුවන් යානයෙන් ඉවතට ගැනීමට සූදානම්ව සිටි හමුදා භටයින් කිහිප දෙනාට එම දේහය අඩංගු මංජුසාව සෙළවීමටවත් නොහැකි විය. එම නිසා එම භටයින් තවත් සද්ධන්ත හමුදා නිළධාරීන්ගේ සහය පැතුවද දේහය කිසිසේත්ම එළියට ගැනීමට නොහැකි විය. එබැවින් තරමක් කේන්තියට පත් ගුවන් තොටුපළේ අණ දෙන හමුදා නිලධාරියා (දුරකථනයෙන්) මීළඟට සහය පතා ඇත්තේ ළඟම තිබූ දොන් බොස්කෝ සැලේසියාන ආයතනයේ පූජක තුමන්ලාගෙනුයි. තම ආදර පියාණන් වෙත එක් සිත්ව එක්කොට ගත් ආදර සෙනෙහසත් සමඟම ගුවන් තොටුපළ වෙත ගියේ සැලේසියානු පියතුමන්ලා හතර දෙනෙක් පමණි. විශ්මකර්මය නම් මෙයයි...! එම දේහය අඩංගු මංජුසාව මත මේ දොන් බොස්කෝ තුමන්ගේ දරුවන් හතර දෙනා තම අත් තැබූ සැනින්ම එහි සෑම විලංගුවක්ම ඇරී කිසිදු බරක් නොමැතිව දේහය තම භාරයට ගැනීමට ඔවුන්ට හැකිවිය.

★ __බැංකොක් නුවර__ අන්ධ දරුවන්ගේ පාසැලක ඉගෙනුම ලබමින් සිටි අවුරුදු 16 ක එක් තරුණයෙක් හදිසියේම එම පාසැලින් නෙරපා දැමීමට සිදුවී ඇත. එනම් දොන් බොස්කෝ දේහය දකින්නට දෙව් වරප්‍රසාදය පැතූ මෙම දරුවා 2011 නොවැම්බර් 23 වන දින අවදි වී ඇත්තේ තම අන්ධභාවයට ආයුබෝවන් කියා ය. එම තරුණයාව අන්ධ පාසැලෙන් නෙරපා දැමීමට හේතුව නම් එයයි.

★ __ඉන්දියාවේ, කොහිමා__ විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වූ ඒ. එල්. සෙබස්තියන් තරුණ සේවාව වෙනුවෙන් දැඩි උනන්දුවක් දැක්වූ ගුරු පියෙකි. නමුත් දියවැඩියාව රෝගයෙන් ඔහුගේ මෙම තරුණ සේවාවන්ට දැඩි සේ බාධාවන් ඇති විය. එබැවින් තරුණයින් වෙනුවෙන්ම සිය ජීවිතය කැප කළ ශුද්ධවූ ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ දේහය ඉදිරිපිට දේව වරප්‍රසාදය පැතූ මෙම ගුරු පියා අත්දුටුවේ ඉතා ගැඹුරු හාස්කමකි. ඒ අද වනතුරු තමන්ට දියවැඩියාව රෝගයෙන් කිසිදු බලපෑමක් එල්ල නොවීමයි.

★ මෙය 2010 නොවැම්බර් මස 08 වන දින __තායිලන්තයට__ දොන් බොස්කෝ තුමන්ගේ දේහය වැඩම කළ මොහොතේ සිදුවූවකි. ඉතා අසාධ්‍ය ලෙස ක්ෂය රෝගය වැළඳී සිටි තම කුඩා දියණිය වෙනුවෙන් යැදීම සඳහා එක් බෞද්ධ මවක් නොකඩවාම දොන් බොස්කෝ දේහය සමඟ යැදුමේ නිරත විය. ඉන්පසුව ඇය තම ලේන්සුව ගෙන දොන් බොස්කෝ ශුද්ධවූ දේහය අඩංගු මංජුසාවේ ස්පර්ශ කර එය රෝහල වෙත ගෙන ගොස් තම දියණිය නිදා සිටි කොට්ටය යටින් තැබීය. දෙව් වරප්‍රසාදය ගලා ආ මෙවන් කුඩා විශ්වාසයකින් සිදුවූයේ මහත් ප්‍රාතිහාර්යයකි. ඒ දැඩි ලෙස රෝගාතුරව සිටි තම කුඩා දියණිය සම්පූර්ණ සුවය ලබා, මවටත් පෙර අවදි වී පවසා ඇත්තේ, “අම්මේ, මට දැන් හොඳටම හොඳයි.... අපි ගෙදර යමු..” යන්නයි.

ශුද්ධවූ ජෝන් බොස්කෝ මුනිඳුන් තම ජීවිතයේ සෑම ක්‍රියාවක්ම දේව බලය තුළ සිදුකළ අතර ඒ සෑම ප්‍රාතිහාර්යයක්ම පිටුපසින් අත්දුටුවේ දේව අම්මාගේ රැකවරණයයි. ඉන්දියාවේ __නාගලැන්ඩ්__ හි ක්‍රිස්තු රජාණන්ට කැප කර ඇති දේවස්ථානයේ දිව්‍ය යාගයට සහභාගි වූ එක් තරුණයෙක් යාගයට පසුව තම ජංගම දුරකථනයෙන් එම දේහය අඩංගු මංජුසාව ඡායාරූපගත කරන ලදි. පුදුමයකි! එම දේහය පිටුපසින් ඒ අවස්ථාවේ කිසිවකුට යැමට නොහැකි නමුත් ජංගම දුරකථනයේ ඡායාරූපයේ නිල් පැහැති වස්ත්‍රයක් ඇඳගත් දීප්තිමත් ආලෝකයකින් බැබැළෙන ස්ත්‍රියක් දේහය දෙස බලමින් සිටි අයුරු ඉතා පැහැදිලිව දැකගත හැකිවිය. මේ ස්ත්‍රිය කවුරුන්දැයි දන්නෝ දනිති....

★ මේ __ඉන්දියාවෙන්__ වාර්තා වූ තවත් එක් ප්‍රාතිහාර්යයකි. දොන් බොස්කෝ තුමන්ගේ ශුද්ධවූ දේහයේ තවත් ඡායාරූපයක දැකගත හැක්කේ ඉතා භයංකාර වූත් පුදුම සහගත වූත් දර්ශනයකි. එනම්, දොන් බොස්කෝ දේහය ඉදිරිපිට දණගසා තනිවම යාච්ඤා කරමින් සිටි දරුවකු වෙත (එම දරුවාට ආශිර්වාද කිරීමට මෙන්) දොන් බොස්කෝ මුනිඳුන්ගේ දේහයේ දකුණු හස්තය තරමක් ඉහළට එසැවී ඇති ආකාරයයි.

★ __පිලිපීනයේ, චේබු__ ප්‍රාන්තයේ සිදුවීමකි. “දොන් බොස්කෝ” නම දරා සිටි තරුණ සමාජයක සාමාජිකයින් 40 දෙනෙක් පමණ දෙනා තම වාර්ෂික ඥානකාන්තිය සඳහා ගමන් කිරීම ආරම්භ කර ඇත්තේ ක්‍රිස්තියානින්ගේ පිහිටේ මෑණියන්ගේත්, දොන් බොස්කෝ මුනිඳුන්ගේත් මැදිහත්කම ප්‍රාර්ථනා කිරීමෙන් අනතුරුවයි. මොවුන් ගමන් ගත් මාර්ගය හෙල්, පර්වත, කඳු බෑවුම් වලින් බහුල වූ අනතුරුදායක මාර්ගයක් වූ අතර බස් රථය ද ඉදිරියට ඇදුනේ ඉතා ප්‍රවේශමෙනි. නමුත්, එක් මොහොතක පාරෙන් පිටතට හැරවුණු මෙම බස් රථය අඩි 500 ක් පමණ අගාධයකට ලිස්සා ගියේය. නමුත් සිදුවූයේ විශ්මයකි... තරුණයින් 40 දෙනෙකු සිටි මෙම විශාල බස් රථය නැවතුනේ අඟල් 10 ක්වත් වට ප්‍රමාණයක් නැති කුඩා පයින් වර්ගයේ ගසකට හේත්තු වීමෙනි. එතැනට රැස්වූ ගම්වාසීන්ගෙන් ඔවුන්ට අසන්නට ලැබුණේ තවත් පුදුම කතාවකි. ඒ මෙවන් පයින් වර්ගයේ ගසක් මේ ස්ථානයේ තිබූ වක් ඔවුන්ට මතක නැති බවයි. (ඇත්තෙන්ම “බොස්කෝ” යන්නෙහි අර්ථයත් “ඇව හෝ ඇව බිමක්” යන්නයි.)

★ __මොන්ටෙ මාඤ්ඤො නගරය__ දොන් බොස්කෝ තුමන්ට ඉතා පුරුදු නගරයකි. මන්ද එහි මංගල්‍යය දිනයන්හි දිව්‍ය පූජාවන් පැවැත්වීමට උන්වහන්සේට අවුරුදු ගණනාවක්ම භාර වූ නිසයි. එසේ වූයේ එක් විශේෂ හේතුවක් නිසාවෙනි. දොන් බොස්කෝ මෙම නගරයේ වැඩ ආරම්භ කිරීමටත් පෙර එහි වූයේ දැඩි නියඟයකි. නමුත් තම ප්‍රථම දිනයේ දීම දේව වරප්‍රසාදයේ පෙර නිමිත්තක් වශයෙන් දොන් බොස්කෝ තුමන් පවසා ඇත්තේ මංගල්‍යය දිනයේ දී එම නගරයට වර්ෂාව ලැබෙන බවයි. එය එසේම සිදුවිය.

එපමණක් නොව, මෑතක දී දොන් බොස්කෝ දේහය එම නගරයට ඇතුළුවන සමයේ දීත් මොන්ටෙ මාඤ්ඤො හි පැවැතියේ දැඩි නියඟයකී. නමුත් දේහය වැඩම කළ දින පැවති දිව්‍ය යාගය වේලාවේ සියලු දෙනාම අත්දැක්කේ එදා දොන් බොස්කෝ ජීවත්ව සිටි කාලයේ දී වූවාක් මෙන් ප්‍රාතිහාර්යාත්මක මහා වර්ෂාවකි.

★ __ඉතාලියෙන්__ වාර්තා වූ තවත් සිදුවීමක් නම් අවුරුදු 3 ක කාලයක් එක්තැන්ව සිටි අසාර්ථක වූ ව්‍යාපාරකියකුගේ කතාවකි. මොහු දොන් බොස්කෝ තුමන්ගේ ශුද්ධවූ දේහය ලොව පුරා ගෙන යැමට හැකි අයුරින් දායක වූ අයෙකි. නමුත් ඔහුගේ කණගාටුවට කරුණ නම් ඔහුගේ අසාර්ථක වූ ව්‍යාපාරයන් නිසා සිතූ පරිදි ඔහුට දායක වීමට නොහැකි වීමයි. ඔහු එක්තැන්ව සිටිය දී අත්දුටුවේ ද තම මර්ධන ක්‍රියා තුළින් තම පව්වලට පශ්චත්තාපයයි. විශ්මයකි! 2009 ජනවාරි 31 වන දින මොහුට සම්පූර්ණ සුවය ලැබුණු අතර දොන් බොස්කෝ තුමන්ගේ ශ්‍රී දේහය සියැසින් දැක බලා ගැනීමේ භාග්‍ය ඔහුට උදාවිය.
“මටත් ප්‍රාතිහාර්යයක් අත්දකින්නට ඇත්නම්!” මේ ඔබේත් මගේත් පරම බලාපොරොත්තුවකි.

**එම්. මංජුල ප්‍රියන්ත දො.සැ.නි. පියතුමා**
දංකොටුව, දොන් බොස්කෝ දෙව්සත්හල

# දොන් බොස්කෝ ස්ප්‍රීතුව තුළින් ජනතාවට මාංගෙ



## ප්‍රාදේශියාධිපති අතිගරු නිහාල් ලියනගේ පියතුමා

**★ ශ්‍රී ලංකාවට දොන් බොස්කෝ පියතුමා තවම ආගන්තුකයි! එතුමා පිළිබඳ එතරම් අවබෝධයක් සැදැහැවතුන් අතර නෙමැති. ඉතිං ඒ පිළිබඳව ඔබවහන්සේගේ අදහස ප්‍රකාශ කළොත්?**

ඒක ඇත්තක්, ශ්‍රී ලංකාවට සැලේසියාන සේවාව ආරම්භ කරලා වසර 56 ක් වුනාට තවමත් දොන් බොස්කෝ මුනිතුමා ශ්‍රී ලංකාවට ආගන්තුකයි. ක්‍රි.ව. 1815 අගෝස්තු 16 වන දින ඉතාලියේ ටියුරින් නුවර බෙක්කි ග්‍රාමයෙන් උපත ලබා වයස අවු. දෙක හමාරක් වෙද්දී පියාගේ රැකවරණය අහිමි වන මේ කුඩා ජෝන් බොස්කෝ ට තිබූ එකම රැකවරණය තම අම්මා වූ මාග්‍රට් තුමියයි. එතුමියවත් අද ශු. සභාවේ භාග්‍යවන්තියක් බවට පත්කර තිබෙනවා. දුප්පත්කම සහ ආර්ථික දරිද්‍රතාව කරපින්නා ගත් මේ කුඩා ජෝන් හට පාසල් යාමට තරම් වත්කමක් තිබුණේ නැහැ. ඒ නිසා ම එතුමා මේ ඉගෙනීම සිදුකළේ ස්වෝත්සාහයෙන්මයි. වයස අවු. 09 දී තමන් දුටු සිහිනයකින් තම කැඳවීම තේරුම් ගත් මේ ජෝන් බොස්කෝ ඒ අනුව තමන්ගේ දිවි සකසා ගත්තා. දේව කැමැත්තට හිස නැමුවා. එතුමන්ගේ ජීවිතයේ එකම හා ප්‍රබල සහකාරිය වූයේ ක්‍රිස්තියානින්ගේ පිහිටාධාරය වන මරියෝත්තමාවන් ය. නොයෙකුත් කරදර බාධක මධ්‍යයේ පවා කෙසේ හෝ අධ්‍යාපනික කටයුතු හදාරා ක්‍රි.ව. 1841 ජූනි 05 වන දින එතුමා පූජකවරය ලබා ගත්තා. ඒ වසරේ ම දෙසැම්බර් 08 වන දින බර්තොලමියු ගරෙල්ලි නම් යෞවනයා තුළින් ඇරඹි යෞවන ආත්මයන් ගලවා ගැනීමේ සේවාව ලෝකය පුරා අද සැලේසියාන නිකාය තුළින් රටවල් 130 ක ව්‍යාප්ත වී තිබෙනවා. දොන් බොස්කෝ තුමා මේ නිකාය ආරම්භ කිරීමේ මූලික අරමුණ වූයේ ආත්මයන් ගලවා ගෙන, ඔවුන් සුමඟට ගැනීමයි. වඩාත් සරල ලෙස කීවොත් ජේසු සමිඳුන් වෙතට පාපිෂ්ඨ යෞවන ජීවිත ළං කරලීමයි.

**★ සැලේසියාන නිකායේ මූලික ස්ප්‍රිතුව හා කරිස්මාව පිළිබඳ යමක් සඳහන් කළොත්?**

ඔව්, පෙර සඳහන් කළ පරිදි, දොන් බොස්කෝ තුමා ජීවත් වූ අවධියේ යෞවන ජීවිත, විරැකියාව, දරිද්‍රතාවය නිසා පාපයට යොමුව තිබූ කාල පරිච්ඡේදයක් වුණා. මේ නිසා ම ශු. පිලිප්නේරි මුනිතුමාගේ ආදර්ශ පාඨයක් උපයෝගී කර ගත්තා. ඒ “දුවන්න, පනින්න, නටන්න, ගයන්න, වයන්න, රඟන්න... එහෙත් පවු නොකරන්න... අන් සියල්ලක්ම ඔබ ගන්න... ආත්මයන් පමණක් මට දෙන්න” කියලයි. දොන් බොස්කෝ මුනිතුමාට අවශ්‍ය වුණේ ආත්මයන් දිනාගෙන ඔවුන් සමිඳුන් වෙත ළං කරලීමටයි. මෙහි දී මරිය වහන්සේගේ රැකවරණයෙන් හා අභීත විශ්වාසයෙන් මේ කාර්යයට එතුමාණන් අත ගැසුවා. එතුමාගේ ජීවිතය පිළිබඳව අධ්‍යයනය කළාම අපට දැකගත හැකි වන්නේ එතුමන්ගේ සහකාරිය වුණේ මරියෝත්තමාවන්මයි. ඒ අනුව ක්‍රි.ව. 1874 අප්‍රියෙල් 4 වන දා ශු. සභාවේ අනුමත පැවිදි නිකායක් ලෙස ආරම්භ වූ සැලේසියාන නිකායේ මූලික කරිස්මාව හෙවත් ස්ප්‍රිත්තුව වන්නේ යෞවන ජීවිත සුමඟට ගැනීමටයි. මේ නිසාම අද ලෝකයේ සැලේසියාන නිකාය සතුව ආයතන රාශියක් පවතිනවා. විශේෂයෙන් විරැකියාව, සමාජ විරෝධී ක්‍රියාවල නිරත වූවන් ඉන් මුදවා ගෙන, කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුවක් තුළින් සමාජයට වැඩදායී පුරවැසියන් බවට පත් කරන්නටත් එමඟින් සමාජයට වැඩදායී තරුණ පරපුරක් දායාද කරන්නටත් උත්සාහ ගන්නවා. එකී සේවාව අගය කිරීමක් ලෙස 1988 2 වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා දොන් බොස්කෝ තුමාව තරුණයන්ගේ පියා, හා ගුරුවරයා බවට පත් කළා.

**★ දොන් බොස්කෝ මුනිතුමාගේ ශු. ධාතු ශ්‍රී ලංකාවට ගෙන ඒමේ මූලික අරමුණ කුමක් ද?**

ඔව්, වැදගත් ප්‍රශ්නයක්. මෙහිදී ශු ධාතුවක් කියන්නේ ශුද්ධවන්තයෙක් හෝ ශුද්ධවන්තියකගේ නොදිරා පවතින ඇට කටු, පරිහරණය කරන ලද දේ විය හැකිය. මෙමගින් මූලිකව ම කෙරෙන්නේ ඒ ඒ ශුද්ධවන්තයින්ගේ ශු. ධාතු තුළින් දෙවිඳුන්ට තුති ප්‍රශංසා කිරීම මිස ඒ ඒ පුද්ගලයන් මහිමයට පත් කිරීම නොවේ. ශ්‍රී ලංකාවට දොන් බොස්කෝ මුනිඳුන්ගේ අස්ථි ධාතුවක් සහිත මංජුසාව මේ මස 19 වන දා වැඩම කරනවා. එහි මූලික අරමුණ දොන් බොස්කෝ මුනිතුමා ඉපිද 2015 අගෝස්තු 16 වන දාට අවුරුදු 200 ක් පිරෙනවා.

ඒ වගේ... ආරම්භ... සම්පූර්... ම ලෝක... ව්‍යාප්ත... සේවාව... අවධාන... දොන්... දැනගෙ... කිරීමට... දොන්... ජනතාව... මෙහිදී අ... ලැබෙන...

19 වන... සිට ලං... දොන්... පුරා දින... 09 කට... අප්‍රිකාවේ...

**★ ලංකා... කළොත්?**

ක්‍රි.ව. 19... න් ආර... අද වන... සැලේසි... කරනවා. ඇති ස... හෝටල්... නිවාස... තුළින් ක්‍රි... ජාති හෙ... ලෙස... මේ බෙ... යුද්ධයෙ...

# ශ්‍රී ලංකාවට වැඩම කරන ශු. ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ "ශ්‍රී ධා

**ශු. ධාතුවක් යනු කමක් ද?**

ශුද්ධවූ ධාතුවක් යනු, ආගමික වශයෙන් ගෞරවාදරයට පාත්‍ර වූ වස්තුවකි. එය සාන්තුවරයකුගේ ශරීරයේ කොටසක සිට ඔවුන් විසින් ස්පර්ශ කරන ලද දෙයක් වැනි ඔවුන්ගේ ජීවිතය සම්බන්ධ වූ ඕනෑම දෙයක් විය හැකිය.

**ශු. ධාතූන් පිළිබඳව අප දැනගත යුතු ඓතිහාසික කරුණු**

★ ධාතූන් පිළිබඳව ප්‍රථමයෙන්ම සඳහන් වන්නේ පැරණි ගිවිසුමේ 2 රාජාවලිය 13:20-21 හිය. එහි සඳහන් පරිදි මිනිසුන් පිරිසක් මිනියක් වැළලීමට සැරසෙන කල හමුදාවක් දැක බියවී, එම මිනිය එලීෂාගේ සොහොන් ගැබ තුළ එම මිනිය දැමූහ.
★ ස්නාවක ජුවාම් තුමා ප්‍රාණ පරිත්‍යාගි වූ අවස්ථාවේ එතුමාගේ ශරීරයේ වූ කොටස් ගෞරව කිරීම සඳහා රැගෙන ගිය බව සඳහන් වේ.
★ 2 වන සියවසේ පොලිකාප් තුමාව, පුළුස්සා මරා දමන ලද අවස්ථාවේ දී උන්වහන්සේගේ අනුගාමිකයන් විසින් එතුමාගේ අස්ථි කොටස් ආරක්ෂිත ස්ථානයකට ගෙන ගොස් ගෞරව දැක් වූ බව.
★ කිතුනු පීඩන සමයේ ප්‍රාණ පරිත්‍යාගිවරුන්ගේ ශරීර කොටස් පුරාණ රෝමයේ “කැටකුම්” යන ස්ථාන වල තැන්පත් කර එහි දිව්‍ය පූජාව පැවැත්වූ බවද, පසුව එම ශු. ධාතූන් අල්තාරය මත තැබීමේ සංස්කෘතියක් බවට ද පත්විය.
★ ඉන්පසු නව ගිවිසුමේ ක්‍රියා පොතේ සඳහන් ආකාරයට ධාතූන් වල විශේෂත්වය පෙන්නුම් කරන්නේ ශු. පාවුළු තුමා පරිහරණය කරන ලද ලේන්සු වුවද, ස්පර්ශ කළ විට මළවුන් උත්ථාන වූ බව ද, යකුන් දුරුවූ බව ද, විවිධ ලෙඩරෝග සුව වූ බව ද එහි සඳහන් වේ.

**ශු. ධාතුවක් මඟින් පිළිබිඹු වන්නේ,**

ශුද්ධවන්තයන්ගේ පවිත්‍රභාවයත්, ඔවුන් තුළ දේව කැමැත්ත සඵල වූ අයුරුත් විද්‍යාමාන කෙරෙයි. එසේ විද්‍යාමාන වූ මුනිවරයකු ලෙස ශු. ජෝන් බොස්කෝ මුනි තුමාව මුළු ලොව තුළ ප්‍රකට විය. එතුමාගේ ශ්‍රී ධාතූන් රැගත් ප්‍රතිමාව රටවල් 130 ක බැහැදැකීමේ වන්දනා ගමනක යෙදෙන අනතර එය, 2011 නොවැම්බර් 19 වන දා අප ලක්බිමට සැපත් වේ. ශ්‍රී ලංකාවේ සැලේසියාන නිකායට අයත් සියලුම දොන් බොස්කෝ ආයතන වලට සහ විශේෂ ස්ථාන වලට ශු. ධාතූන් රැගත් මංජුසාව තැන්පත් කර ඇති ප්‍රතිමාව අති උත්කෘෂ්ටවත් අයුරින් හා ගෞරව බුහුමානයෙන් යුතුව අප රට තුළ මහා ජනතාවගේ ප්‍රදර්ශනයට පාත්‍ර වෙති. මෙය අප ලද මහත් භාග්‍යයකි. විපුල වරප්‍රසාදයකි. අපි මෙම ගමනේ පංගුකාරයෝ ද, සාක්ෂිකාරයෝ ද වෙමු.

මුළු ලොව පුරා විසිරී සිටින තරුණ තරුණියන් වෙනුවෙන් මහගු මෙහෙවරක් ඉටු කරන සැලේසියාන නිකායට අති දැවැන්ත වූ වසර 150 ක් සපිරෙන මේ මහා මංගල අවස්ථාව සහ ශු. ධාතූන් රැගත් මංගල බැහැදැකීමේ සංචාරයක වන්දනාව ආරම්භ වූයේ 2009 ජනවාරි 31 වනදා යිනි. (1859 - 2009 දක්වා) මෙලෙස ශු. ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ ශු. ධාතූන් ලොව වටා රැගෙන යාමේ අරමුණ වන්නේ, 2015 අගෝස්තු 16 වන දිනට යෙදෙන ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ 200 වන ජන්මෝත්සවයට අප සැම සූදානම් කරනු සඳහා ද, මුළු ලොව කිතුනුවන්ට උන්වහන්සේට ගෞරව කිරීමට අවස්ථාවක් සලසා දීමට ද තම ජීවිත නැවත නැවතත් දෙවිඳුන් වෙතට ළං කර ගැනීමට අවස්ථාවක් සලසා දීමට ය.

**ශ්‍රී ධාතූන් බහාලූ ප්‍රතිමාවන් නිර්මාණය වූ සැටි**

1929 දී ජෝන් බොස්කෝ මුනිඳුන්ව භාග්‍යවරයට එසැවීමට පෙර උන්වහන්සේගේ ශ්‍රී දේහය ඉටිවැස්මකින් ආවරණය කරන ලදි. එසේ කළේ භාග්‍යවරයට ඔසවන මොහොතේ එයට සහභාගි වීම සඳහා “වොල්දොක්කෝ” නගරයට සපැමිණි මහ ජනතාවගේ ගෞරවාදරයට හා ප්‍රසාදයට පාත්‍ර වීම සඳහා ය. 1934 දී උන්වහන්සේව ශුද්ධවරයට ඔසවන්නට පෙරත්, සොහොන් ගෙය විවෘත කර ශ්‍රී දේහය මහ ජනතාවට ප්‍රදර්ශනය කරන ලදි. ඉන්පසු මේ ලත් ගෞරවාදරය දිගටම තබා ගැනීම සඳහාත්, තරුණ දූ පුතුන් දෙවියන් වහන්සේ වෙතට සමීප කරවීම සඳහාත් නව ධාතු මංජුසාවක් නිර්මාණය කරන ලදි. පසු කාලීනව 2006 දී රෝමයේ ක්‍රිස්තියානි පිහිටාධාර මෑණියන්ට කැප කළ බැසිලිකාවේ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමත් සමඟම කෘත්‍රිම ෆයිබර් ග්ලාස් උපයෝගී කරගනිමින් ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ ප්‍රතිමා 2 ක් නිර්මාණය කරන ලදි. පළමු ප්‍රතිමූර්තිය සඳහා බොස්කෝ මුනිඳුන්ගේ සෑම අස්ථියක්මත්, ඇටකටුවක්මත් බහා තැන්පත් කළ අතර, දෙවන ප්‍රතිමූර්තිය තවත් වීදුරු මංජුසාවක දමා ටියුරින් නුවර පිහිටි ක්‍රිස්තියානි පිහිටාධාර මෑණියන්ගේ බැසිලිකාවේ අල්තාරය මැද උන්වහන්සේගේ දකුණු හස්තයේ අස්ථි හා පටක කොටස් තැන්පත් කළහ.

ලොව පුරා වන්දනා ගමනක යෙදෙන්නේ මෙම ශු. ධාතූන් වීම විශේෂයකි. එනමුත් මෙය සෑම රටකටම ගෙන යැමට අවසර නොමැති බැවින්, එවන් රටවල්වල සංචාරය කිරීම සඳහා ජෝන් බොස්කෝ මුනිතුමන් තරුණයන් පිරිවරා සිටින ප්‍රතිමාවක් නිර්මාණය කළහ. බොස්කෝ මුනිඳුන්ගේ දකුණු හස්තය සහ බාහුව මුද්‍රා තබා සහතික කර ශු. ධාතූන් තැන්පත් කිරීම සඳහා රිදී භාජන 2 ක් ද උපයෝගී කර ගතී. ඉන්පසු මේ සියල්ල එක්කොට කතෝලික සභාවේ ශු. ධාතූන් පිළිබඳ සම්මත නීතිරීති අනුව පූජනීය මුද්‍රාව ද තබනු ලැබීය. එසේ මුද්‍රා තබන ලද “ශ්‍රී හස්තය” අඩංගු ශ්‍රී මංජුසාව ෆයිබර් ග්ලාස් වලින් නිර්මාණය වූ ජෝන් බොස්කෝ මුනිතුමන් තරුණයන් පිරිවරා සිටින 3 වන ප්‍රතිමූර්තිය තුළ තැන්පත් කරන ලදී.

**ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ ධාතූන් රැගත්, කුටියේ තතු**

★ උන්වහන්සේගේ කරිස්මාව ද, “මිහි අනිමාස් වෙතේරා තොල්ලේ” හෙවත් “ආත්මය පමණක් මට දෙන්න අන් සියල්ල ඔබ ගන්න” යන පාඨය සඳහන් වීම.
★ සැලේසියාන පවුල ව්‍යාප්ත වී ඇති රටවල ලෝක සිතියම
★ තරුණ තරුණියන්ගේ මුහුණු ඔබ්බවා තිබීම
★ පාදවල 1815 හා 2015 යන වර්ෂයන් සඳහන් වීම

ලොව පුරා මහත් ආදරයට පාත්‍ර වූ ශු. ජෝන් බොස්කෝ මුනිඳුන්ගේ නිර්මාතෘ වූ සැලේසියාන සංඝයේ මහා මංගල්ලය සමරන්නට අපිදු සැදී පැහැදී සිටිමු. එයට සහභාගි වී පූර්ණඵල ලබා ගනිමු. මේ වන විට ලොව පුරා විවිධ වූ වැඩසටහන් මඟින් භක්ති අභ්‍යාස මඟින්, සැමරීම් මඟින්, ජය ඝෝෂාවන් මඟින් තම උත්තරීතර වූ ආදර ප්‍රශංසාව,

කලා සංග්‍රහය



# අපෙන් සමුගත් ටයිටස් තොටවත්ත

ටයිටස් තොටවත්ත අග්‍රගණයේ සිනමා වේදියෙකි. රූපවාහිනී සේවාව මෙරටට පැමිණියාට පසු ඔහු අග්‍ර ඝනයේ රූපවාහිනී වේදියෙකු බවට ද පත්විය. ඔහු සමකළ හැක්කේ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පිරිස් ශූරීන්ට පමණි. ඒ ක්ෂේත්‍රයේ ටයිටස්ට සම කිරීමට අන් කිසිවෙක් නොසිටියහ. දෙදෙනාම ශාස්ත්‍රය මනාලෙස හැදෑරූ අය වූහ.

ටයිටස් තොටවත්ත ශූරීහු ද, ලෙස්ටර් ජේම්ස් පීරිස් ශූරීන් මෙන්, ඉතාමත්ම නිහතමානී, එමෙන්ම ඉතාමත්ම නිහඬ අයෙක් වූහ. එය මා පෞද්ගලිකවම වටහා ගත් තරුණකි. ඔහු සමඟ මාද වසර පහක් ජාතික රූපවාහිනියේ සේවය කළ නිසාය.

ටයිටස් තොටවත්ත මට මුලින්ම හමුවුයේ, ඔහු 'මරුවා සමඟ වාසේ' චිත්‍රපටිය අධ්‍යක්‍ෂණය කළ අවධියේ දී ය. මම 'මරුවා සමඟ වාසේ' චිත්‍රපටියේ ලංගම බස් රියැදුරාගේ චරිතය නිරූපනය කළෙමි. මා නිසාම ඔහු චිත්‍රපටියේ දෙබස් අතරට හාස්‍ය ජනක කොටසක්ද එකතු කළේය. එය මෙසේ විය.

මා පදවන බස් රථයේ කොන්දොස්තර ඇනස්ලි ඩයස් ය. මගීන් අතරෙහි විජය කුමාරතුංග (මරුසිරා) විමල් කුමාර් ද කොස්තා, බී. එස්. පෙරේරා, සැමුවෙල් රුද්‍රිගු හා බර්ටි ගුණතිලක ද වෙති. බසයට මගීන් ගොඩවෙත්දී කවුදෝ හදිසිකාරයෙක් බසයේ සීනු ලනුව ඇදීය. මම බස් රථය ඉදිරියට ගත්තෙමි. කොන්දොස්තර නැතැයි කවුදෝ කෑගැසීය. ම ක්ෂණිකවම තිරිංග තදකොට රථය නැවැත්වූයෙමි.

'කවුද යකෝ බ්‍රේක් ගහන්නේ? මගියෙක් (සැමුවෙල්) කෝපයෙන් අසයි.

මම රියැදුරු අසුනේම සිට පිටුපසට හැරෙමින්

"බ්‍රේක් ගහන්නෙ? ඕයි. බ්‍රේක් ගහන්නේ මම, ඩ්‍රයිවර්! ඇයි මොකෝ?"

සැමුවෙල්: ආ ඩ්‍රයිවර් උන්නැහෙ නම් කමක් නැහැ තැන්ක් යූ!

ටයිටස් තොටවත්ත නිහඬ පුද්ගලයකු වුවත්, පහත් හඬින් දෙපැත්ත කැපෙන විහිළු කීමට ගජ හපනෙකි. ඔහු මාගේ විහිළුද අගය කළේය.

අප දෙදෙනාම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවයට බැඳුනේ එකම අවධියේ දී. ඔහු බැඳුනේ 1982 දී ය. මා සම්බන්ධ වූයේ 1984 දීය. ඔහු ජාතික රූපවාහිනියේ හඬ කැවීම් අංශය 1984 දී ආරම්භ කළේය. පිලිපීනයේ වෙරිටාස් ගුවන් විදුලියේ වසර හතක සේවය නිමාකොට ආපසු මව් රටට පැමිණි මම ජාතික රූපවාහිනියේ සිංහල ප්‍රවෘත්ති ප්‍රකාශනයේ සංස්කාරක තනතුරු භාරගතිමි. පණ්ඩිත ගුණපාල සේනාධීර මහතා සේවයෙන් සමුගැනීම නිසා සිංහල ප්‍රවෘත්ති සංස්කාරක තනතුර පුරප්පාඩුවී තිබුනි. ටයිටස් තොටවත්ත හා මා අතර පිළිසඳරයන් බොහෝ විට සිදු වූයේ ජාතික රූපවාහිනියේ ආපන ශාලාවේ දී ය. එනම් කැන්ටිමේදීය.

ටයිටස්ගේ සෙවනැල්ල මෙන්, නැතහොත් දකුණු අත මෙන් සිටියේ අතුල රන්සිරි ලාල් (එවකට තරුණ) මහතාය. දැන් අතුළ, හඬ කැවීම් අංශයේ අධ්‍යක්‍ෂ වශයෙන් කටයුතු කරයි. හඬ කැවීම් අංශයට හැම අතින්ම, අංගසම්පූර්ණ හඬ කැවීම් ශිල්පාගාරයක් අයත්ය. ඒ සඳහා ටයිටස් ඉල්ලූ හැමදෙයක්ම එවකට සිටි සභාපති එම්. ජේ. පෙරේරා මහතා කෙසේ හෝ ලබා දුන්නේය. මෙරට රූපවාහිනී හඬ කැවීම් කලාවට නව පණක් ලබාදුන්නේ, ටයිටස් තොටවත්තයැයි කිවහොත්, එය අතිශෝක්තියක් නොවේ. එම හඬ කැවීම් කටයුතු වලටත් ටයිටස් තොටවත්ත මා තෝරා ගත්තේය. මා වැඩි වශයෙන්ම සම්බන්ද වූයේ 'මල්ගුඩි දවස' නාට්‍ය මාලාවේ හඬ කැවීම්වලටය.

වැඩසටහන් සංස්කරණය කිරීමේදී ඔහු දැක්වුයේ මහත් ප්‍රවණතාවයකි. ඔහු සංස්කරණය කළ චිත්‍රපටි සංඛ්‍යාව පහලොවකි. රේඛාව, සංදේශය, රන්මුතු දූව, සාරවිට, සැනසුම කොතැනද හා පරසතුමල්, ඊට ඇතුලත්ය. ටයිටස් තොටවත්ත අධ්‍යක්‍ෂණය කළ චිත්‍රපටි ගණන දහ හතරකි. ජාතික රූපවාහිනියේ හඬ කැවීම් අංශය මඟින් ළමා රසික රසිකාවියන්ට ටයිටස් තොටවත්ත ශූරීන් ගෙන් ඉටු වූ සේවය ද ඉමහත්ය. පිස්සු පූසා, දොස්තර හොඳ හිත, ලා තණකොළ පෙත්තා, බෑ කියන්න බෑ, ගලිවරයන්ගේ සුවිසැරය, ඇලඩින් සහ පුදුම පහන ආදිය අපට අමතක නොවේ.

පසු ගිය කාලවල විකාශය වූ ඉන්දියානු ටෙලි නාට්‍යවලට හඬ කැවීමෙහි යෙදුනු බොහෝ ශිල්පීහු ටයිටස් තොටවත්ත ගෙන් ආභාෂය හා පුහුණුව ලත් අය වූහ. හඬ කැවීම රඟපෑමට වඩා අපහසු කාර්යයකි. රඟපෑමට වඩා හැකියාව පෙන්වීමකි. එතැනදී සිදුවන්නේ පිටපත අනුව හැඟීම් ගැනීම නොව, පින්තූරයේ හැඟීම්, තොල් චලනයට අනුව කටහඬ හා උච්චාරනයට ගලපා ගැනීමය. එම හැකියාව ටයිටස් තොටවත්තයන් අපට ඉතිරිකර ගිය දායාදයකි.

**ඇල්ප්‍රඩ් පෙරේරා**

ෆිලීෂන් අබයකෝන්ගේ

# සුබස 187

## විකෘත හා විකෘති

තරණය (එගොඩවීම) ජනනය (ඉපදවීම) වශයෙන් සංස්කෘත භාව කෘදන්ත හෙවත් ක්‍රියා නාම රාශියක් සිංහලේ ව්‍යවහාරවේ. ශ්‍රමදානය (මහන්සිය දීම) නාම පදයකි. පූජාත්වරය දානය කරනවා, විවේචනය වෙනවා යන තැන්වල කරයි, වෙයි යන අප්‍රධාන ක්‍රියා සමඟ කෘදන්ත ක්‍රියාර්ථයක් දෙයි. ඇන ගැසුම් කයි, දැනුම් දෙයි, ඇලුම් කරයි ආදියත් මෙවැනි ය.

දීප්ත, කාන්ත, පුෂ්ට ආදි සමහර කෘදන්තවලින් දීප්ති, කාන්ති, පුෂ්ටි ලෙස නාම පද බිහිවේ. ගුවන් ගත (අහසට ගිය) විස්මිත, බද්ධ ආදි අතීත කෘදන්ත බෙහෙවින් භාවිතයේ පෙනේ. ඒවා රංජිත වේ, විකසිත වේ පරිදි ක්‍රියා ලෙසත්, පූජිත චරිත, පීඩිත ජනයා පරිදි විශේෂණ ලෙසත් දුටුව ද ජනිත/ පෝෂිත කරයි, ප්‍රසිද්ධ/ ශුද්ධ කරයි වශයෙන් ක්‍රියාවට නැගෙන්නේ අඩුවෙනි.

කරණය - කෘත - කෘතිය. විකාරය - විකෘත - විකෘතිය, සංස්කරණය - සංස්කෘත (සැකසුණු) - සංස්කෘතිය, දර්ශනය- දෘෂ්ට - දෘෂ්ටිය - ක්ෂමාව - ක්ෂාන්ත - ක්ෂාන්තිය පරිදි දෙවිධියකින් නාමපද නිපදිණු පෙනේ. මාතෘ භාෂාවේ විකාර හා විකෘත සමානාර්ථ වුව ද අද සිංහලේ විකාර කරයි හා විකෘත කරයි වෙනස්ය. සිද්ධි, හීති, අවනති ආදි කෘදන්ත නාම පද වෙයි/ කරයි යන ක්‍රියා හා නොයයි.

1942 සිට මාටින් වික්‍රමසිංහ සූරීන්ගේ අපේ ගමේ කීපපළක ප්‍රීති වේ කියා නිවැරදිව පෙනේ. එහෙත් අද අලුත් සංස්කරණවල ප්‍රීති වේ කියා මහා ප්‍රාඥයාගේ මුල් කෘතිය විකෘත වී ගොසිනි. නොදන්නවුන්ගේ වැඩකි.

"විකෘතවූ මනස, විකෘත කළ හඬ පටය, මනෝ විකෘතිය පළවුණේ සම්මුඛ සාකච්ඡාවේ විකෘතියකි." ලෙස නිදොස්ව භාවිත විය යුතුය. විකෘත ක්‍රියා පදයක්වද විකෘති නාම පදයක්ව ද යෙදුමට සිත තබාගත යුතුය. මේ කරුණ හරිහැටි නොවැටහීමෙන් සමෘද්ධ (දියුණුවූ) ප්‍රසූත (වැදූ) ව්‍යාප්ත (පැතුරුණු) යන වචනවලටත් මේ දෝෂය ව්‍යාප්ත වී පවතියි.

(රුක්මණී දේවිය මියගොස් තුන්තිස් වසරක් පිරීම නිමිත්තෙනි 1978-2011)

# ඔබගේ වෙන්වීම සිහිනයක් සේම පවතීවා!

මල් පරවූ පසු සුවඳ ගිලිහී යන්නේය. සඳ බැස ගිය පසු සිහල වියැකී යන්නේය. නමුදු මිනිසුන් අතර ජීවත් වූ උතුම් මිනිසුන්ගේ මනුසත් සුවඳ ඔවුන් මෙලොවින් සමුගෙන ගිය ද ගියලිහී නොයන්නේය. රටකට ජාතියකට සුවිශේෂ පුද්ගලයන් පහළ වන්නේ කලාතුරකින්ය. සිංහල සිනමාවට, සිංහල සංගීතයට බිහිවූ සුවිශේෂම කාන්තා ප්‍රතිරූපය 'රුක්මනි දේවියයි' ඇය මියගියත් තුන් තිස්වසරක් ගත වුව ද ඇගේ මතකය සදාකාලිකය. සිංහල චිත්‍රපට කලාව මේ ලක් දෙරණ තුළ යම් තාක් පැවතිව ද සිංහල සංගීතය යම් තාක් අප දෙවසන් තුළ රැව් පිළි රැව් දෙන්නේ ද 'රුක්මණී දේවිය' යළි යළිත් ජීවමානව අප අතර තවමත් ජීවත්වන්නේය.





රුක්මනි දේවිය තරම් මෙරට පොදු ජන ජීවිතයෙහි ලැගුම් ගත් වෙනත් කලා ශිල්පිණියක් මෙතෙක් පහළ වී නොමැත. මනහර රුවක් ඇති තැනෙකට මිහිරි කට හඬත්, මිහිරි කට හඬක් ඇති තැනෙකට මනහර රුවක් එක්වෙතොත් ඒ පෙර පින් මහිමයෙන් මිස වෙන කිසි හාස්කමකින් නොවේ. එසේම මනහර රුවත් කන්කළු මිහිරි හඬත් ඇති තැනෙක උත්තරීතර මිනිස්, ගුණ දහම් පිහිටතොත් ඒ සැබවින්ම මේ යුගයේ පුදුමයෙනුත් පුදුමයෙකි; ඕ මවුපියන් ආරක්‍ෂා කළාය. තම සහෝදර සහෝදරියන් ගැන නිතරම සොයා බැලුවාය. මේ සියලු ගුණයෙන් එක්තැන් කළ අප අතරින් වියෝවූ රුක්මනි දේවය (ඩේසි අක්කා) ඉදිමුනු හිස් ඇති රූමත් නිලියන්ටත් මහ පොළොවේ පස් නොපාගන මහ පොළොවට අඩි හත අටකට උඩින් යන්නට සැරසෙන නළු නිළියන්ට ආදර්ශයක් ලෙසින් දෙවියන් වහන්සේ විසින් කලා ලොවෙහි නිරවත තැනත්තියක්යකැයි සිතීම කවර අතෙකින්වත් වැරදි හැඟීමක් විය නොහැකිය. 'පාලා යනු වැනි බහුරූ කෝලම්' ඇති අපේ වර්තමාන සිනමා ලොක්යේ අපේ ගායනා ලෝකයේ ඔබ නැති අඩුව මැකිය හැකි නොවේ. ඔබගේන හිස්වූ තැන පුරවන්නට නිකම්ම නොවේ. මනහර රුවත් කන්කලු හඬත් උත්තරීතර දේවත්තවයට නැකම් කිවූ මිනිස් ගුණයත් එක් තැන් කොට පුරවන්නට කිසිදා හැකිවේදැයි සිතට නොහේ. එකෙකු පාගා අනෙකා නැගි සිටීමේ කැත සිරිත් ගහන ලෝකයක රුක්මනි දේවිය වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම නියම කලා

රජිනක් බව ඔප්පුකර හමාරය. ඩේසි අක්කා තුළ පැවති පුදුම නිහතමානී පැවත්ම අපට ආදර්ශයක් මෙන්ම අප වරෙක විස්මයට පත් කරන්නක් විය.

පුරා අවුරුදු හතළිහක් ඔබ ගැයූ ගී වැයු තලයේ ආත්මය හා රැදී විශ්වය හෙළන සෝසුම රැළි හා පාවී පුනර් ගායිකාවක් ලෙසත් අපට අද ඇසෙයි. අහසද හඬා වැළපෙයි. තුන් සිංහලයේ කිසිදු ගායිකාවක් සතු නොවූ ඒ රිදී සීනු නංවන හඬ අද අපේ හදවත් වේදනාවෙන් මුසපත් කරමින් ඇසේනනේ මිහිතලයේ ශෝකය දනවන විරහ ගී රාවයක රිද්ය පරිද්දෙනි. පාළු සුළඟ පවා ළපළු පත් කොනින් පිණි කඳුළු වගුරුවයි. ඔබේ මියුරු කෝකිල ගී හඬින් මුළු මහත් ජාතියක් රසාලිප්ත ස්වර දැහැනකට සම වැදුනාහ. ගායනයත් රඟපෑමත් ඔබ තරම් දක්ෂ ලෙස උරුව කරගත් නිළියක් අප අතර තවමත් බිහිවූයේ නැත. මතුවටද බිහිවන්නෙත් නැත.

වෙනත් කිසිවකුගේ මරණයට වඩා ඔබේ මරණය තුන් තිස් වසරක් ගෙවී ගිය ද අදටත්, මතුවටත් ජීවිතේ සැමදාටමත් ඉමහත් දුකක් වීම පුදුමයට කරුණක් නොවේ. මුළු මහත් ශ්‍රී ලංකා කලා ක්‍ෂෙත්‍රයේම අප්‍රමාණ ගෞරවයට හා භක්තියටත්, අසම්භව කීර්තියටත් පත්වූ එකම කාන්තාව ඔබය. රූපශ්‍රීයත්, රඟපෑමේ හැකියාවත් ඇසුවන් වසඟ කරවන ස්වර්ණමය කටහඬකුත් එක් අයෙකුට පිහිටියේ නම් ඒ ඔබට පමණය.

කලා ලොවේ අග්‍ර ගණයේ කළා කාරිය වෙමින් ඔබ කොතැනදිත් සැම ඉරියව්වකින්ම කලාවේත් කලා කරුවන්ගේත් ගෞරවය, නම්බුව ආරක්‍ෂා කළාය. කාගේවත් ඕපා දූප කේලාම්, බොරු මුසාබස් කිසි දිනක කතා නොකළ බව ඒවාට අනුබල දුන්නේද නැත. බෙලි කපන කැපෙන ලෝකයක කිසිවෙකුගෙන් අබමල් රේණුවක් දෝෂාරෝපණයක් නොඅසා ජීවත්වීම මොනතරම් හාස්කමක් ද?

ජාත්‍යන්තර කීර්තිය ද ඇසුරු කොටගත් අපමණ ජන ප්‍රසාදය නමැති මිණිකිරුළ ජීවිත කාලය පුරාම සිරිස පැළඳ ගනෙ මෙතරම්වූ නිහතමානි මිනිසත්බව ඉක්මවා ගිය ගතිගුණවලින් පූර්ණවූ වැජඹුණ කාන්තාවක්, නිළියක්, ගායිකාවක් එතෙක් මෙතෙක් මට හමු නොවුණ බව මෙහිලා සුවිශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

ගෝනවිල මීසම් සේවක

**ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමා**

# ශාන්තසිරි හෙට්ටිආරච්චි නාමය කතෝලික ඉතිහාසයේ ලියැවී ඇත

ඥානාර්ථ ප්‍රදීපයේ ප්‍රධාන සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාගේ ආදරණීය පියාණන් වන සුප්‍රකට කවියෙක්, මාධ්‍යවේදියෙක්, ආගමික හා සමාජ සේවා ආයතනවල පුරෝගාමියෙක් වන ශාන්තසිරි හෙට්ටිආරච්චි පියාණන්ගේ අවමංගල්‍ය දේව මෙහෙය දුන්ගාල්පිටිය මග්දලාහී මරියා දෙව්මැඳුරේ පැවැතිණි.



එහිදි සැදැහැවතුන් අමතා විශේෂ ප්‍රකාශයක් කළ ගරු සෙක්ස්ටස් කුරුකුලසූරිය පියතුමා, ශාන්තසිරි මහතා මාරිස්ටෙලා විද්‍යාලයේ උසස් පෙල අධ්‍යාපනය හදාරණ අවදියේ දෙව්මව්ට නින්දිත ලෙස අපහාස වන ලෙස එතුමියගේ නිර්මල චරිතය ඝාතනය කරමින් හැටේ දශකයේ කුරුණෑගල ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් ලියනලද ග්‍රන්ථයකට දැඩි ලෙස ප්‍රහාරයක් එල්ලකරමින් සිය මිත්‍රයාවූ සනී මායාදුන්නේ සමඟ එඩිතරව පෙරට පැමිණ 'සැරය' නමින් පුවත්පතක් ආරම්භකර එම නින්දිත ප්‍රකාශනයට නින්දිත භාෂාවෙන්ම පිළිතුරුදීම නිසා එම සිද්ධිය අධිකරණයට පවා ඉදිරිපත්වූ අතර ඔවුන් දෙදෙනා සිරබාරයට ගැනීමට පවා සූදානම්වූ මොහොතේ එවකට හලාවත රදගුරු අති උතුම් එඩ්මන්ඩ් පීරිස් නි.ම.නි. මැදහත් වී දෙපක්ෂයටම පිළිගත හැකි විසඳුමකින් එම සිද්ධිය අධිකරණයෙන්ම සමතයකට පත්කර ගත් අයුරුත් අති සුවිශුද්ධ නිර්මල දෙව්මව්ට අපහාස කළ දුෂ්ඨයන්ට එරෙහිව අධිකරණයට පවා ගෙන ගිය එකම අසහාය කිතුනුවා ශාන්තසිරි බව කතෝලික ලේඛණාරක්ෂණ ගාරයේ ඉතිහාසයේ සඳහන් විය යුතු බව එතුමා ප්‍රකාශ කළේය.

ශාන්තසිරි මහතාගේ දේහය භූමිදානයට පෙර දුන්ගාල්පිටිය දෙව්මැඳුරේ පැවති දිව්‍ය යාගය එතුමාගේ ආදරණීය පුත් ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමන් විසින් සිදුකරන ලද අතර දේහය ආසිරි ගැන්වීම කොළඹ උතුරු කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමන් විසින් සිදුකරන ලදී. දිව්‍ය යාගයේ විශේෂ දේශනය ජාඇල මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියතුමන් විසින් සිදුකරන ලද අතර භූමිදානයෙන් පසු පැවැති අවමංගල්‍ය සභාව අමතා මාධ්‍යවේදීන්වන ජෝ. සංගපාලආරච්චි, සිරිල් එඩේරමුල්ල, ඇන්ටන් ජයකොඩි, නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතා ඇතුලු තවත් කීපදෙනෙක්ද කතා කළහ.

ගරු පියතුමන් හා පැවැදි සහෝදරියන් අති විශාල පිරිසක්ද අති විශාල ජනකායක්ද අවමංගල්‍ය මෙහෙයට සහභාගි වී සිටියහ.

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ, හිටපු අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස්, අති උතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිවරුන් හා කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ද දේහයට ගරු බුහුමන් දැක්වීමට පැමිණ අය අතර වූහ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාද විශේෂ ශෝක පණිවුඩයක් එවා තිබුණි. පක්ෂ විපක්ෂ මැති ඇමැතිවරු ප්‍රාදේශීය සභා, පලාත් සභා හා නාගරික මන්ත්‍රිවරු රාශියක් පැමිණ සිටියහ.

**ජෝ. සංගපාලආරච්චි**

149

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු




| | |
|---|---|
| පිපෙන පිපෙන මලක සිරිය උන්ට විතරදැයි කියන්න | යාලූවේ |
| ගැයෙන ගැයෙන ගීයෙ රසය උන්ට විතරදැයි කියන්න | යාලූවේ |
| පිදෙන පිදෙන පිදුම අයිති උන්ට විතරමද කියන්න | යාලූවේ |
| කියන කියන බයිල දිනුම උන්ට විතරමද කියන්න | යාලූවේ |
| හිතල මතල කරන එකා ඇයි ගස් | යන්නේ |
| හොයල බලල පනින එකා ඇයි රජ | වෙන්නේ |
| වැඳල පුදල නැමෙන එකා රජු | සනසන්නේ |
| කවල පොවල හදපු එකා දඩ | කරන්නේ |

ගායනය : (නයි) න (මඩම) (අ) සුබසිංහ

බැසිල් ෆොන්සේකා විසිනි

# යළි මහගෙදරට එන්නට ආරාධනාවක් !



ද‍ැනට ඇමෙරිකාවේ කතෝලික සභාවෙන් ඈත් වී සිටින ඇදැහිළිවන්තයන්ට ආපසු හැරී සිය ඇදැහිල්ලේ මහ ගෙදරට එන ලෙසට සුහද ආරාධනාවක් ඇමෙරිකාවේ සුපතළ රූපවාහිනී ඇතුළු අනෙක් සියලු මාධ්‍යයන් ඔස්සේ ඉදිරිපත් කැරෙනු ඇත.

මෙම දැවැන්ත ලඟි ඇරයුම දෙසැම්බර් මස 16 වැනි දිනැ සිට ජනවාරි 08 දක්වා කරනු ලබන්නේ "කතෝලිකයෙනි මහ ගෙරදට එන්න" යන සංවිධානය විසිනි.

යථෝක්ත කාලපරාසය තුළදී එම ආරාධනය 400 වතාවක් ප්‍රචාරක මාධයන් විසින් කැරෙනා බැව් "කතෝලිකයෙනි මහ ගෙදරට එන්න" සංවිධානයෙ නිර්මාතෘ වන ටොම් පීටර්සන් කතෝලික මාධ්‍යයට පැවැසීය. මාධ්‍යයෙන් කැරෙන එම ආරාධනය ඔස්සේ, ඇදැහිල්ල හා බැඳි යාච්ඤාව ද, පරෝපකාරය ද අධ්‍යාපනය ලබා දීම ද ආදි කරුණු මතක් කර දෙනු ලැබේ. තවද ජේසුස් වහන්සේ නිර්මාණය කළ කතෝලික සභා මෑණියන් සැමට ආරාධනා කරනා බැව් අවධාරණය කරනු ඇත. එමෙන්ම "කතෝලිකයෙනි මහ ගෙරදට එන්න" යන ආරාධනය සියලුම මාධ්‍යයන් ඔස්සේ ඉංග්‍රීසි, ස්පාඤ්ඤ භාෂාවන්ගෙන් ඉදිරිපත් කරනු ලැබේ. මාධ්‍ය ඔස්සේ කැරෙන මෙම ආරාධනය 2008 වර්ෂයේ දී ආරම්භ කිරීමෙන් පසුව වසරක් පාසා එක් එක් වර්ෂය තුළ දී සියයට දහයක සංඛ්‍යාවක් සභාව තුල සක්‍රීය ඇදැහිල්ලේ ජීවිතයට යොමුවී ඇතැයි වාර්තා වේ.

මේ වසරේදී ද ආරාධනා පණිවුඩය ඇමෙරිකාවේ 10,000 ට වැඩි නගර වල ජීවත් වන මිලියන 250 ට අධික ජනතාවක් වෙත ඉදිරිපත් කැරේ. එමෙන්ම මෙම ඇදැහිල්ලේ සත්ක්‍රියාවට එම ඇදැහිළිවන්ත පවුල් 30,000 ක් පමණ දායක වන බවත්, ප්‍රතිඵලය වශයෙන් මිලියනයකට වැඩි පිරිසක් යළි කතෝලික මහ ගෙදර විශ්වාසයේ දිවියට හවුල් වන බවත් වාර්තාවේ.

# දුගීන් වෙනුවෙන් මැරුම් කෑ පැවිදි සොහොයුරියගේ ජීවිතය ඔපරාවෙන්

ගරු ඩොරති ස්ටාන්ග් පැවිදි සොහොයුරිය උපත ලැබුවේ ඇමෙරිකාවේය. එහෙත් වසර 40 කට අධික කාලයක් ඈ සේවය කළේ බ්‍රසීලයේය. ඇගේ සහ ඇගේ කණ්ඩායමේ සේවය අමේෂන් පළාතේ ගැමි ප්‍රදේශයන් හි දිළිඳු ගැමියන් සමඟ වී, එම ගැමියන් එදිනෙදා යැපීම් උපයා ගත්තේ ඉඩම් හිමි වැවිලිකරුවන් යටතේ සේවය කිරිමෙන් ය. ඔවුන්ගේ සේවක අයිතිවාසිකම් පිළිබඳව සටන් කිරීමට ඔවුන්ට කිසිදු සවිශක්තියක් හෝ ඔවුන්ගේමැ ක්‍රියාකාරීන් ද නොමැති විය.

එසේ වීමට හේතු වූයේ ඉඩම් හිමි වැවිලි කරුවන්ට රාජ්‍ය අනුග්‍රහය තිබීමේ හේතුවෙන් සේවකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සේවක හඬක් නැඟීමට ඔවුන්ට බැරි වීමයි. එහෙත් පීඩිත සේවකයන් වෙනුවෙන් හඬක් ඉදිරිපත් කරමින් ඔවුන්ගේ සුවසෙත සැළැසීම සඳහා මෙහෙයවීම් ක්‍රියාත්මක කළේ, ගරු ඩොරති ස්ටාන්ග් පැවිදි සොහොයුරියයි. ඈ දුගී ජනතාව වෙනුවෙන් ගෙන ගිය සටන පැවැත්වීම සඳහා ඉඩම් හිමියෝ ඈ පීඩවට පත් කැරෙන ක්‍රියාමාර්ගයන් ගත්තෝය. එහෙත් දුගීන් හා යන ඇගේ ගමන නවතාලිය නොහැකි බැව් වටහා ගත් ඔවුන් විසින් රහස් කුමන්ත්‍රණයකින් ඈ ඝාතනය කරනු ලැබීය. හිසට හා පපුවට එල්ලවුණු වෙඩි පහර වලින් ඈ එතැනම මිය ගියාය. ඈ ඝාතය කරනු ලැබුවේ 2005 වර්ෂයේ පෙබරවාරි මස 12 වැනිදාය. ඇගේ මරණයෙන් පසුව "ඇමේෂන් හි දූතිකාව" සහ "ඇමේෂන් හි ප්‍රාන පරිත්‍යාග වරිය" යන නම් වලින් ග්‍රන්ථයන් දෙකක් පළවී ඇත. පසුගිය සතියේ "ඇමේෂන් හි ප්‍රාණ පරිත්‍යාගිවරිය" නමින් ඩොරති ස්ටාන්ග් පැවිදි සහෝදරියන් පරෝපකාර ජීවිතය අළලා "ඔපරාවක්" (ගීත නාටකයක්) රඟ දැක්වී ම ආරම්භ කරත. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් ජනතා සේවයේ යෙදීමේ සාක්ෂිය සඳහා කලා නිර්මාණ උපයෝගි කරගැන්ම අති ශ්‍රේෂ්ඨයයි කතෝලික පවුත් වාර්තා කරයි. ඇගේ ඝාතනයෙන් පසුව ඈ කළ සේවය අගයමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අනුස්මරණ තිළිණයක් ද ඈ වෙත පිරිනමා ඇත.



ඔපෙරාව



ගරු ඩොරති ස්ටාන්ග් පැවිදි සොහොයුරිය

# ඇදැහිල්ලේ වසරකින් ඇදැහිල්ලේ දොර කරා



ලෝක ජනතාවට ඇදැහිල්ලේ දොර තුළින් දෙවිඳුන් කරා යාමට මං සැළැසීමක් ලෙසින් 2012 ඔක්තෝබර් මස 11 වැනිදා සිට 2013 ඔක්තෝබර් 11 දා දක්වා "ඇදැහිල්ලේ දොර" වෙතින් ගමනක් ආරම්භ කැරෙනා බැව් ශුද්ධෝත්තම පියාණෝ ප්‍රකාශ කළහ. සියල්ලන් වෙනුවෙන් විවරව පවත්නා "ඇදැහිල්ලේ දොර" කරා ලෝක ජනතාව මෙහෙයවීමට එම කාල පරාසය තුළදී දේව වචනය බෙහෙවින් ප්‍රයෝජනයට ගනු ලබන බව ද එතුමෝ අවධාරණය කරති.

දෙවැනි වතිකාන සමුළුවේ 50 වැනි වසර සම්පූර්ණ වන්නේ ද 2012 ඔක්තෝබර් මස 10 වැනිදාය. භාග්‍යවන්ත II වැනි ජුවාම් පාවුළු පියාණන්ගේ ඥානෝපදේශය ප්‍රකාශ කරනු ලැබීමේ 20 වැනි වසර ද එදිනට සම්පූර්ණ වේ. එළෙසින් ආරම්බ කැරෙන "ඇදැහිල්ලේ දොර" කරා මෙහෙයුම 2013 වර්ෂයේ ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යයෙන් කූටප්‍රාප්තියට පත්වන "ඇදැහිල්ලේ දොර" කරා ගමන සියලු ලෝක ජනතාවට ඇදැහිල්ලේ ප්‍රබෝධන යුගයක් ආරම්භ කැරෙනා බැව් ද ශුද්ධෝත්තම පියාණෝ අනුශාසනය කරති. තවද එතුමෝ මෙලෙස අවධාරණය කරති. "ඇදැහිල්ලේ දොර කරා ගමන ජනතාව නව අත්දැකීම් කරා මෙහෙයවනු ලබන ලෝ ප්‍රකට විද්‍යාඥයන්ට ද, අදේවි දෘෂ්ටිකයන්ට ද සත්‍ය අවබෝධ කර ගැන්මේ වසරක් වේවා.

මරණය පරාජය කර උත්ථානව වැඩ සිටින ජේසු වහන්සේ පිළිබඳ අත්දැකීම යළි යළිත් ලොවට හඬ ගා කීම ද මෙම "ඇදැහිල්ලේ දොර" කරා ගමනේ ප්‍රධාන අරමුණක් වනු ඇත.

# කුරුසය නොගැලවූ සිසුවා මරා දැමේ



අයිමාන් නබීල් ලබීබ් නම් 17 හැවිරිදි කොප්ටික් කිතුනු ගැටවරයා ඊජිප්තුවේ මලාවි නගරයේ පාසලක උගෙනුම ලබමින් සිටියා. අතේ පච්ච කොටා තුබූ කුරුසිය සැඟැවෙන පරිදි ඇඳුම් ඇඳීමට ඔහු ප්‍රවේසම් වී සිටියා.

එහේත එදිනැ ගුරුවරිය අහම්බෙන් එම කුරුස සළකුණ දැක කෝපයට පත්වී ඔහුට පරිභව කරනන්ට වූවාය. එවිට සිසුවා කුරුසියේ සළකුණ ද කරේ පැළඳ සිටිනා බැව් දැක එය ගළවා විසිකරන්නට ඔහුට නියම කළාය. ඔහු එසේ කළේ නැත. එවිට කෝපාවිෂ්ට වූ ගුරුවරිය ඔහුට අමානුෂිකව පහර දෙන්නට පටන් ගත්තාය. එතැනට කඩා වැදුණු අනෙක් පාසල් දරුවෝ ද ඔහුට පහර දෙන්නට පටන් ගත්තෝය. කෙසේ හෝ ඔවුන්ගෙන් යන්තම් ගැලැවී පාසලේ දෙවන මහලේ වැසිකිලියට ගොස් දොර වසා ගත්තේය. එහෙත් ඔහු සොයා ආ සිය පන්තියේ සගයෝ ඔහුට මරණීය පහර දුන්නෝය. එළෙසැ පහර කෑ ලබීබ් අවසන් හුස්ම හෙළන්නට විය. පාසලේ බාහිර සේවකයෙක් ඔහු රෝහලට රැගෙන ගියත් ඒ වන විට ඔහු අවසන් හුස්ම හෙලා තිබිණි. පාසලේදී පහරදීම් පිළිබඳව සාක්ෂි ලබා ගැනීම අතිශය දුෂ්කර කාර්යයක් වී ඇති අතර සාධාරණ පරීක්ෂණයක් හෝ නඩු විසඳුමක් ඇතිවේද යනන්ත් සැක සහිතය. ලබීබ් ගේ අවසන් කටයුතු සිදුකළ දිනයේදී 3000 කට අධික පිරිසක් විරෝධතා පෙළපාලියක් පැවැත්තුවත්, ඉන් පසුව දින කීපයක් ගතවී ඇතත් නීතිමය කටයුත්තක් සිදුවී නොමැති බැව් ද වාර්තා කරන්නේ ආසියානු ජාත්‍යන්තර ප්‍රවෘත්ති ඒජන්සියයි.

# පූජකවරු 13 ක් මරාදමා ඇතත් පරීක්ෂණ නොමැත

පසුගිය කාල වකවානුව තුළදී මින්නාවෝ දූපතේ පූජකවරු 13 දෙනෙකු මරාදමා ඇත. පිලිපීන රජයේ පාලනය යටතේ පවත්නා දූපත් වලින් මින්ඩනාවෝ දූපත දෙවැනි විශාල දූපතයි. පසුගිය ඔක්තෝබර් මස 17 වැනි දිනැ එම දූපතේ මිෂනාරිවර පවුස්ටෝ ටෙන්ටෝරියෝ නම් පූජක තුමාද මරා දමා තිබුණි. එහෙත් ඒ පිළිබඳ කිසිදු තොරතුරක් හෝ අනාවරණය වී නොමැත.

කලින් සිදුවී ඇති පූජක වරුනගේ මරණ පිළිබඳ රහස් කටකථා පැතිර තිබුණත් සාක්ෂිකරුවන් කිසිවෙකුත් ඉදිරිපත් නොවීම අතිශය ශෝකජනක තත්ත්වයක් යයි මලේබාල් හි ජෝසේ කබන්ටාරි රදගුරු හිමිපාණෝ පවසති. "එතරම් පූජක සංඛ්‍යාවක් පමණක් නොව ඇතැම් ගිහි නායකයන් කීපදෙනෙක් ද මරා දමා හෝ අතුරුදන් කර ඇති බැව් සැවොම දනිති. ටෙන්ටෝරියෝ පියතුමාගේ මරණය මෙන්ම අතීත සිද්ධීන් ද පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට කවුරුන් හෝ ඉදිරිපත් නොවන්නේ ඒ හැම සාපරාධයක් පිටපුස අදිසි බලවේගයක් ක්‍රියාත්මක වන නිසා බැව් සැමගේ සැකයයි.

එබඳු සැකයක් සමාජ ගත වී ඇත්තේ, පාලකයන් විසින්. පූජකවරුන් ඇතුළු අනෙක් සාපරාධයන් පිළිබඳ නීතිය ක්‍රියාත්මක නොකැරෙන්නේ වෙනත් බලවතුන්ගේ බලපෑම් නිසා බවයි. එබැවින් ජනතාව ආරක්ෂා කිරීම පිලිපීන රජය විසින් පැහැර හැරිය යුතු නොවේ." රදගුරු හිමිපාණෝ එළෙසින් ද අවධාරනය කරති.

පතල් කැනුමේ යෙදෙන සමාගම් හිමියෝ අතුරු හමුදා භටයන් යොදා ගැමියන්ගේ ඉඩකඩම් කොල්ල කති. එම සමාජ විරෝධි ක්‍රියාවන්ට පූජකවරුන් හා කතෝලික ගිහි නායකයන් විරුද්ධ වීම නිසා එම ඝාතන නිරන්තරයෙන් සිදුවන හෙයින් රජය විසින් වහා ක්‍රියා කළ යුතුයි පිලිපීන රදගුරු සම්මේලනය හඬ නඟයි.

# ජාකර්තා හි කිතුනුවන් පෙළෙද්දි ජනාධිපති මර නින්දේ

"ඉන්දුනීසියාවේ ජාකර්තා ප්‍රදේශයේ මුස්ලිම්වරු කිතුනු දෙව් මැඳුරු වලට නිරන්තරයෙන් පහර දෙති. වර්ෂ 200 සිට මේ දක්වා දෙව් මැඳුරු 200 කට අධික සංඛ්‍යාවකට අන්තවාදි මුස්ලිම් වරුන් විසින් පහර දී අතැ.

ඒ හැම අවස්ථාවකදීම ඉන්දුනීසියානු ජනාධිපති සුයිලෝ බංබාන්ග් හා පොලීසිය මර නින්දේය." එලෙස පවසා ඇත්තේ, ඉන්දුනීසියාවේ කිතුනු සංඝ සංසදයේ සභාපති තියෝපිලස් බේලාය. "අවැසිතා සහිත සභාවක් සඳහා සභාය" යන කිතුනු සංවිධානය වෙත කරුණු ඉදිරිපත් කරමින් තියෝපිලස් බේලා විසින් පවසා ඇත්තේ 2011 වර්ෂයේ මුල් මාස 05 ඇතුළතදී කිතුනු දෙව්මැඳුරු 14 කට ද 2010 වර්ෂයේදී දෙව් මැඳුරු 46 කට ද අනත්වාදීන් විසින් පහර දී ඇති බවය. එහෙත් බංධාන්ග් ජනාධිපති වරයා විසින් ඒ කිසිදු පහරදීමක් ගැන පොලිස් වාර්තාවක් හෝ ලබා ගෙන නොමැත.

මේ පිළිබඳව තියෝපිලස් බේලා මෙලෙස ද පවසයි. "කිතුනු දෙව් මැඳුරකට පහරදෙනු ලැබූ හැම අවස්ථාවකදීම ජනාධිපතිවරයා බලයට පැමිණීමෙන් පසුව අන්තවාදී මුස්ලිම් වරුන් විසින් ජාකර්තාවේ පහරදී ඇති කිතුනු දෙව්මැඳුරු සංඛ්‍යාව 28 ක් ලෙසින් වාර්තා වී තිබේ.

ඉස්ලාමීය දේශපාලනික පක්ෂයකට අයත් ආගමික කටයුතු පිළිබඳ ඇමැතිවරයාට බියෙන් ජනාධිපති වරයා අන්තවාදීන්ට එරෙහිව කටයුතු නොකරන බැව් "වතිකාන ඉන්සයිඩර්" ප්‍රවෘත්ති සේවය වාර්තා කරයි.

## දහම් මණ්ඩපය



# ආධ්‍යාත්මික වාළුකාවේ තනි නොවන්නට?

අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමන් විසිනි

"මම මහළු විශ්‍රාමිකයෙක්. කිසිකෙනෙක් මා කියන දේවල් ගණන් ගන්නේ නැහැ. හැමෝගෙම හිතේ මම පිස්සෙක් කියල. අනේ පියතුමෙනි, පිං සිද්ධ වෙයි මම මේ කියන දේට ඇහුම්කන් දෙන්න" මේ පසුගිය දිනෙක දුර්වර්ණ වූ යුරෝපීය ඇඳුම් කට්ටලයකිනුත්, එයට කිසිසේත් නොගැලපෙන ටයි පටියකිනුත්, පුස් කාපු තොප්පියකුත් කසල ගොඩකට විසිකර දැමිය යුතු පාවහන් දෙකකුත් පැළඳගෙන දුඹුරු පාට වූ කලු කුඩයක් සහ හම ගිය සූට්කේස් එකක් අතින් ගෙන මගේ කාර්යාලයට පැමිණි කෙසඟ මිනිසකුගේ ඉල්ලීමයි. අපරාදේ කාලය නාස්ති නොකර යන්නැයි කියා ඔහු එලවා දැමීමට සිත් වූවත්, ඒ මුහුණේ රැඳී තිබූ අව්‍යාජ බව සාංකාව නිසා ඔහුට කතා කිරීමට මම ඉඩ හැරියෙමි. ඔහු මාත් සමඟ කතා කළ හැම දෙයක්ම ඒ පිළිවෙලින් ඒ විදියටම මෙහි සඳහන් කිරීමට තරම් මගේ මතකය ශක්තිමත් නැත. නමුත් පැය එකහමාරකට වඩා කාලයක් ඔහුට සවන් දීමෙන් පසු ඒ කියූ දේවල් මට බොහෝ දේ ගැන සිතන්නට, මෙනෙහි කරන්නට, භාවනා කරන්නට, කල්පනා කරන්නට සිදුවූ නිසා, එයින් සමහරක් ඔහුගේම භාෂාවෙන් මෙහි සඳහන් කරන්නට උත්සාහ කරමි.

පියතුමෙනි, මම ඉරිදා පූජාවට සහභාගි වෙන බොහෝ දෙනාගේ විනීතකම ගැන බොහෝ සේ කලකිරී සිටිමි. මා මේ ගැන බාහෝ අය සමඟ කතා කළත් කිසිවකු මගේ කීම පිළිගන්නේ නැත. නමුත් මේ අවිනීතකම ගැන කලකිරී, වේදනාවට පත්වී අසහනයෙන් සිටින්නේ මම පමණක් නොවන බව මම හොඳින් දනිමි. පළමුවෙන්ම මම ඔබවහන්සේට කියන්නම් විනීතකම ලෙස මා හඳුන්වන්නේ කුමක්දැයි කියා. විනීතකම කියන්නේ අවිනීත නොවී සිටීම පමණක්ම කියා මා හිතන්නේ නැහැ. විනීතකම කියන්නේ කිසිම දෙයකින් අවිනීත වින්දනයක් ලබා නොගැනීමයි. මිනිසුන් හැටියට අපි කෑමට, බීමට, සැප සම්පත් වලට, කායික වින්දනයන්ට ආශා වෙමු. එය මනුෂ්‍ය සංහතියේ පැවැත්මට අත්‍යවශ්‍ය අංගයකි. නමුනත් එමඟින් තමාම හෝ වෙනත් අයකු අයහපතට හෝ නපුර වෙත කයින් හෝ මනසින් යොමු වන්නේ නම් එය අවිනීත හැසිරීමකි.

මම ඔබවහන්සේට මේ කියන්ඩ හදන්නේ අපේ බොහෝ දෙනා අද ඉරිදා පූජාවට එද්දී අඳින ඇඳුම් පැළඳුම් පිළිබඳවයි. මම මෙහි දී සම්පූර්ණයෙන්ම අපගේ කාන්තා පාර්ශ්වයට පමණක් දොස් කියන්නේ නැහැ. දෙගොල්ලෝම මේ ගැන කල්පනාකාරී විය යුතුයි. මම ගිය ඉරිදා පූජාවට ගිය වෙලාවෙ මට ඉස්සරහින් බංකුවෙ වාඩිවෙලා හිටියේ තරමක් හැඩි දැඩි තරුණයෙක්. ඔහු ඇඳගෙන තිබූ ටී ෂර්ට් එකේ පිටිපස්සෙ රැවුලක් වවාගත්ත, අව්කණ්ණාඩි දෙකක් පැළඳ ගත්, පළල් නලලක් ඇති පුද්ගලයකුගේ මුහුණ ඉතා විශාල ප්‍රමාණයෙන් මුද්‍රණය කරල තිබුණ. ඊට යටින් I AM GAY කියල ලියල තිබුණ. ඒ පුතා ඒ වචනවල තේරුම සමහර විට දන්නෙ නැතිව ඇති. කොහොම හරි මම පූජාවට භක්තියෙන් සහභාගි වන්නට කොතරම් උත්සාහ කළත්, ගරු පියතුමා කියන දෙයට කොතරම් අවධානය යොමුකරන්නට උත්සාහ කළත් හැම තිස්සෙම අර ටී ෂර්ට් එකේ ඉන්න කළු මිනිහ මගේ දිහා බලාගෙන ඉන්නව වගෙයි පෙනෙන්නෙ. දිව්‍ය රහස් කරපු පූපය උඩට ඔසවද්දී "මාගේ ස්වාමිනී, මාගේ දෙවියනී" කියා මා එදෙස බලද්දිත්, අර මූණ මා දිහා බලාගෙන ඉන්නව. මේක සමහර විට මගේ වැරැද්දක් වෙන්න ඇති. නමුත් මම ඔබවහන්සේට කියන්නේ මට වෙච්ච දේයි. අනේ පියතුමෙනි, සමහර තරුණ තාත්තල කොට කලිසම ඇඳගෙන පල්ලි එනවා. කෝ මේ අපේ වැඩිහිටියො දිව්‍ය පූජාවට දෙන ගෞරවය. අපේ ගෙදර හරි ඔෆිස් එකේ හරි උත්සවයක් තියෙන කොට අපි එහෙම ඇඳුම් අඳිනව ද?

කොට කලිසම් ඇඳගෙන පල්ලි එන පිරිමි වගේම තමා ඇඟට තද වෙච්ච, කොට කලිසම්, නැත්නම් තුන්කාලෙ කලිසම් ඇඳගෙන පල්ලි එන අපේ ගෑණු උදවිය. ඇත්ත අද රූපවාහිනිය බැලුවත්, පත්‍ර හෝ මහමඟ අයිනේ ඇති වෙළෙඳ දැන්වීමක් බැලුවත් අපිට දකින්න ලැබෙන්නේ මේවාගේ දේවල් තමයි.

නමුත් ඒවායේ පරමාර්ථය අප හැමෝවම ඒ අය කරා ආකර්ශනය කරගැනීමයි. වෙළෙඳ භාණ්ඩයක් හෝ වේවා! වෙනත් කුමන දෙයක් හෝ වේවා! ඒ කරා අපගේ අවධානය දිනා ගැනීමයි. ඒවා හරිය කියා මා කෙසේවත් කියන්නේ නැහැ. නමුත් පල්ලි එන්නෙ කාව අප කරා ආකර්ශනය කර ගන්න ද? විය යුත්තේ අප දෙවියන් කරා ආකර්ශනය වීම නොවෙයි ද? අඩ නිරුවත තමාට මෙන් අනික් කෙනාවත් නොමඟට යොමු කරන්නක් නොවේ ද?

මම දවසක් අඟ පසඟ පෙනෙන ලෙස ඇඳුමකින් සැරසිලා හිටිය තරුණ අම්ම කෙනෙක්ගෙන් මෙහෙම ඇහැව්ව;

"ඇයි දුවේ පල්ලි එද්දි ඔහොම අඳින්නෙ"? "ඇයි මොකද - මට ඕන දෙයක් අඳින්න මට නිදහස නැද්ද? අනික මේව තමයි දැන් කාලෙ ස්ටයිල්. අනේ අංකල් පැත්තකට වෙලා ඉන්න" මේ ඇගේ පිළිතුරයි. ඇත්ත; ඒ දරුවගෙ කථාව ඇත්ත. තමන්ට කැමති දෙයක් අඳින්න ඇයට අයිතිවාසිකමක් තියෙනව. හැබැයි මම එකක් කියන්න ඕන. ඒ වගේම දුර්පරීක්ෂාවට නොවැටී ඉන්න මටත් අයිතිවාසිකමක් තියෙනවා. ක්‍රිස්තුන් වහන්සේ අපිට කිව්ව "යමෙක් ස්ත්‍රියක දෙන කාමරාග යෙන් බැලූ කෙණෙහිම ඔහු ඈ සමඟ කාමමිත්‍යාචාරය කර ඇත." (මතෙව් 5:28) කියල. උන්වහන්සේ එතැනින් නැවතුනේ නැහැ. "මිනිසුන් පාපයට පමුණුවන හේතූන් ඇතිවීම නියතය. එහෙත් යමෙකු නිසා ඒ හේතු පැමිණේ ද ඔහුට වන විපතක මහත" (ලූක් 17/1). එම නිසා කවුරුහරි කෙනෙක්ව ක්‍රිස්තුස් වහන්සේ වෙතින් මොහොතකට හෝ ඈත් කළොත්, ඒ පුද්ගලයා බරපතල පාපයක් කරයි. ඒ නිසාද "මට ඕන දෙයක් අඳින්න මට නිදහස තියෙනව" කියල කාටවත් කියන්න බැහැ. දිව්‍ය පූජාව වෙලාවෙ දී දෙවියන් වහන්සේට දිය යුතු අවධානය තමන් වෙතට යොමු කර ගැනීමට කිසිවෙකුට අයිතියක් නැත. පියතුමෙනි, අනිත් පිරිමින් ගැන කතා කිරීමට මට අයිතියක් නැත. නමුත් මෙවැනි දේ දකින මේ මහල්ලාගේ අවධානය වෙනතකට යොමු වෙයි නම් තරුණයින් ගැන කුමක් කියම් ද?

දිව්‍ය පූජාව තුති පිදීමේ ප්‍රශංසාවේ මොහොතකි. මුළු ගැලවීමේ ඉතිහාසය ගැනම මෙනෙහි කරමින් අපි මැවුම්කාර, ගැළවුම්කාර දෙවිඳුන්ට තුති පුදමු. එය සිත එකලස් කර ගැනීමේ, භාවනාවේ පූජනීය මොහොතකි. ඒ සඳහා අවැසි වටපිටාව සැකසීම හා එලෙස දේවස්ථානය තුළ විනීතව හැසිරීම, අන් අය වෙනුවෙන් දක්වන ක්‍රිස්තියානි දයාවේ ක්‍රියාවකි.

> **"දිව්‍ය පූජාව තුති පිදීමේ ප්‍රශංසාවේ මොහොතකි. මුළු ගැලවීමේ ඉතිහාසය ගැනම මෙනෙහි කරමින් අපි මැවුම්කාර, ගැළවුම්කාර දෙවිඳුන්ට තුති පුදමු. එය සිත එකලස් කර ගැනීමේ, භාවනාවේ පූජනීය මොහොතකි. ඒ සඳහා අවැසි වටපිටාව සැකසීම හා එලෙස දේවස්ථානය තුළ විනීතව හැසිරීම, අන් අය වෙනුවෙන් දක්වන ක්‍රිස්තියානි දයාවේ ක්‍රියාවකි."**

මම දවසක් දණිහටත් උඩ කොට කළිසමකින් හා හීනි පටි දෙකකින් එල්ලා වැටෙන කාන්තා උඩ ඇඳුමකින් සැරසී සිටින තම තරුණ දියණියත් සමඟ පල්ලියට ඇවිත් සිටි මැදිවියේ අම්මා කෙනකුගෙන් ඉතා කාරුණිකව මෙලෙස ඇසුවෙමි;

"ඇයි පල්ලි එනකොට ළමයින්ට මේ වගේ ඇඳුම් අඳින්න දෙන්නෙ? ඒක හොඳ නෑනේ!" ඇගේ ක්ෂණික පිළිතුර වූයේ, "දැන් කාලෙ ඇඳුම්වල හැටි ඔහොම තමා. කඩවල විකුණන්න තියෙන්නෙ ඕව තමා. අනික අපි කියන ඒව දැන් ළමයි අහනවයැ."

ඒ පිළිතුරෙන් පසු ඒ සාකච්ඡාව ඉන් ඉදිරියට ගෙන යෑමට හැකියාවක් නැත. මගේ අදහසේ හැටියට නම් ඇඳුම් අවශ්‍ය විළි වසා ගන්නට මිස විළි බිය තුරන් කරන්නට නොවේ. අනිත් හැම තැනම කරන විලාසිතා පල්ලියේත් එසේම කළ හැකිනම්, පල්ලිය හා මුහුදු වෙරළ අතර වෙනසක් නැද්ද? දේවස්ථානය දේව මන්දිරයයි. අප එහි යන්නේ විනෝද වී කා බී නටන්නට නොව ජීවමාන සමිඳාණන් මුණ ගැසීමටයි. අප දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගෙන ගෙදර යන්නේ ඒ ජීවමාන ස්වාමින් වහන්සේ සමඟයි. අපගේ ශරීර ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයයි. අප වැඩමවාගෙන යන තැනැන් වහන්සේ අප තුළ ජීවත් වන බව අපගේ හැසිරීමෙන්, කතා බහෙන්, ඇඳුම් පැළඳුම් වලින් පෙන්නුම් කළ යුතුයි. ක්‍රිස්තියානි සාක්ෂි දැරීම එයයි. කිතුනු ජීවිතය විලාසිතාවක් නොව සාක්ෂි දැරීමකි.

සුවාමි මට තවත් වෙච්ච ඇබැද්දියක් ඔබවහන්සේට කියන්නම්. දිනක් කිසිසේත් දේවස්ථානයට පැමිණීම සඳහා නුසුදුසු අඟ පසඟ බොහෝ විවෘත ඇඳුම් වලින් සැරසුන තරුණියන් කීප දෙනෙක් දිව්‍ය පූජාවට පෙර මහ හඬින් පල්ලිය ඉස්තෝප්පුවේ කොක් හඬලා හිනාවෙමින් හිටිය. පොඩ්ඩක් සද්දෙ අඩු කරන්න කියල හිතාගෙන එතන්ට ගියාම, ඒ අය ඇඳගෙන හිටිය ඇඳුම් ගැනත් මොකවත් නොකියාම ඉන්න මට බැරුව ගියා. ඒ නිසා ද "අනේ මගෙ දුවල ඇයි ඔය විදිහෙ ඇඳුම් ඇඳගෙන පල්ලි එන්නෙ"

☛ 15 පිටුවට

# අපගේ පාපයන් සඳහා විඳිය යුතු තාවකාලික දඬුවම සහ සදාකාලික දඬුවම

ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමන් විසිනි



සෑම වසරකම නොවැම්බර් මාසය පුරා මළවුන් වෙනුවෙන් විශේෂාකාරයකින් යාච්ඤා කිරීමට කතෝලික අපි පුරුද්දක් කරගෙන සිටිමු. මේ සමය තුළ ශුද්ධිකාගිනිස්ථානයේ දුක් විඳින ආත්මයන් වෙනුවෙන් දාන ධර්ම දීමට හා පුද පූජා පැවැත්වීමට ද අප සැදී පැහැදී සිටිමු. ශුද්ධිකාගිනිස්ථානයේ පසුවෙන ආත්මයන් වෙනුවට අප මෙලෙස මැදිහත් විය යුත්තේ ඇයි ද යන කාරණයට පාදක වන වැදගත් සංකල්පයන් කීපයක් පිළිබඳ කරුණු කාරණා කීපයක් ගොනු කිරීම මෙම කෙටි ලිපියේ අරමුණයි. මෙම සංකල්ප අතර "තාවකාලික දඬුවම" හා "සදාකාලික දඬුවම" විශේෂත්වයක් ගනී. එසේම "ශුද්ධිකාගිනි ස්ථානය" "නිරය" හෙවත් "නරකාදිය", "ස්වර්ගය" "පරිපූර්ණ ඵල" හා "පූර්ණඵල" යන සංකල්ප ද ඒ හා සමානව ඊට සම්බන්ධ වේ. එහෙත් ඒවා වෙන වෙනම සාකච්ඡා කළ යුතු මාතෘකා වේ. ඒ නිසා මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ මූලික කරුණු කිහිපයක් වෙත පමණි.

සමගි සන්ධානය සක්‍රමේන්තුව හෙවත් පාපොච්චාරණය සක්‍රමේන්තුව ලබා ගැනීමේ දී පූජා ප්‍රසාදිතුමා විසින් අපගේ පාප වලට අනුකූල වන්දියක් ලෙස කිසියම් දඬුවමක් නියම කරනු ලබයි. එම දඬුවම සදාකාලික දඬුවම තාවකාලික දඬුවම වශයෙන් අදහස් කෙරෙන්නේ අප විසින් සිදු කරනු ලබන මරණීය පාපයනට නිසි දඬුවම වන නිරය හෙවත් නරකාදියයි. එහෙත් සමගි සන්ධානය සක්‍රමේන්තුව මඟින් අපගේ මරණීය පාප වලට සමාව ලබා ගත හැකි නිසා, එම සක්‍රමේන්තුවට නිසි ලෙස සහභාගි වීම තුළින් මරණීය පාප වලට නියමිත සදාකාලික දඬුවම ඉවත් කර ගත හැකිය.

එහෙත් අපගේ පාප වලට සමාව ලබාගත්තායින් පසුවත් සමාව ලද එම පවු වලට නියමිත දඬුවම අප විසින් සම්පූර්ණ කළ යුතු වේ. එම දඬුවම අප හඳුන්වනු ලබන්නේ තාවකාලික දඬුවම වශයෙනි. වෙනත් වචන වලින් පැවසුවහොත් දෙවියන් වහන්සේ විසින් අපගේ පව් කමා කරනු ලැබූ පසුවත් එම පව් සඳහා දඬුවම් විඳීමක් දෙවියන් වහන්සේ අපේක්ෂා කරන සේක.

මෙකී දඬුවම මෙලොව අප ජීවත්ව සිටිය දී හෝ මරණයෙන් පසුව හෝ සම්පූර්ණ කළ යුතු වේ. උදාහරණයක් ලෙස තමාගේ ගෙවත්තේ ක්‍රිකට් ක්‍රීඩා කරන ළමයකු අතින් පන්දුව විසි වී අසල්වැසි නිවසේ ජනේලයක වීදුරුවක් කැඩී ගිය අවස්ථාවක, ඔහු විසින් එම නිවස හිමිකාරිය වෙත තමාගේ කණගාටුව ප්‍රකාශ කර සිටින විට, ඇය විසින් එම කණගාටුව පිළිගෙන එම වැරැද්දට සමාව ලබා දුන්නත්, ඇයට සිදුවූ අලාභය පියවන ලෙස ඇය ඔහුගෙන් ඉල්ලා සිටිය හැකිය. මේ අනුව "තාවකාලික දඬුවම" යනුවෙන් අදහස් කෙරන්නේ සමගි සන්ධානය සක්‍රමේන්තුව තුළින් සමාව ලබාගත් පව් වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු දඬුවම වේ.

බයිබලීය ඉගැන්වීම් වලට අනුව පාප වලට මනස්ථාපනය වී පවු සමාව ලබාගත් පසු එම පාපයනට නියමිත සදාකාලික දඬුවම ඉවත් වූවත්, එම පාපයනට නියමිත තාවකාලික දඬුවම දිගටම බල පැවැත්වේ. උදාහරණයක් ලෙස ආදම් සහ ඒව පව් කිරීමෙන් පසුව දෙවියන් වහන්සේ විසින් ඔවුනට දයා කරුණාව දැක්වූ පසුවත්, එම පාපයනට දඬුවම් ලෙස දරු ප්‍රසූතියේ දී ඇතිවන වේදනාවත්, දහඩිය මහන්සියෙන් ජීවිකාව කරගෙන යෑමත්, මරණයත් ඔවුනට උරුම වුණි (උත්පත්ති 3:15-19). පවු සමාව ලැබූ ජනතාව, ඔවුන් මෙලොව දිවි ගෙවූ කාලය තුළදීම මෙලෙස තාවකාලික දඬුවම් විඳි බවට ඉඟි කෙරෙන තවත් අවස්ථාවන් තුනක් ඉදිරිපත් කළ හැකිය. ඊජිප්තුවේ වහල්කමින් මිදී ජනතාව පොරොන්දු දේශය කරා යන ගමනේ දී, විඩාවට පත්ව ජලය ඉල්ලා සිටි අවස්ථාවේ මෝසෙස් තුමා ගල් පර්වතයෙන් ජලය ගලා ඒම සඳහා ඊට ආමන්ත්‍රණය නොකොට ඊට තට්ටු කිරීම තුළින් දේව අණට අකීකරු විය. එම අකීකරුකමේ පාපය හේතුවෙන් පොරොන්දු දේශයට ඇතුළු වීමට ඔහුට අවසර නොලැබුණි (ගණන් කථා 20:12). එහෙත් ස්වාමින් වහන්සේගේ අන්‍යරූප විලාශ වීම අවස්ථාවේ දී උන්වහන්සේ සමඟ ඔහු පෙනී සිටීම මඟින් ප්‍රත්‍යක්ෂ වන ලෙස මෝසෙස් තුමා ගැලවීම ලැබූවන් අතරට ගණන් ගනු ලැබේ (මතෙව් 17:3, මාක් 9:4, ලූක් 9:30).

☛ ඉදිරි කලාපයට

# අවිලා හි තෙරේසාතුමිය, භාවනාශීලී යාච්ඤාව හා සංතෘප්තිය - 13

දුර්පරීක්ෂාවන් නිසා ආත්මය දුර්මුඛ වනවාට වඩා ශක්තිමත් වන බව සම්පූර්ණ සත්‍යයකි. ඒවායින් ලැබිය හැකි සුවිශාල ඵල ප්‍රයෝජන ගැන අත්දැකීම් අපට උගන්වා ඇත. දෙවියන් වහන්සේ ඒවාට ක්‍රියාත්මක වීමට අවසර දෙනු ලබන්නේ ඒවායින් වඩා වාසියක් ලබා ගැනීම සඳහාය.

මෙම මහලේ දී අප ස්වාමීන් වහන්සේ දරුණු ශාරීරික වේදනාවන් සහ දුබලතාවයන් එවන සේක. විශේෂයෙන් ඉතා තියුණු වේදනාවන් දැනෙන්නේ නම්, එය ඉතා දුෂ්කර කුරුසියකි. එය ඉතා හිංසාකාරී නම්, එය ලෞකික පරීක්ෂා වලින් දුෂ්කරතම පරීක්ෂාව වේ.

මා මෙහිදී කතා කරන්නේ බාහිර පරිකෂාවන් ගැනයි. නමුත් ඉතා දරුණු ශාරීරික වේදනාවන් අපගේ ඇතුලාන්තයට ඇතුළු වුවහොත්, එය ශාරීරය සහ ආත්මය යන දෙකටම වේදනා ගෙන දෙයි. එවිට ආත්මය වේදනාව අධික කම නිසා කළ යුත්තේ කුමක් දැයි නොදැන, තමාව ඉක්මනින් මරණයට පත්වීම වේදනා විඳිනවට වඩා යහපත් යයි සිතීමට පෙළඹේ. නමුත් මෙවැනි හදිසි වේදනාවන් සුළු කාලයකින් පහවී යයි. දෙවියන් වහන්සේ අපට ඉසිලීමට නොහැකි වේදනාවන් නොදෙන අතර, එතුමා අපට ප්‍රථමයෙන්ම ඉවසීම ලබාදෙන සේක.

දෙවියන් වහන්සේගේ කරුණාව බලාපොරොත්තුවීම හැර ඒ සඳහා වෙනත් විසඳුමක් නැත. එම කරුණාව අප නොහිතන අවස්ථාවක, නොහිතන ආකාරයකට, එවැනි සියලුම වේදනාවන් පහකර දමයි. එවිට කරදරකාරී වළාකුළු නොපෙනී යන අතර, මනස ආලෝකයෙන් පිරී පෙරට වඩා ප්‍රිතිමත් භාවයට පත්වේ. ඉතා භයානක සටනකින් ජයග්‍රාහීව පැමිණි පුද්ගලයෙකු මෙන්, ආත්මය දෙවි ස්වාමින් වහන්සේට තුති ප්‍රශංසා කරයි. ඊට හේතුව එම ජයග්‍රහණය අත්කර ගන්නා ලද්දේ එතුමාණන් විසින් නිසයි.

ජයගැනීම තමන්ගේ ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් නොවන බව ආත්මයට අවබෝධවීමට හේතුව නම්, ආත්මාරක්ෂාව සඳහා පැවති ආයුධ සියල්ලක්ම සතුරන්ගේ අතේ ඇති බව පෙනී යන නිසයි. එවිට ආත්මයට එහි දුර්වලතාවය අවබෝධ වන අතර, දෙවියන් වහන්සේ තමාව අත් හැර දමයි නම්, තමන් විසින් තමන්ටම ලබාදිය හැකි උදව් උපකාර කොතරම් අල්පද යන්න වැටහී යයි.

මෙම සත්‍යය තවදුරටත් පැහැදිලි කිරීමට අවශ්‍ය නැත. අතීතයේ අත්දැකීම් ආත්මයේ සම්පූර්ණ අසමත්වීම් ගැන ඊට උගන්වා ඇත. මනුෂ්‍ය ස්වභාවයේ හිස් භාවය සහ අප කොතරම් කාලකණ්ණි සහ අවාසනාවන්ත බව ද ආත්මයට මෙහිදී අවබෝධ වේ.

ආත්මය දේව වරප්‍රසාද තුළ අඛණ්ඩ ජීවත් වූවත්, එම වරප්‍රසාද සැඟවී තිබෙන නිසා, එසේ දුක් විඳින ආත්මය මේ මොහොතේ දී හෝ අතීතයේදී, දෙවියන් වහන්සේගේ ආදරයේ සුළු අංශුවක් හෝ අත් දැක නොමැති බව විශ්වාස කරයි. අප කුමන මොහොතක හෝ යහපත කර ඇතත්, අපගේ රජාණන් අපට විශේෂ වරප්‍රසාද දානය කර ඇතත්, ඒවා සිහිනයක් හෝ කල්පනා මාත්‍රයක් මෙන් පෙනී යන අතර, අපගේ



පව් අප ඉදිරියේ පැහැදිලිව දෘශ්‍යමාන වේ.

අහෝ පේසුනි! එලෙස අතහැර දමන ලද ආත්මයක් හමුවීම කොතරම් ශෝකජනකද! එවිට ලෞකික සැනසීම කොතරම් අල්ප උදව්වක්ද! එවැනි ආත්මයකට අවශ්‍ය සැනසිල්ල පැමිණිය යුත්තේ ඉහලිනි. කිසිදු ලෞකික දෙයකට ඔවුන්ට පිහිට විය නොහැකිය. මෙම උත්තරීතර දෙවියන් වහන්සේ තමන්ගේ ස්වාධීපත්‍යය සහ අපගේ අවාසනාවන්තභාවය අප විසින් පිළිගැනීම බලාපොරොත්තු වන සේක. තවදුරටත් අධ්‍යාත්මික ප්‍රගතිය අපේක්ෂා කරන්නන් එම කාරණයට සැලකිල්ල යොමු කළ යුතු වේ.

මෙවැනි දුර්පරීක්ෂාවන් දින කිහිපයක් පුරාම පවතී නම්, අපට කළ හැකි දේ කුමක්ද? මෙහිදී හදවතේ සැනසීම සඳහා යාච්ඤාව එතරම්ම උදව්වක් නොවේ. අප හඬ නගා යාච්ඤා කළත්, එම වචනවල තේරුම මනසට ග්‍රහනය කර ගැනීම දුෂ්කරය. භාවනාශීලි නිහඬ යාච්ඤාව කිරීමද මෙහිදී දුෂ්කර කරුණකි. එක අතකට නිහඬතාවය ආත්මයට හානිදායක වන අතර, අනික් අතට සමාජ ආශ්‍රයද විශාල බාධාවකි, කරදරයකි.

ආත්මයට වද දෙන දේවල් මොනවාද කියා කිව හැකි වනුයේ කෙසේ ද? එහි වේදනාවන් වචනයෙන් විස්තර කළ නොහැකිය. එය නම් කළ නොහැකි වේදනාවන් සහ අධ්‍යාත්මික වේදනාවල් වලින් මිරිකී පවතී. එය ඉතා පීඩාකාරී තත්ත්තවයකි. ඒ සඳහා ඇති හොඳම විසඳුම නම් දයාවේ ක්‍රියාකාරකම් වල යෙදීම සහ දෙවියන් වහන්සේගේ අසීමිත කරුණාව කෙරෙහි විශ්වාසය තැබීමයි.

යක්ෂයා පවා බාහිර දුර්පරීක්ෂාවන් ගෙනෙනු ලබයි. නමුත් ඒවා එතරම් වේදනාකාරී නොවේ. එමෙන්ම යක්ෂයාට පෙර මහලවල්වල මෙන් විශාල හානියක් මෙහිදී කළ නොහැකිය. එමෙන්ම යක්ෂයාට දෙවියන් වහන්සේ ඉඩ දෙනප්‍රමාණයට වඩා වැඩියෙන් හානියක් කළ නොහැකි බවද මනසට අවබෝධ වේ.

හත්වන මහලට ඇතුළු වීමට පෙර අත්දකින මෙම ශාරීරික වේදනාවන් වලට අමතරව තවත් වේදනාවන් අපට හමුවේ. එම වේදනාවන් මාධ්‍යයේම, ඒවා දෙවියන් වහන්සේගෙන් පැමිණෙන සුවිශාල වරප්‍රසාදයන් බව ආත්මය හඳුනා ගනී. එමෙන්ම අප එවැනි වරප්‍රසාදයන් ලැබීමට කොතරම් නුසුදුසු ද යන්න ඊට වැටහේ.

අප ස්වාමීන් වහන්සේ සමඟ සම්බන්ධ වීමට ඇති ගැඹුරුතම උවමනාව, උන්වහන්සේ විසින් තව තවත් තිව්‍ර කරනු ලබයි. මෙම ආශාවන් සහ අපේක්ෂාවන් ආත්මයේ ගැඹුරුතම පතුලෙන් නැඟී එන ඉතා සියුම් සහ මට සිලුටු ආශාවන්ය. ඒවා සංසන්දනය කළ හැක්කේ මොනවා සමඟ කියා ප්‍රකාශ කිරිම දුෂ්කරය.

අප විසින්ම ලබාගත හැකි කිසිම දෙයකට වඩා මෙම වරප්‍රසාදයන් සම්පූර්ණයෙන්ම වෙනස්ය. ඉහත සඳහන් කරන ලද අධ්‍යාත්මික සැනසිල්ලටත් වඩා ඒවා වෙනස්ය. මනස දෙවියන් වහන්සේ ගැන සිතමින් නොසිටින්නේ වූවත්, චිත්ත ඒකාග්‍රතාවයට එළඹෙන්නේ නොමැතිව වූවත්, ක්ෂනිකව සිදුවන විදුලි සැරයක් මෙන් අප ස්වාමීන් වහන්සේ අපගේ මනස අවදි කරවන සේක.

දෙවියන් වහන්සේ විසින් එසේ අවදි කරවනු ලැබූ ආත්මයට උන්වහන්සේගේ කටහඬ ඉතා හොඳින් ඇසේ මුලින්ම එසේ එතුමාගේ හඬ ගැසූ විට, ආත්මය කම්පා කලබල වී හඬා වැලපේ. නමුත් ඒ තුළ කිසිදු වේදනාවක් නොමැත. එවිට ආත්මයට ඉතා රසවත්, මිහිරි තුවාලයක් ලැබී ඇති බව වැටහේ. නමුත් එය ලැබුනේ කෙසේ ද, කාගෙන් ද, කොහෙන් ද කියා නොදනී. නමුත් එසේ ලැබී ඇත්තේ ඉතා වටිනා, මිල කළ නොහැකි වරප්‍රසාදයක් බව හඳුනා ගන්නා අතර, එම තුවාලය කිසිම දිනෙක සුව නොවේවා යයිද ප්‍රාර්ථනා කරයි.

ආත්මය තම මනාලයාට සෙනෙහසාත්මක මැවිසිලි නඟයි, සමහර විට ඒවා ශබ්ද නඟා ද ප්‍රකාශ කරයි. සමහර විට ආත්මයට ආත්මයම පාලනය කර ගත නොහැකිය. හේතුව අප ස්වාමීන් වහන්සේ ආත්මය තුළ වාසය කළත්, උන්වහන්සේ තමන් වහන්සේව නිතරම විද්‍යාමාන නොකිරීමයි. උන්වහන්සේ එසේ නිතරම කරයි නම්, ආත්මයට උන්වහන්සේව නිතරම භුක්ති විඳිය හැකි වනු ඇත. එම නිසා ආත්මයට වේදනාවක් හැඟේ. නමුත් එම වේදනාව ඉතා සුමිහිරි, රසවත්, තෘප්තිමත් වේදනාවකි. එයින් පලා යෑමට ආත්මයට උවමනා වුවත්, එයින් පලා යා නොහැකිය. නමුත් එයින් පලා යෑමටද ආත්මය ආශා කරන්නේ නැත. වේදනාකාරී තත්ත්වයක් නොමැති නිහඬ යාච්ඤාවට වඩා මෙම අත්දැකීම තෘප්තිමත්ය, රසවත්ය.

අහෝ සර්වබලධාරී දෙවියනි! ඔබවහන්සේගේ අභිරහස් කොතරම් ගැඹුරු ද, බරවතල ද, ලෝකය තුළ ඇසිය හැකි සහ දැකිය හැකි සියලුම දේවලට වඩා අධ්‍යාත්මික යථාර්ථයන් කොතරම් වෙනස් ද, මෙම වරප්‍රසාද වටල සමාන කළ හැකි කිසිදු දෙයක් මෙලොව තුළ නැත. ඒ නිසා එවැනි තව තවත් දේවල් ඉල්ලා සිටීමට ඉතා තදබල ආශාවක් ආත්මය තුළ ඇති වේ. නමුත් ඉල්ලිය යුත්තේ කුමක්ද යන්න ගැන ආත්මය හරි හැටි නොදනී. නමුත් එක දෙයක් එයට ඉතා පැහැදිලිව අවබෝධවේ, එනම් ආත්මයේ අයිතිකරුවන දෙවියන් වහන්සේ ඒ තුළ වාසය කරන බවයි.

ඉදිරි කලාපයට... »



මහාචාර්ය ඇන්ටන් මීමන

## 09 දර්ශනය යනු කුමක්ද ?



## ප්‍රඥාව, සත්‍යය සහ බුද්ධිමය නිහතමානීත්වය

සත්‍යය ගවේෂණය සඳහා විවිධ පුද්ගලයන් දරන පෞද්ගලික මතයන් නොව, මානව අත්දැකීම් වල ගැඹුරුතම හරය කුමක්ද යන්න සෙවීම කේන්ද්‍රිය කාර්යභාරයකි. ඒ සඳහා ඕනෑම මතයක්, මතවාදයක්, උපකල්පනයක්, සිද්ධාන්තයක් හෝ න්‍යායක් ප්‍රශ්න කිරීමට ඇති අවකාශය පළමු වන කොන්දේසියයි. දෙවියන් වහන්සේ කෙරෙහි මානවයාගේ ගැඹුරුතම අභ්‍යන්තරයට ආවේනික වූ මූලය, උල්පත නම්. කරුණු කාරණා දැන ගැනීම සඳහා ඔහු හෝ ඇය තුළ පවතින උපේක්ෂා සහගත, සීමා විරහිත, අපක්ෂපාති, පහසුවෙන් සන්සිඳුවා ගත නොහැකි පිපාසයයි, ආශාවයි, අකාර්ශණයයි.

අපව මවා ඇත්තේ ප්‍රඥාවේ උලප්ත වන දෙවියන් වහන්සේව සෙවීම සඳහායි. දෙවියන් වහන්සේව සෙවීම හැඟීම්බර කාර්යභාරයක් පමණක් නොව බුද්ධිමය, දාර්ශනිකමය චාරිකාවක් ද වේ. දෙවියන් වහන්සේ පිළිබඳ අත්දැකීමක් සෑම සත්‍ය ගවේෂණයක් තුළම අනිවාර්යයෙන්ම අඩංගු වේ. සමහර දාර්ශනිකයන් ඒ ගැන අවධානය යොමු කොට නොමැති බව හෝ අවදියෙන් නොසිටින බව ඇත්තකි. නමුත් එවැන්නක් නොමැති බව එයින් කිසිසේත්ම ගම්‍ය නොවේ.

ශාන්ත අගුස්තීනු තුමා පවසන ආකාරයට; “Quia fecisti nos ad te, et inquietum est corostrum, donec requiescat in te” (දෙවියනි, ඔබ අප මවා ඇත්තේ ඔබ සඳහා ය. ඔබ තුළ සැතපෙන තෙක් අප හදට සැබෑ සුවයක් හෝ සැනසීමක් නොවන්නේමය).

මනුෂ්‍ය අපගේ අභ්‍යන්තරය සකස් කර ඇත්තේ, නිර්මාණය කර ඇත්තේ කොන්දේසි විරහිත, සීමා විරහිත කුතුහලය සඳහායි. ඒ අනුව අප අභ්‍යන්තරය සැබැවින්ම සෑහීමකට පත් කළ හැක්කේ, අචින්ත, අපරිමිත, අනන්ත, අමරණීය, අසීමිත යථාර්ථයකට පමණි. ලෝකය පිළිබඳ බුද්ධිගෝචර භාවයට (Intelligibility) සීමාවක් නොමැත. ජීවත් වීමට ඇති ගැඹුරු රුචිය, ආශාව අපට ලැබෙන්නේ එම හේතුව නිසාවෙන්ය. මිනිස් හදවතේ ප්‍රමාණය එහි නිර්මාණකරුගේ ප්‍රමාණයයි. හදවතේ ගැඹුරුතම අභිප්‍රායයන් පිරවිය හැක්කේ, තෘප්තිමත් කළ හැක්කේ එහි නිර්මාණකරුගේ සුවිශාලත්වයට පමණි, අපරිමිතභාවයට පමණි, අමරණීයත්වයට පමණි.

අපව මවා ඇත්තේ මැනිය නොහැකි තරම් සුවිශාල, අතිවිශාල, යෝධ, දැවැන්ත, අප්‍රමාණ සහ හදවතටම ආවේණික වු කුතුහලාත්මක චමත්කාරයක් සමඟයි. අප ලෝකය ගැන දැන ගන්නා ප්‍රමාණය අධික වන තරමට, තව තවත් දැන ගැනීමට ස්වභාවයෙන්ම ආකර්ෂණයක්, නැඹුරුවක් පවතින්නේ ඒ නිසයි. කොන්දේසි විරහිත, සීමාවිරහිත චමත්කාරයට වඩා අඩු කිසිවකින් අප ආත්මය තෘප්තියට පත් නොවේ. සෑහීමකට පත් නොවේ, සැනසීමට පත් නොවේ.

අප අසන සෑම ප්‍රශ්නයක්ම තවත් ප්‍රශ්නයකට සම්බන්ධ වී ඇත. කිසිඳු ප්‍රශ්නයක් අපට හුදකලාව තේරුම් ගත නොහැකිය. එක ප්‍රශ්නයක් අනෙකුත් ප්‍රශ්න වලින් තනි කොට, හුදකලා කොට විශ්ලේෂණය කළ නොහැකිය. සමස්ත මානව දැනුම අවසාන විග්‍රහයේ දී එක යථාර්ථයකි. අප අධ්‍යයනය කිරීමේ පහසුව තකා මිනිස් දැනුම විවිධ විෂයයන් වලට බෙදා වෙන් කර අධ්‍යයන කළත්, සමස්ත මානව දැනුමේ ඒකාග්‍රතාවයක් පවතී.

අප විසින් හදාරනු ලබන විෂය කුමක් වූවත්, මිනිස් බුද්ධියේ මූලික මෙහෙයවීම් (Basic Cognitive Operations) එක සමානය. අප උසස් ගණිතය හදාරන විටත්, භූගෝලය හදාරන විටත්, සංගීතය හදාරන විටත්, පාපන්දු ක්‍රීඩා කරන විටත්, වෛද්‍ය විද්‍යාව හදාරන විටත්, දාර්ශනීකරණය තුළත්, භාෂාවන් හදාරන විටත්, ගෘහ නිර්මාණ ශිල්පය හදාරන විටත්, භාරත නැටුම් කලාව හදාරන විටත්, මිනිස් මනස ක්‍රියාකරන්නේ සමාන ආකාරයටය. එම මූලික බුද්ධිමය මෙහෙයවීම් පොදුවේ මෙසේ සඳහන් කළ හැකිය.

එනම් දැකීම, ඇසීම, ගඳ සුවඳ බැලීම (ආඝ්‍රාණය), ස්පර්ශ කිරීම, රස බැලීම, සෝදිසි කිරීම, අනුමාන කිරීම (පරිකල්පනය), අවබෝධ කර ගැනීම, සිතා ගැනීම, නිරවුල්ව ප්‍රකාශ කිරීම (සූත්‍ර ගත කිරීම), ආවර්ජනය කිරීම, කරුණු සංවිධානය කර ඉදිරිපත් කිරීම, අදාළ කරුණු සසඳා බැලීම, විනිශ්චය කිරීම, පරෙස්සමෙන් යමක් සලකා බැලීම, අගැයීම, තීරණය කිරීම, විමසා බැලීම. පැවසීම සහ ලිඛිතව ප්‍රකාශ කිරීම (ලිවීම) යනාදියයි.

මෙම මූලික මානසික ක්‍රිකාකරකම් වලට සම්බන්ධ අරමුණු, අභිප්‍රායයන්, හරයන් සහ තේමා විෂය අර්ථයන් පවතී. අරමුණකින්, පරමාර්ථයකින් තොර බුද්ධිමය මෙහෙයුමක් නොපවතී. බුද්ධියේ ක්‍රියාකාරකම්, බුද්ධියේ ක්‍රියාකාරම් උදෙසා නොවේ. මිනිස් බුද්ධිය විසින් ලෝකය ගැන බුද්ධිමත් ප්‍රශ්න අසනු ලබයි. එමෙන්ම ඒවාට බුද්ධිමත් උත්තර සහ විසඳුම් ද සොයනු ලබයි. අප දෙන උත්තර වලට වඩා අතිශයින් වැදගත් වන්නේ අප අසන ප්‍රශ්නයි. අප විසින් අසනු ලබන ප්‍රශ්න වලට සීමාවක් නොමැත. මිනිසා යනු ප්‍රශ්න අසන සත්වයෙකි. අධිකතම කුතුහලය සහිත ජීවියාද මිනිසායි. මිනිස් හදවතට එවැනි අපරිමිත කුතුහලයක් ලැබී ඇත්තේ කෙලෙස ද? කොහෙන් ද? කාගෙන් ද? මෙවැනි ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමට සමස්ත ජීවිත කාලයක්ම ගත විය හැකිය.

ඉදිරි කලාපයට... »

### දේව වචනය ... 1 පිටුවෙන්

දේව වචනයේ වසරේ දී අගරදගුරු වසමේ සැදැහැවතුන් හදවතින් හා මනසින් දේව වචනය තුළ වැඩි වර්ධනය වී, දේව වචනයට ඉතා ගැඹුරින් සංවේදීව, දේව වචනය කියවීමටත්, ඒ ඔස්සේ යාච්ඤා කර ආධ්‍යාත්මික ප්‍රබෝධයකින් සිය ආත්ම හා ශරීර පෝෂණය කර ගැනීමත් ඉලක්ක කැරේ.

### ජාතික ධර්මෝපදේශ... 1 පිටුවෙන්

ඉන්පසුව තල්විල මීසම් සේවක ලෙස 1998 සිට 2003 දක්වා කටයුතු කරන අතර පදවියේ කතෝලික අධ්‍යාපන කටයුතු ද බාරගෙන කටයුතු කළේය. 2003 සිට 2007 දක්වා කන්ජුක්කුලිය මීසම් සේවක වූ එතුමා 2007 සිට සග සුව දිනන තෙක් ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ තනතුරේ කටයුතු කළේ ය. එතුමාගේ දේහය මාරවිල කතෝලික දෙව්මැඳුරේ තබා තිබූ අතර බ්‍රහස්පතින්දා ප.ව. 4.00 ට මාරවිල සිරි කුරුස සිද්ධස්ථාන සුසාන භූමියේ මිහිදන් කැරිණ. එතුමන්ගේ ආත්මයට සග සුව පතා යදින්නැයි ප්‍රදීපය ඉල්ලා සිටී.

### ඕනෑම දෙයක්... 1 පිටුවෙන්

එහි දී තේමා දෙසුම පැවැත්වූ දේව ධර්ම නිකේතනයේ අධ්‍යක්ෂ ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා "භාෂාවෙන් අපට උරුම කර දී ඇති තත්ත්වය තුළ ජනප්‍රිය හා සම්භාව්‍ය ග්‍රන්ථ බිහි වී ඇති බවත්, මේ දෙකොටසින්ම සිදුවන සේවය ඉමහත් යැයි පැවසීය.

කිතුනු ජනසංනිවේදන ජාතික අධ්‍යක්ෂ හා ලේඛක හවුලේ අනුශාසක ගරු බෙනඩික් ජෝසප් පියතුමාගේ මෙහෙයවීමෙන් එදින පෙරවරුවේ නිලවරණය පැවැත්විණ.

### ශ්‍රී ලංකාවේ දිනකට... 1 පිටුවෙන්

සැටියට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සහභාගි විය.

එහිදී "කතෝලික වෛද්‍යවරයකුගේ ප්‍රතිචාර" යන තේමාව ඔස්සේ කරුණු දැක් වූ ඒ මහතා "ශ්‍රී ලංකාවේ ගබ්සාවන් සඳහා යොමු වන කාන්තාවන් අතර වැඩි පිරිස විවාහක කාන්තාවන් බවත්, ඔවුන් දරුවන් සීමා කිරීමට යොදාගෙන ඇත්තේ ගබ්සාව බවත් පැවසීය. මෙහි දී කළුතර සිට හලාවත දක්වා මුහුදුබඩ කතෝලික තීරයේ ද ගබ්සාවන්හි අඩුවක් දක්නට නොලැබීම වෙසෙස් අවධානයට ගත යුතු කරුණක් බැව් ඒ මහතා අවධාරණය කළේය.

### කඳාන සා. සෙබස්තියන්... 1 පිටුවෙන්

ඒ සඳහා සියල්ලන්ගේම සහයෝගය හොඳින් ලැබුණත් කඳාන සා. සෙබස්තියන් පිරිමි ම.වි. එම වැඩපිළිවෙලට ඇතුළත් කිරීමට යම් පිරිසක් කටයුතු කරමින් සිටී. 1960 දී පාසල් රජයට පවරා ගන්නා අවස්ථාවේ දී දුර දිග නොබලා කටයුතු කළ මෙවැනි අයගේ ක්‍රියාවන් වල ආදීනව අද කතෝලික ජනතාව භුක්ති විඳිමින් සිටී.

මේ පිළිබඳව කඳාන දිසාවේ සියලුම පියතුමන්ලා තම ස්ථාවරය ප්‍රකාශ කර ඇති අතර 1960 දී කතෝලික පාසැල් ආරක්ෂා කර ගැනීමට කතෝලික ජනතාව පෙරමුණ ගත් අයුරින්ම මේ අවස්ථාවේ දී ක්‍රියාකාරී විය යුතුය.

### සෙත් සරණ ... 1 පිටුවෙන්

පෙර වසරවලදී මෙන් මේ වසරේ දී ද දිළිඳු ජීවිත නගා සිටුවීම සඳහා සෙත් සරණ ආයතනය විශේෂ ව්‍යාපෘතියක් දියත් කිරීමට බලාපොරොත්තු වන අතර අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ විශේෂ ඉල්ලීමක් පරිදි මෙවර දියත් කෙරෙන විශේෂ නත්තල් ව්‍යාපෘතිය දිළිඳු සහන ව්‍යාපෘතිය හා සමඟ එක්ව දියත් කිරීමට සෙත් සරණ ආයතනය සියලු කටයුතු සංවිධානය කර ඇත. ඒ අනුව අඩු ආදායම්ලාභී දිළිඳු පවුල් 1000 ක් වෙනුවෙන් වියළි සහනාධාර සහ පාසල් දූ දරුවන් 1000 ක් වෙනුවෙන් පාසල් ලිපිද්‍රව්‍ය කට්ටල බෙදා දීමට තීරණය කර ඇත. එහෙයින් මෙම විශේෂ නත්තල් ව්‍යාපෘතියට ඔබේ සහය ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

මේ විශේෂ නත්තල් ව්‍යාපෘතියේ දී මූල්‍යමය සහ ද්‍රව්‍යමය වශයෙන් ඔබට දායක විය හැකි අතර අඩු ආදායම් ලාභි පවුල්, පාසල් සිසුන්, නේවාසික රෝගීන් සහ බන්ධනාගාර රැඳවියන් මෙම විශේෂ ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා අප ආයතනය විසින් තෝරාගෙන ඇත.

ඔබ ද්‍රව්‍යමය වශයෙන් යම් ආධාරයක් ලබා දෙන්නේ නම් මීගමුව, තම්මිට, කාදිනල් කුරේ මධ්‍යස්ථානයේ පිහිටි සෙත් සරණ මීගමුව ශාඛාවට හෝ කොළඹ, ජෝශප් වාස් මධ්‍යස්ථානයේ පිහිටි සෙත් සරණ ප්‍රධාන කාර්යාලයට ගෙනැවිත් භාර දිය හැකි යැයි සෙත්සරණ අධ්‍යක්ෂ ගරු ජූඩ්රාජ් ප්‍රනාන්දු පියතුමා නිවේදනය කරයි.

### කිතුනු මරණය පිළිබඳ... 3 පිටුවෙන්

මරණින් පසුව අප සියල්ලෝම වෙනස්වන බවත් පවසයි (1 කොරින්ති 15:51-52).

ශුද්ධවූ පාවුලුතුමාගේ උක්ත ඉගැන්වීමට ගරුකරමින් ටර්ටුලියන් සභාපියතුමා ද (ක්‍රි. ව. 155-220) අවසාන දිනය දක්වා ජීවත්ව සිටින දමිටුවන් අවසානයේ දී මරණයට පත්නොවී මහිමයට පත්වන බව පවසයි (De Rseurrectione Carnis, 41). එමෙන්ම ශුද්ධවූ අම්බ්‍රෝස් මුනිතුමන්ට. ශුද්ධවූ අගුස්තීනු මුනිතුමන්ට සහ බොහෝ අන් සභා පියවරුන්ට අනුව මරණය යනු කෙටි නින්දකි. අවසාන දිනය දක්වා ජීවත්ව සිටින අය මිය යන අතර කෙටි නින්දකින් පසුව අන්තිම විනිශ්වය සඳහා ඔවුන් කැඳවනු ලැබේ. බොහෝ කිතුනු අනුගාමිකයන්ගේ ද විශ්වාසය වන්නේ ආදම්ගේ පාපයට උරුමකම් කියන සියල්ලෝම මිය යා යුතු බව හා ඒ අය අතරින් සුළු පිරිසක් අවසාන විනිශ්වය දක්වා ජීවත් වන බවත් ය.

ක්‍රිස්තුන්වහන්සේට අනුව අප මෙලොව ජීවත්වන කාලයේදී දෙවියන් වහන්සේ අපගෙන් බලාපොරොත්තුවන දේ කළ යුතුවේ. මන්ද, මරණින් පසුව යහපත් දේ කිරීමට කිසිවෙකුට නුපුළුවන් බවත් මරණින් පසුව ජීවියට රාත්‍රිය එළඹෙන බවත් ශුද්ධවූ ලියැවිල්ල තුළ ක්‍රිස්තුන් වහන්සේ පවසන සේක (ජුවාම් 9:3, මතෙව් 24:42, 25:3). අවසාන විනිශ්වය ගැන කාත කරන ශුද්දවූ පාවුලුතුමා සැම මනුෂ්‍යයෙකුවම තමා විසින් කර ඇති යහපත් හා අයහපත් ක්‍රියාවන් මත අවසානයේදී විනිශ්වය කරනු ලබන බව ද පවසයි (2 කොරින්ති 5:10).

ශුද්ධවූ ලියැවිල්ලේ සඳහන් උකත් ඉගැන්වීම් පාදක කොටගෙන මරණින් පසුව තම පාපයනට මනස්ථාපනය තුළින් සමාව ලබාගන්නට කිසිවෙකුට නොහැකි බව ශුද්ධවූ සිප්‍රියන් මුනිතුමා (ක්‍රි. ව. 200 - 258) පවසයි. ඒ අනුව කෙනෙකු ජීවත් වන ආකාරය අනුව මේ ලෝකයේ ජීවිතය තමනට වරප්‍රසාදයක් හෝ ශාපයක් නැතහොත් වාසනාවක් හෝ අවාසනාවක් විය හැකි ය (Ad Demetrianum, 25) ජීවිතයේ මෙම තත්ත්වය තවදුරටත් ගෙනහැ රපාන ශුද්ධවූ අගුස්තීනු මුනිතුමන් අප ලබන කුසල හෝ අකුසල තීරණය වන්නේ මෙලොව අප ගත කරන ජීවිත තත්ත්වය අනුව බවත් මෙලොව ජීවිත කාලයේදී නොකළ දේ මරණින් පසුව කරන්නට බලාපොරොත්තු නොවන ලෙසත් පවසයි (Enchiridion,110).

මෙලොව ජීවිත කාලය වනාහි යුගාන්තයේදි කිතුනුවන් අත්කර ගන්නට බලාපොරොත්තුවෙන් සිටින සදාකාලික ජීවිතය සඳහා දෙවියන්වහන්සේ විසින් දානය කොට ඇති සූදානම්වීමේ කාලයයි. එබැවින් කිතුනු මරණය දෙස බැලිය යුත්තේ බියකින් හෝ තැතිගැන්මකින් නොවන බව ශුද්ධවූ ලියැවිල්ල හා සභාපිය ඉගැන්වීම් පසක් කර දෙයි. ඒ බව තවදුරටත් තහවුරු කරන ශුද්ධවූ පාවුලුතුමා කිතුනු ජීවිතය මරණින් අවසන් නොවන බවත් සිදුවන්නේ එය නව මුහුණුවරක් ගැනීම පමණක් බවත් එහිදී කිතුනු ජීවිතය සදාකාලිකත්වය උරුමකර ගන්නා අතර එයින් මරණය ද පරාජයට පත්වන බවත් පවසයි. 'මෙන්න, මම ඔබට අභිරහසක් පවසමි. අපි සියල්ලෝ ම නොමැරෙන්නෙමු. එහෙත් අන්තිම හොරණෑව පිඹින කල..... අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමු....... දිරනසුලු මේ ස්වභාවය නොදිරනුසුලු බවටත්, මැරෙනසුලු මේ ස්වභාවය අමරණීයත්වයටත් පැමිණි කල්හි මරණය පැරදිණි. ජය අත්විණි' (1 කොරින්ති 15:51-54).

### ධාර්මික දිවි පෙවෙතක් ... 5 පිටුවෙන්

මන්ද ත්‍රිත්වීක ප්‍රේමයේ අභිරහස තුළ වචනයෙන් විස්තර කළ නොහැකි යාව ජීව වූත්, අවියෝජනීය වූත් බැඳීමකින් ද, අන්තර් යැපීමකින් ද දිනෙන් දිනම යාවත්කාලීන වන සදාකාලික වර්තමානයක් තුළ විරාජමාන වන එම ප්‍රේමයේ දෙවිඳුන් නිර්වචනය කළ හැක්කේ කවරකුට ද? එතුමෝ අප සැම මවනු ලැබුවේ එම ප්‍රේමයේම තවත් එක් දිගුවක් ලෙස නොවේ ද? එහිම අග්‍ර ඵලය ලෙස දේව සමානකම නොවේ ද? (උත්පත්ති 1:26-28). මෙලෙස අපි ප්‍රේමයෙන් නිෂ්පන්න වී ඒ කරාම ගමන් කරනු ලබන දේව දරුවන් වෙමු. මන් ද අපගේ උරුමය හා වගකීම ප්‍රේම කිරීමයි (මතෙව් 24:37-40). එය යුගාන්තය දක්වාම එසේම ය. මෙලෙස බලන කල ධර්මිෂ්ඨව ක්‍රියා කිරීමට මාර්ගය පෙන්වන දෙවිඳු ආදරයේ පණිවුඩය ඇත්තේ දේව වචනය තුළ නොවේ ද? එලෙසම දේව ආදරය සරලම වූත් විශ්මිත වූත් ලෙසින් ප්‍රකාශ වන සත්ප්‍රසාදීය සමිඳුන් තුළ නොවේ ද? අපේ කාලයේ සියලුම ධර්මිෂ්ඨයින් මේ මහා ප්‍රේමයේ මූලාශ්‍ර දෙකින් පෝෂණය වූවා නොඅනුමානය.

ධර්මිෂ්ඨබව ජනනය කරනු ලබන ජනන යන්ත්‍රය වූ කලී ප්‍රේමයයි. එහි බාහිර ප්‍රකාශ වීම සැබෑ ධර්මිෂ්ඨ බවයි. වචන, ක්‍රියා, සිතුවිලි ආදරණීය වන තරමට ඒ තුළ ගැඹුරු දේව මහිමයේ ප්‍රකාශ වීමක් සිදුවන අතර නියම ධර්මිෂ්ඨකම ද ඉන් උපදියි (1 පේදුරු 3:9-12). ඒ සඳහා අපට සමිඳුන් දී ඇති මේ අනගි මූලාශ්‍රයන් අපි භාවිතා කරන්නෙමු ද?...

මෙලෙස අප ගොඩනගන, ජීවත් කරවීමට උත්සාහ දරන ධාර්මික ජීවිතය අවසාන වශයෙන් දේව තිළිණයක් ම බව අපි වටහා ගත යුතුව ඇත.

ඒ සඳහා අපගේ මුළු පෞරුෂත්වය මෙන්ම පැවැත්මට ශුද්ධාත්ම දීමනා තුළින් ස්පර්ශ කරවන ලෙසත් අපි සමිඳුන් අයදිමු. ධර්මිෂ්ඨබව අපට ඇතින් තිබෙන, විශේෂයෙන්ම තෝරාගත්තවුන් පිරිසකට පිරිනමන ධර්ම ගුණයක් ලෙසින් අර්ථකථනය නොකර ඒ සඳහා අප සැම තුළම ප්‍රසාද ස්නාපනීය කැඳවීම මඟින් ඇතිකරනු ලැබ ඇති අයිතිවාසිකම නැවත සිහි කැඳවමින් ක්‍රියා කළ යුතුව ඇත්තෙමු. ධර්මිෂ්ඨ බවේ අභිමානය නැති කරලීමට උත්සාහ දරන මිත්‍යාවේ බලවේග වලට නිසි අවබෝධයෙන් පිලිතුරු සෙවීමටත් එයින් ලබන ආත්මික පරිණත බව තුළ ධාර්මික පෞරුෂයක් තනා ගැනීමටත් වරම් පතමු.

එය අපට සමිඳුන් තුළ කළ හැකි බව විශ්වාස කරමු (පිලිප්පි 4:13-14). ආලෝකයේ දරුවන් ලෙස සියලු අඳුරු බලවේග අභිබවා අප ලබන දේව දරුකමේ නිදහස අප සියලු දෙනාවම සැබෑ ධර්මිෂ්ඨ බව කරා කැඳවා ගෙන යනු ඇත.

### මළවුන්... 6 පිටුවෙන්

වෙනුවෙන් යැදීම වරදවා තේරුම් ගැනීමකි. එසේ සිතන්නේ නම් ඇති හැකි අයට වැඩි පූජා ගණනකට මුදල් ගෙවා ස්වර්ගාරෝපණයට පිවිසිය හැකිය. පූජාවට මුදල් දීම මෙන්ම එම පූජාවට භක්තියෙන් සහභාගි වීම ක්‍රිස්තියානි මරණය පිළිබඳව අපට උගන්වා ඇති යථාර්ථය ගැන මෙනෙහි කිරීම ද අත්‍යවශ්‍ය ය.

තම ජීවිතය තුළින් යහපත් සිතිවිලි ඇතිකරගෙන තමන් අතින් සිදුවී ඇති වැරදි සිහිකොට ඒවාට පසුතැවිලි වී මළවුන් වෙනුවෙන් දෙවිඳු යැදීමෙන් මළවුන්ට උපකාර කළ හැකිය.

නොවැම්බර් මාසය හඳුන්වන්නේ මළවුන් සිහිකරන මාසය ලෙසයි. මෙසේ ගෙවල දානමය පිංකම් කිරීම බොහෝ විට දක්නට ලැබේ. දානය දීම හා අසරණයින් සැළකීම හොඳ පුන්‍ය ක්‍රියාවකි. එ නමුත් විශාල මුදලක් වැය කොට අසරණයින් කීප දෙනෙකුට කෑම වේලක් දී වැඩි කොටසක් ගෙදර අය හා නෑදෑයින් අතර භුක්ති විඳ "අපි මෙවර දානය දුන්නා, අපේ යුතුකම් අපි ඉටුකළා කියා සෑහීමකට පත්විය නොහැකිය. ඒ කෙසේ වෙතත් නොවැම්බර් මස පමණක් නොව සැම කිතුනුවකුම නිතරම තම ජීවිතය පුරාම කිතුනු දිවියක් ගත කළ යුතුය. ජීවිතය තුළ නිතරම අපගේ ක්‍රියාවෙන් අපගේ කිතනු බව ඔප්පු කළ යුතුය.

## අවමංගල්‍ය ස්තූතිය



ශාන්තසිරි හෙට්ටිආරච්චි අප පියාණන්ගේ අවමංගල්‍ය උත්සවයට පැමිණි අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළු විශ්‍රාමික අගරදගුරු හිමිපාණන් දෙනමට, සියළු පදවි රදගුරු හිමිපාණන්ට, පැමිණි සියළුම පියතුමන්ට ගරු සහෝදර තුමන්ට, ගරු පැවිදි සොහොයුරියනට හා ගරුතර සංඝරත්නයටද, ශෝකය බෙදා ගැනීමට පැමිණි පාර්ලිමේන්තුවේ සියළුම පක්ෂ විපක්ෂ මැති ඇමතිවරුන්ට, පලාත් සභා හා පළාත් පාලන මංත්‍රීවරුන්ට, කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධිපති පියතුමන් ඇතුළු සියලු කාර්යය මණ්ඩලයට, ජා-ඇල, කෙරළවලපිටිය මීසම් ජනතාවට, පැමිණි සියලු සමිති සමාගම් සාමාජික සාමාජිකාවනට, පාසල් සිසුන් ඇතුළු හිතමිතුරන්ට අප පියාගේ සමකාලීන මිතුරන්ට, දුන්ගාල්පිටිය ජනතාවට හා මීසම භාර පියතුමාට, සියලු ඥාතීන්ට හා කිට්ටු වන්තයන්ට, ශෝක පණිවිඩ එවූ සියළු දෙනටද අප පවුලේ ස්තූතිය මෙයින් පිරිනැමෙන අතර පෞද්ගලිකව ස්තූතිය පුදකිරීමට නොහැකි වීම ගැන කණගාටුවද, මෙහිදී ප්‍රකාශ කරමු.

**මෙයට හෙට්ටිආරච්චි පවුලේ ශාන්තසාගර පියතුමා ඇතුළු සියලු දූ දරුවන්.**

### ආධ්‍යාත්මික... 12 පිටුවෙන්

කියල මට එකපාරටම කියවුණා. එතන හිටිය කටකාර ගැහැණු දරුවකු මට කියාපු දේ නම් මට කොහොමවත් දරා ගන්නට පුළුවන් වුනේ නැහැ. මම ඒක ඔබවහන්සේට කියන්නෙ වෙන කියන්න කෙනෙක් නැති හින්දයි. ඒ ළමය "මේ ඕල්ඩ් මෑන්, තමුසෙගෙ වනචරකම හින්දනෙ අපි දිහා එහෙම බලන්නෙ. තමුසෙ අහක බලාගෙන ඉන්නවකො. එතකොට ඉවරයිනෙ" කියල කිව්වෙ මගෙ වයසවත්, ඉන්නෙ කොහෙද කියලවත් කිසිම ගාණක් නැතිවයි. මටත් ඒ වයසෙම මිණිබිරියක් ඉන්නව. මගේ ඇස් දෙකට උනපු කඳුළු කාටවත් නොපෙනෙන්න මම පිහල දා ගත්ත. එතන හිටිය එකම වැඩිහිටියෙක්වත් ඒ ළමයටවත්, මටවත් වචනයක් කතා කළේ නැහැ. ඔව් සුවාමි මම වයසක මිනිහෙක්, මම නාකියෙක්, මම පව්කාරයෙක්, මම දුර්පරීක්ෂාවට වැටෙන මිනිහෙක්, මම විතරක් නෙවෙයි අපි හැමෝම පව්කාරයො. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් අපගේ පාප වලට සමාව දීම ගැන උන්වහන්සේට තුති පුදන්නයි මම ඒ දිව්‍ය පූජාවට සහභාගි වූයේ. "ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදිව සිට යාච්ඤා කරන්න. හිත නම් කැමැතිය, ගත නම් දුබලය" (මතෙව් 26:41). ක්‍රිස්තුන් වහන්සේ අපට කියන්නේ අපගේ දුර්වලකම් උන්වහන්සේ හොඳින් දන්නා නිසාය.

අද දිව්‍ය පූජාවත්, අපගේ දේවස්ථානත්, මේ විළි ලැජ්ජ නැති සංස්කෘතියට යටපත් වෙලා දැයි මට තේරෙන්නෙ නැහැ. ලෝකයේ තෘෂ්ණාවන් ජයගන්නට දේව වරප්‍රසාදය පතා දේවස්ථානවලට යන අපිට පරීක්ෂාවලින් මිදී සැනසීමේ දෙවියන් සමඟ සංවාදයේ යෙදෙන්නට අයිතිවාසිකමක් නැද්ද? දකින දකින පැත්තෙන් නිරුවත ප්‍රදර්ශනය කරමින් අපව යක්ෂයාගේ මායම් වලින් රවටා ගන්නට දරණ උත්සාහය ඉදිරියේ දෙවියන් වැඩ වසන දේව මන්දිරයත් යක්ෂයාගේ අණසකට යටත් වෙලා ද? ජරාවට යන සංස්කෘතිය බෞතිස්ම කර පරිශුද්ධත්වය යොමු කළ යුත්තේ ශුද්ධවූ සභාවයි. එම සභාවේ නායකත්වය දරණ ඔබවහන්සේලා මේ හැම දේකදීම නිහඬව ඉන්නේ, දේශපාලකයින් වගේ ඔබතුමන්ලාගේ ජනප්‍රියත්වය හා මනාපය රැකගන්ඩද? දෙදණින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත යුතු යැයි කියන්නා සේම විනීතව නොහැසිරෙන, නිරුවත ප්‍රදර්ශනය කරන අයට උන්වහන්සේ ලබාගත නොහැකි යැයි කියන්නට, අනිත් මිනිසුන්ව පරීක්ෂාවට යොමු නොකරන්නට යයි කියන්නට ඔබවහන්සේලාගේ කොන්ද කෙලින් තබාගත යුතුය. ඔබවහන්සේලා ඉසින ආසිරි පැන් ගතට සිසිලක් නොව අයහපත පුළුස්සා දමන අම්ලයක් විය යුතුයි. යුගයේ ප්‍රාණ පරිත්‍යාගී කැඳවීම මෙයයි. ප්‍රාණපරිත්‍යාගිවරයා යනු හුදෙක් විශ්වාසය උදෙසා ජීවිතය පරිත්‍යාගි කරන්නාම නොව, කුරුසිය දරා උන්වහන්සේ උදෙසා සාක්ෂි දරන්නාය. සාක්ෂි දැරීමේ එක් අංගයකි විනීතකම. විනීතකමේ වැදගත් අංගයකි තමන් අඳින ඇඳුම් පැළඳුම්.

පියතුමෙනි, සමාවන්න මම තරමක් උද්වේගකාරී වූවා නම්, තවත් කියන්නට හුඟාක් දේවල් තියෙනවා. මෙච්චර වෙලා නිහඬව, සාවධානව මේ නාකි මිනිහා කියන පිස්සු විකාර කතා වලට සවන් දුන් ඔබවහන්සේට බොහොම ස්තූතියි.

හිතවත් පාඨකය, මේ මහළු මිනිසා පිස්සෙක් ද?, අන්තවාදියෙක් ද?, සාම්ප්‍රදායවාදියෙක් ද? ඔබම තීරණය කරන්න.




### ස්තූති කිරීම්

මගේ ඉල්ලීමට සහනයක් ලබා දුන් ජේසු තුමන්ටත් වික්ෂෝප මාතාවන්ටත්, සියලු ශුද්ධවන්තයන්ටත්, ස්තූති ප්‍රශංසා බල මහිමය අත්වේවා ! සැමදා දෙවිඳු පිහිට බලාපොරොත්තුවන මවක් කොළඹ. (N1427)

### කාපටිගෝහී ජුසේ මුනිඳුන්ට යාච්ඤාව

*(විභාගයක ජය ලබා ගැනීම සඳහා)*

අහෝ ශුද්ධවන්ත කාපටිගෝහී ජුසේ මුනිඳුනි විභාගවලදී ඔබ දන්නාවූ ප්‍රශ්නම ලැබීමේ විශේෂ වරප්‍රසාද ජේසුගෙන් ලබාගත් සේක්වේ ද මෙම මාගේ විභාගයේදීත් ඔබගේ වරප්‍රසාදය මත ජයග්‍රහණය අත්කර දුන මැනව. ඔබගේ නම ප්‍රසිද්ධ කර ඔබට ස්තූති වන්ත වීමට පොරොන්දු වෙමි. කාපටිගෝහී ජුසේ මුනිඳුනි මා නිසා යාච්ඤා කළ මැනව.

පරමණ්ඩල, නමෝ මරිය 1 බැගින් පිතා පුත්‍රයා කියන්න.

**එම්.එල්.එන්.ආර්. ප්‍රනාන්දු**
**(මෙයින් පිහිට ලැබූ)** (N1343)